ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2023 මැයි 31 වන බදාදා
3 කාණ්ඩය 26 කලාපය
මිල රු. 80 යි





විශේෂ
අතිරේකයක්
නොමිලේ

සුර
දූතිකාවකගේ
අණින්
දෙදෙනෙකුට
මිනී වළ කැපූ
දේවගැතිවරයා

දැන්
හිනා වෙවී
බබා
හම්බෙන්න
පුළුවන්
විදියක් ගැන
තෙල්දෙණිය
රෝහලේ
වෛද්‍යවරයෙකු
කියයි

වෙඩින් එකට
මාස තුනක්
තියෙද්දී
එයාගේ පපුවට
වෙඩි වැදුනා
තරංග
පරණවිතාන ගේ
බිරිඳ කියයි

නෙතාෂා
මැරුණේ
ඩයට්
කරලද?
නැද්ද?

හැමෝටම
වඩා තමන්ට
ආදරේ
කරන්නේ
කොහොමද?

දිල්කි ශෂිකලා
සිල්වා

ඡායාරූප
සමන් අබේසිරිවර්ධන
හැඩගැන්වීම
හිරු බ්‍රයිඩ්ල්-බණ්ඩාරගම

මතීෂ පතිරණ අපේ රටේ ලාබාල ක්‍රිකට් ක්‍රීඩකයෙක්. 2021 මතීෂ පාසල් තරගෙකදී එක පිට එක කඩුලු බිඳහෙලන වීඩියෝ එකක් වයිරල් වුණා. මේ වීඩියෝ එක ලංකාවේ ක්‍රීඩකයන්ගේ වගේම ඉන්දියානු ක්‍රීඩකයන්ගෙත් අවධානෙට ලක්වුණා. ප්‍රකට ඉන්දීය ක්‍රීඩක එම්.එස්. දෝණි මතීෂගේ වීඩියෝ එක දැකලා විශ්මයට පත්වුණාලු. ඔහු මතීෂව 2021 IPL තරඟාවලියට සම්බන්ධ කරගන්නත් උත්සාහ කරලා තියෙනවා. ඒ උත්සාහය අසාර්ථක වුණාත් මේ අවුරුද්දේ මතීෂ දෝණිගේ නායකයත්වය යටතේ චෙන්නායි සුපර් කිංග්ස් ටීම් එකෙන් ඉන්දීය ප්‍රිමියර් ලීග් (IPL) තරඟාවලියට ක්‍රීඩා කරනවා.

ක්‍රීඩා හැකියාවන් පෙන්නුම් කරන වීඩියෝ වයිරල් වෙලා ජාතික/ජාත්‍යන්තර ක්‍රීඩාපිටිවලට පිවිසෙන්න අවස්ථාව උදාකරගත්තු, ක්‍රීඩා ජ්‍යේෂ්ඨයන්ගේ ඇගයීමට ලක්වුණු දරුවෝ ලෝකය පුරාම ඉන්නවා. කෑගල්ලේ, ලෝල්ගොඩ පදිංචි සසේනි රෂ්මිකා රාජපක්ෂගේ කතාවත් එහෙම එකක්.

තරුණ ගෑනු ළමයෙක් දක්ෂ විදියට පන්දුවට පහරදෙන, පන්දු යවන වීඩියෝ එකක් පහුගිය දවස් ටිකේ ෆේස්බුක් එකේ හතරවටේම හුවමාරු වුණා. සමහරු මේ වීඩියෝ එක කැප්ශන් කරලා තිබුණේ 'මෙයා නම් ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ඉන්නම ඕන කෙල්ලෙක්' කියලයි. 'මේ ඊගාව චමරි අතපත්තු වෙන්නත් පුළුවන්' ඔය අස්සේ සමහරු කමෙන්ට් දාලා තිබුණා. අර කලින් කිව්ව මතීෂගේ වීඩියෝ එක වගේම සසේනිගේ වීඩියෝ එකත් ජාතික ටීම් එකේ වගේම ලංකාවේ ක්‍රිකට් ජ්‍යේෂ්ඨයන්ගේ ඇහැගැටිලා. සසේනිගේ ජීවිතේ කනපිට හරවපු ඒ වීඩියෝ එක ගැන අහන්න අපි ඇයට කතා කළා.



# නොනගතේ වෙලාවේ ක්‍රිකට් ගහනවා දැකලා චමරි අතපත්තු මට කතා කළා

## සසේනි රෂ්මිකා රාජපක්ෂ



**"මෙදා පාර නොනගතේ තිබුණේ 8.35ට. නොනගතේ නිසා ගේ ඇතුළට වෙලා ඉන්න කියලා අම්මා මට කිව්වා. මට අයියා කෙනෙක් ඉන්නවා. වැඩක් නැති වෙලාවට අපේ වැඩේම ක්‍රිකට් ගහන එක. ඉතින් නොනගතේ වෙලාවෙත් අපි ක්‍රිකට් ගහන්න පටන්ගත්තා. ක්‍රිකට් ගහන එක වීඩියෝ කරලා ෆේස්බුක් දාන්න ඕනේ කියලා එවෙලේ නිකමට වගේ හිතුණා. ගෙදර තිබුණු පරණ බාල්දියක් අරන් ඒක මිදුලේ අයිනක තියලා ඒකට ෆෝන් එක හේත්තු කරලා වීඩියෝ කළා."**



එහෙම නිකමට වගේ දාපු වීඩියෝව සමාජ මාධ්‍යවල වයිරල් වුණා. වීඩියෝව ෆේස්බුක් එකේ හතර අතේ හුවමාරු වෙද්දි කවුරුත් පුදුමවුණේ පිතිකාරිනියක් වගේම පන්දු යවන්නියක් විදියටත් ඇය දක්වපු දක්ෂතා නිසයි.

"මං ක්‍රිකට් පිස්සියක් කිව්වොත් හරි. ඒ තරමටම ක්‍රිකට්වලට ආසයි. පොඩි කාලේ ඉඳන්ම අයියත් එක්ක ක්‍රිකට් ගහනවා. අයියා එයාගේ යාළුවොත් එක්ක හවසට ක්‍රිකට් ගහන්න යද්දි මාත් එයාගේ පස්සෙන් ක්‍රිකට් ගහන්න යනවා. ළඟ ඉඳන් බැට් කරන හැටි බෝල් කරන හැටි කියලා දෙන්නේ අයියා."

සසේනිට දැන් අවුරුදු 20යි. ඇගේ මුල්ම පාසල දැදිගම පැරකුම්බා මහා විද්‍යාලය. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල එක්ක උසස්පෙළට තෝලංගමුව ඩඩ්ලි සේනානායක මධ්‍ය විද්‍යාලයට ගියාලු.

**"දැදිගම පැරකුම්බා මහා විද්‍යාලයේ ඉන්නකොට සැහැල්ලු පන්දු ක්‍රිකට් ගැහුවා. පැතුම් මිහිරංග සර් තමයි මුල්ම පුහුණුකරු. ලෙදර් බෝලෙන් ක්‍රිකට් ගහන්න පටන්ගත්තේ තෝලංගමුව ඉස්කෝලෙට ගියාට පස්සේ. පාසල් තරඟවලදිත් දක්ෂතා පෙන්වලා තියෙනවා. හැබැයි උසස්පෙළ ලියලා ඉස්කෝල ගමන නතරකළාට පස්සේ ක්‍රිකට් ක්‍රීඩාවත් නිකන්ම අත්හැරිලා ගියා."**

2023 උසස් පෙළ ලියලා ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉන්න අතරේ තමයි මේ සිදුවීම වෙලා තියෙන්නේ.

"වීඩියෝ එක දැකලා ජාතික කණ්ඩායමේ චමරි අතපත්තු අක්කා 'ක්‍රිකට් ගහන්න කැමතිද?' කියලා කමෙන්ට් එකක් දාලා තිබුණා. පස්සේ මං එයාට මැසේජ් කළා. එයා මේ දවස්වල පිටරට ඉන්නේ. ලංකාවට ආපු ගමන්ම කෝල් එකක් දෙන්නම් කිව්වා. ඊටපස්සේ හිටපු ක්‍රිකට් ක්‍රීඩක ධම්මික ප්‍රසාද් සර් කතා කළා. ජීවන්ත කුලතුංග සර්රුත් කතා කළා. හෂාන් තිලකරත්න සර්ගේ වයිෆ් අප්සාරි තිලකරත්න මිස් කතා කරලා ක්‍රිකට් උපකරණ තෑගි කළා. ඒ වගේම ක්‍රිකට්වලට සම්බන්ධ ක්‍රීඩකයෝ ඇතුළු ගොඩාක් අය කතාකරලා ක්‍රිකට් ක්‍රීඩාවෙන් ඉස්සරහට යන්න උදව් කරන්නම් කිව්වා."

ගොඩාක් අයගේ හිතේ ෆේස්බුක් ගැන තියෙන්නේ එච්චර හොඳ ආකල්පයක් නෙවෙයි. හැබැයි සසේනි නම් කියන්නේ ක්‍රිකට්වලින් ඉස්සරහට යන්න හීන දැකපු ඇයට ඒ හීනෙට පාර කැපුවේ ෆේස්බුක් එක කියලයි.

"ලංකාව වෙනුවෙන් දෙයක් කරන්න පුංචි කාලේ ඉඳලා ආසාව තිබුණා. හමුදාවට යන්න ආසාවකුත් තිබුණා. මං ඇතුළේ ඉන්නේ ක්‍රිකට් ක්‍රීඩිකාවක් කියලා පස්සේ හිතුණා. ඉස්කෝල ජීවිතේට සමුදීමත් එක්ක ක්‍රිකට් අතහැරුණා. හැබයි හිතේ ආසාව නැතිවුණේ නැහැ. අම්බෙන් හරි මේ වගේ අවස්ථාවක් ලැබෙන්න ඇත්තේ ඒ ආසාව නිසාම වෙන්න ඇති."

හිතේ දැඩි ආසාවක්, බලාපොරොත්තුවක් තියෙනවා නම් අහම්බෙන් හරි ඒ හීන හැබෑ වෙනවා කියනවා වගේ සසේනිගේ හීනෙටත් අද අහම්බෙන් වගේ පාර කැපිලා.

"ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන එක මගේ හීනයක්. චමරි අතපත්තු අක්කට ගොඩක් කැමතියි. එයා ක්‍රිකට්වලින් අයින්වෙන්න කලින් එයත් එක්ක එක මැච් එකක් ගහන එකත් මගේ හීනයක්."

හිනාවෙන්ම එහෙම කියපු සසේනි මෙච්චර දවසක් තමන් එක්ක හිටපු හැමෝමව මතක් කරන්න අමතක කළේ නෑ.

**"අපේ ගෙදර ඉන්නේ අම්මයි, තාත්තයි, අයියයි, අක්කයි. අම්මයි තාත්තයි දෙන්නටම අසනීපයි. ඒ දෙන්නා ගැනත් බලන ගමන් රට වෙනුවෙන් කවදහරි දෙයක් කරන්න මට පුළුවන් වෙයි කියලා මම හිතනවා."**

ඇයගේ වීඩියෝව දැකලා පුංචි ලයික් එකකින් හරි ඇගේ ක්‍රිකට් ගමනට ආශිර්වාද කරපු අයටත් ඇය ස්තූති කළා. ඉතින් දවසක ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න ආශිර්වාද කරන ගමන් සසේනිට අවස්ථාවක් ලැබුණොත් මුණගැහෙන්න ආසම ක්‍රිකට් ක්‍රීඩකයා කවුද කියලත් අපි ඇහුවා.

"මගේ ක්‍රිකට් ලෝකයේ වීරයා සනත් ජයසූරිය. දැනට ක්‍රීඩා කරන අයගෙන් නම් කැමතිම ඇන්ජලෝ මැතිව්ස්ට. අවස්ථාවක් ලැබුණොත් මුණගැහෙන්න ආස ඒ දෙන්නගෙන් කෙනෙක්ව තමයි."

■ රුවන් එස්.සෙනවිරත්න







# දැන් හිනා වෙවී බබා හම්බෙන්න පුළුවන්

නිමාලි රොශාන් එක්ක විවාහවෙලා අවුරුදු හතරක්. බැඳපු අලුත දෙන්නා කිරියි පැණියි ගාණට හිටියත් පහුගිය ටිකේ රොශාන් නිමාලිත් එක්ක හිටියේ එච්චර හිත හොඳින් නෙවෙයි. රොශාන් විතරක් නෙවෙයි රොශාන්ගේ අම්මත් ඇය දැක්ක තැන තරහකාරයෙක් දිහා බලනවා වගේ රවලා බැලුවා. ඉවසලා ඉවසලා බැරිම තැන නිමාලි ඇගේ මහගෙදරට ගියා.

**"රොශාන් දැන් අපට දරුවෙක් හදන්න කාලේ හරි කියලා දවස ගානෙම කියනවා. එයාගේ අම්මා කියන්නෙත් ඒ ටිකමයි. දරුවෙක් හදන්න මාත් ආසයි. ඒත් ඒ වේදනාවට මූණදෙන්න බැරිවෙයි කියලා මට බයයි අම්මේ."**

නිමාලි ප්‍රශ්නෙ ගැන අම්මත් එක්ක කිව්වේ අඬ අඬා. නිමාලි විතරක් නෙවෙයි මේ ප්‍රශ්නෙට මුහුණපාලා ඉන්න ඕන තරම් කාන්තා උදවිය අපේ රටේ ඉන්නවා. ප්‍රසූති වේදනාවට තියෙන අසීමිත බය නිසා ගොඩක් කාන්තාවන් දරුවන් හදන්න මැලිකමක් දක්වනවා. දරුවෙක්ට ආස වුණත් ප්‍රසූති වේදනාවට තියෙන බය හින්දා දරුවෝ හදන්න මැලිවෙන කාන්තාන්ට සතුටු හිතෙන ආරංචියක් මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහල පැත්තෙන් ඇහුනා. ඒ රෝහලේදී කිසිම ප්‍රසූති වේදනාවක් නැතිව දරුවෙක් බිහිකරන්න පුළුවන්ලු. ඒ කතාවේ ඇත්ත නැත්ත මොකක්ද බලන්න රෝහලේ නිර්වින්දන විශේෂඥ වෛද්‍ය රෝෂණ මල්ලවාරච්චි මහතාට අපි කතා කළා.

**"වෛද්‍ය තාක්ෂණයේ දියුණුවත් එක්ක කිසිම ප්‍රසූති වේදනාවක් නැතිව දරුවෙක් බිහිකරන්න පුළුවන් සාර්ථක ක්‍රම ලෝකයේ දියුණු රටවල අනුගමනය කරනවා. ඒ අතරින් හොඳම සහ සාර්ථකම ක්‍රමය තමයි 'Epidural System' (Gold Standard) ක්‍රමය කියන්නේ. මේක ලංකාවට අලුත්. හැබැයි දැන් තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහලේ ඒ විදියට දරු ප්‍රසූතීන් සිදුකරනවා. වේදනාවෙන් තොර දරු ප්‍රසූතියක් සිදුකරන්න බලාගෙන ඉන්න ඕන අම්මා කෙනෙකුට අපේ රෝහලට ඇවිත් ඒක කරගන්න පුළුවන්."**

ප්‍රසූති වේදනාව අම්මගෙන් අම්මකුට වෙනස්. ඒකට ඒ අයගේ මානසික තත්ත්වයන්, කලින් දරුවන් බිහිකරද්දී ලබපු අත්දැකීම්, වෙනත් අයගෙන් අහලා තියෙන දේවල්, අහේතුක බිය වගේම නොදැනුවත්කම වගේ දේවල් බලපානවා. අන්න ඒ වගේ අම්මලාට Epidural කියන්නේ දරුවෙක් ප්‍රසූත කරන්න තියෙන හොඳම ක්‍රමය කියලයි වෛද්‍යවරයා අපට කිව්වේ.

"Epidural ක්‍රමය සිදුකරන්නේ එන්නතක් මගින්. මුලින් දරුවා ලැබෙන්න ඉන්න අම්මගේ පිටකොන්දේ පහළ කොටසේ කුඩා ප්‍රදේශයක් හිරිවට්ටලා ඉතා සිහින් ප්ලාස්ටික් නලයක් අපිවරාශිකා කියන අවකාශයට යවලා ඒ හරහා එක්තරා ඖෂධයක් ශරීරයට යවනවා. ඒ ඖෂධ ක්‍රියාකාරීවෙන්න මිනිත්තු 15 - 20ක් විතර කාලයක් ගතවෙනවා. ඉතින් පස්සේ දරු ප්‍රසූතියේදී අම්මට වේදනාවක් දැනෙන්නේ නෑ."

Epidural ක්‍රමයට දරුවෙක් ප්‍රසූත කිරීමේ වාසි ගොඩක් තියෙනවා. මූලික වාසිය ප්‍රසූත වේදනාව අඩුවීම හෝ නැත්තටම නැතිවීම.



වෛද්‍ය
හසිත ගුණසිංහ



වෛද්‍ය
රෝෂණ මල්ලවාරච්චි

කොටින්ම ප්‍රසූත වේදනාවේ ආරම්භයේ ඉඳන් දරුවා බිහිකිරීමෙන් පස්සේ ඇතිවෙන වේදනාවත් මේ හරහා පාලනය වෙනවා. ඒ වගේම හදිස්සියේ හරි අදාළ අම්මට සිසේරියන් සැත්කමක් සිදුකරන්න වුණොත් මේ ක්‍රමයම ඒකටත් යොදාගන්න පුළුවන්.

"ලංකාවේ අම්මලාට මේක අලුත් අත්දැකීමක්. ඒ නිසා මේ ක්‍රමය භාවිතා කරන්න ගොඩාක් අය බයයි. එහෙම කිසිම විදියකින් බයවෙන්න එපා. සමහර අම්මලා බයයි ඇවිදින්න බැරිවෙයි, දරුවා ප්‍රසූත කරද්දි තටමන්න බැරිවෙයි, නිදිමත එයි එහෙම කියලා. ඒත් ඒ වගේ කිසිදෙයක් වෙන්නේ නෑ. ඒ වගේම අම්මට කිසිම අතුරු ආබාධයක් එන්නෙත් නෑ. අම්මලා දෙසීයකින් එක් අයෙකුට වගේ හරිම කලාතුරකින් හිසේ කැක්කුමක්, වමනය යාමක්, තාවකාලික මුත්‍රා කිරීමේ අපහසුතාවයක්, රුධිර පීඩනය අඩුවීමක් සිදුවෙන්න පුළුවන්. ඒත් වෛද්‍යවරුන් විසින් නිරතුරුවම අම්මව පරීක්ෂා කරලා අවශ්‍ය ප්‍රතිකාර කරන නිසා බයවෙන්න දෙයක් නෑ. අම්මට විතරක් නෙවෙයි දරුවට අතුරු ආබාධ එන්නෙත් නෑ."



**Epidural ක්‍රමයට දරුවෙක් ප්‍රසූත කිරීමේ වාසි ගොඩක් තියෙනවා. මූලික වාසිය ප්‍රසූත වේදනාව අඩුවීම හෝ නැත්තටම නැතිවීම.**

ඊළඟට අපි ඇහුවේ මේ ක්‍රමයට දරුවෙක් ප්‍රසූත කරන්න හැම අම්මෙකුටම පුළුවන්ද කියලා.

"මේක සිදුකරන්නේ විශේෂ පුහුණුවක් ලබපු නිර්වින්දන වෛද්‍යවරයෙක් විසින්ම විතරයි. Epidural ක්‍රමයට යනවද නැද්ද කියලා තීරණය කරන්නේ ඔහු. මොකද රුධිර කැටිගැසීමේ යම් රෝගයකින් පෙළෙන හෝ පිටකොන්දේ සහ මතුපිට සමේ යම්කිසි ආසාදන තත්ත්වයන් තියෙන අම්මලාට Epidural කරන්නේ නෑ."

ප්‍රසූති වේදනාව අවම කරන්න දැනට අපේ රෝහල්වල ක්‍රම කීපයක් තියෙනවනේ. ඒ අතරින් Epidural ක්‍රමය වෙනස් වෙන්නේ කොයි විදියටද කියලත් අපි ඇහුවා.

**"අපේ රටේ දැනට බහුලව භාවිතා කරන්නේ 'පෙතිඩීන්' (Pethidine) කියන වේදනානාශක ක්‍රමය. හැබැයි ඒ හරහා එන සංකූලතා වැඩියි. ඒ සංකූලතා දරුවට වුණත් බලපාන්න පුළුවන්. තව ක්‍රමයක් තියෙනවා. ඒ අම්මට නයිට්‍රස් ඔක්සයිඩ් වායුව ඉරීමට සලස්වන එක. ඒත් ඒකත් එතරම් සාර්ථක නෑ. පළවැනි පාර ඉරීමේදී අම්මට වමනය, කරකැවිල්ල වැනි තත්ත්වයන් එන්න පුළුවන්. ඊටපස්සේ සිසේරියන් සැත්කම්වලදි ස්පයිනල් ක්‍රමය කියලා එකක් යොදාගන්නවා. එතැනදි කරන්නේ එන්නතක් හරහා කොන්දෙන් පහළ කොටස අප්‍රාණික කරන එක. ඒක යථා තත්ත්වයට පත්වෙන්න පැය කීපයක් යන නිසා ඒ කාලයේදි මුත්‍රාශය පවා අඩපණ වෙනවා. එහෙම බැලුවම Epidural ක්‍රමයට දරුවෙක් ප්‍රසූත කරන එක තමයි සාර්ථකම ක්‍රමය වෙන්නේ."**

නිර්වින්දන විශේෂඥ වෛද්‍ය රෝෂණ මල්ලවාරච්චි කියන්නේ කලක් එක්සත් රාජධානියේ සේවය කරපු වෛද්‍යවරයෙක්. එහිදී ඔහු ඒ රටේ මව්වරු දුසහකට පමණ මේ Epidural සිදුකරලා තියෙනවාලු.

"එක්සත් රාජධානියේ මව්වරුන්ගෙන් 80%ක් විතර දරුවන් ප්‍රසූත කරන්නේ Epidural ක්‍රමයට. ඒ වගේම සංවර්ධිත රටවල බොහෝමයක මේ ක්‍රමයට තමා දරුවෝ ප්‍රසූත කරන්නේ. ලංකාවේ ප්‍රධාන රෝහලවල මේක පටන්ගන්න හැදුවත් තාම 100%ක් ඒක සිදුවෙන්නේ නෑ. එහෙම වෙලාවක තමයි මං මූලික වෙලා අපේ රෝහලේ මේ වැඩේ පටන්ගන්න හිතුවේ."

පසුගිය සතියේ තෙල්දෙණිය දිස්ත්‍රික් රෝහලේදී මේ Epidural ක්‍රමයට සිදුකරපු පළවැනි දරු ප්‍රසූතිය සිදුකරලා. කිසිම අපහසුවකින් තොරව ඒ අම්මා නිරෝගී ගැහැනු දරුවෙක් බිහිකරලා දින කීපයකින් රෝහලෙනුත් පිටව ගිය බවයි වෛද්‍යවරයා 'ධරණී'ට කිව්වේ.

**"අපි අපේ රෝහලේ මාතෘ සායනවලදි මේ ක්‍රමය ගැන දැනුවත් කළා. ඒත් ගොඩාක් අම්මලා කැමතිවුණේ නෑ ඒ විදියට දරුවව ප්‍රසූත කරන්න. ඒකට හේතුව එයාලට තාමත් මේ ගැන කිසිම අවබෝධයක් නැති එක. ඒ වුණාට එක අම්මෙක් හරි සතුටින් නිර්භීතව ඉදිරිපත් වුණා. ඒක ඒ අම්මගේ දෙවැනි දරු ප්‍රසූතිය. කොහොමහරි කිසිම ප්‍රශ්නයක් නැතුව ඒ අම්මා හරිම සතුටින් දරු ප්‍රසූතිය සිදුකළා. අම්මට හරි සතුටුයි. ඇය කිව්වා දරුවා ලැබුණද කියලා දැනුණෙවත් නෑ කියලා. අම්මයි දරුවයි දැන් නිරෝගීව ඉන්නවා."**

එහෙම කියපු වෛද්‍යවරයා ඊට සහාය දුන් පිරිස මතක් කරන්නත් අමතක කළේ නෑ. ඒ අතර රෝහල තුළ මෙය ආරම්භ කිරීමට අවස්ථාව දීපු වෛද්‍ය අධිකාරී වෛද්‍ය ප්‍රසාද් වැලිවිට මහතාට වෛද්‍ය හසිත ගුණසිංහ (VOG) මහතාට රෝහලේ අනෙකුත් නිර්වින්දන වෛද්‍යවරුන්ට හෙදියන්ට පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට සහ රෝහලේ සියලුම කාර්ය මණ්ඩලටත් ඔහු සිය ස්තූතිය පුදකළා.

"මේ Epidural ක්‍රමයට දරු ප්‍රසූතියක් සිදුකරන්න කිසිම බයක් ඇතිකරගන්න එපා. කවුරුහරි කාන්තාවක් දරුවෙක්ට ආසවෙලත් ප්‍රසූත වේදනාවට තියෙන බය හින්දා දරුවෙක් හදන්නේ නැතුව ඉන්නවා නම් Epidural ක්‍රමයට බය නැතුව දරු ප්‍රසූතිය සිදුකරන්න කියලා කියන්න කැමතියි. ඒ වගේම සාමාන්‍ය දරු ප්‍රසූතියක් සිදුකරද්දි වුණත් මේ ක්‍රමයට ගියාට කමක් නෑ. ඉදිරියේදී මේ ගැන ලංකාවේ සමස්ත කාන්තාවන්ම දැනුවත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා."

ඔන්න ඉතින් කිසිම හේතුවක් නිසා ආයෙමත් දරු ප්‍රසූතියට බයවෙන්න උවමනා නෑ. එහෙම බයවෙලා වෙන වෙන ක්‍රමවලට ගිහින් අම්මයි දරුවයි දෙන්නම අමාරුවේ වැටෙන්නේ නැතුව කෙළින්ම Epidural ක්‍රමයට දරු ප්‍රසූතිය කළා නම් වැඩේ ඉවරයි. එතකොට කොයි අම්මටත් පුළුවන් හිනාවෙන ගමන්ම දරු ප්‍රසූතිය සිදුකරන්න.

■ රුවන් එස්.සෙනවිරත්න



# නෙතාෂා මැරුණේ ඩයට් කරලද? නැද්ද?



ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී තිරාණි පීරිස්ගේ එකම දියණිය නෙතාෂා පීරිස්ගේ හදිසි වියෝව රටම කම්පනයට පත්කළ සිදුවීමක්. දහනව හැවිරිදි නෙතාෂා මියගියේ මැලේසියාවේ මොනාෂ් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තුන්වැනි වසරේ ඉගෙනුම ලබමින් සිටියදීයි. ඒ පසුගිය දහවැනිදා ප.ව 7.45ට පමණ.

සිදුවීම ආරංචි වූ මොහොතේ සිට සමාජ මාධ්‍ය තුළින් නොයෙක් අන්දමේ කතා ඇසෙන්න වුණා. ඒ අතරින් බොහෝදෙනාගේ මතය වූයේ නෙතාෂා ඇගේ ශරීරය කෘශ කරගැනීමට ආහාර පාලනය කිරීම නිසා අකාලයේ මියගිය බවයි.

මියගිය නෙතාෂා දියණිය ගැන නොයෙක් කතා අසෙද්දී රටම කැළඹූ මේ සිදුවීමේ ඇත්ත කතාව දැනගැනීම උදෙසා බම්බලපිටියේ පිහිටි තිරාණි පීරිස් මහත්මියගේ නිවසට අපි ගොඩවූයෙමු.

නෙතාෂාගේ වියෝවෙන් තවමත් සංවේගයට පත්ව සිටින තිරාණි මහත්මිය සිදු වූ අවාසනාවන්ත සිදුවීම ගැන අපට පැවසුයේ මෙවැනි කතාවක්.

"දුව උසස් පෙළට වෙනකන් ඉගෙනගත්තෙ නුගේගොඩ ලයිසියම් ජාත්‍යන්තර පාසලේ. 2021 දි මැලේෂියාවේ මොනාෂ් වෛද්‍ය විද්‍යාලයට ගියා. අවුරුද්දෙදි. එතකොට දුවට වයස 18යි. මමයි මහත්තයි දුවව ඒ ගමන යැව්වේ යවන්නම ඕනෙ නිසා මිසක හිතේ කැමැත්තකින් නෙවෙයි. මොකද දුවට ඕන වුණේ ඩොක්ටර් කෙනෙක් වෙන්න. ඉතින් එයාගේ වෛද්‍ය සිහිනය හැබෑ කරගන්න දෙමව්පියෝ විදියට අපිත් කැපකිරීම් කරන්න ඕනෙ කියලා අපි හිතුවා.

එහෙදි දුව තනියම අපාර්ට්මන්ට් එකක නතරවෙලා හිටියේ. එහෙම හිටියා කියලා අපි කවදාවත් එයාට පාලුවක්, තනිකමක් දැනෙන්න දුන්නේ නෑ. අපි මුළු දවසෙම සැරින් සැරේට එයාට කතා කළා. එයත් එහෙමයි. කොටින්ම දුව තේ එකක් හදාගන්න කුස්සියට ගියෙත් අපිට කියලා. එහෙම හිටපු දරුවගෙන් පහුගිය නවවැනිදා උදේ ගුඩ් මෝනින් මැසේජ් එක ආවෙ නැහැ. හැමදාම රෑට පාඩම් කරන නිසා මම හිතුවා මහන්සියට එදා නින්ද ගිහින් ඇති කියලා. හැබැයි දවල් වෙද්දිත් දුව ආයේ කෝල් කළේ නෑ. පස්සේ මම දිගටම දුවට කෝල් කළා. දවල් වෙනකම්ම බලන් ඉඳලත් කිසිම තොරතුරක් නැති තැන මම එයාගෙ යාළුවන්ට කෝල් කරලා ගෙදරට ගිහිල්ලා බලන්න කිව්වා. තට්ටු කළත් දොර අරින්නෙ නෑ කියලයි එතකොට යාළුවෝ මට කිව්වේ. පස්සේ මම ඒ දරුවන්ට කිව්වා ඇතුළට දොර කඩාගෙන ගිහිල්ලා හරි එයාව බලන්න කියලා.

ඒ යනකොටත් දුව ඇඳේ වැටිලා අමාරුවෙන් හුස්ම ගන්න ගමන් තමයි ඉඳලා තියෙන්නේ. පස්සෙ ඒ දරුවෝ දුවව ඒ වෙලාවෙම රෝහල්ගත කරන්න කටයුතු කරලා තිබුණා."

සිද්ධියෙන් පසුවදා තිරාණි පීරිස් මහත්මිය මැලේෂියාවට යාමට සූදානම්ව සිටියදී නෙතාෂා මියගිය ආරංචිය ලැබුණු බව අය පැවසුවේ මහත් සංවේගයෙන්.

"මගේ දුවට මෙහෙම වුණේ ඇඟ කෙට්ටු කරගන්න කරපු ඩයට් ප්ලෑන් එකක් නිසා කියලා ගොඩක් අය කතා වෙනවා. මං දන්න තරමින් මගේ දුවට එහෙම ප්ලෑන් කරලා ඇඟ කෙට්ටු කරගන්න කිසිම උවමනාවක් තිබුණේ නෑ. අනික එහෙම කරලා කෙට්ටු වෙන්න තරම් තරබාරු ඇඟක් එයාට තිබුණොත් නෑ. හැබැයි එයා අවුරුදු දහයේ ඉඳලා මේ වෙනකම්ම සත්තු මරන එක පව් කියලා නිර්මාංශව හිටපු කෙනෙක්. කෑම බීම වුණත් එක ප්‍රමාණයකට තමයි ගත්තේ. ඒක ඉතින් ඩයට් කරන්න හිතාගෙන කරපු දෙයක් නෙවෙයි.

හැබැයි දුව නැති වෙන්න කලින්දා ඒ කිව්වෙ නවවැනිදා ඉඳලාම එයාගේ ඇගේ සීනි සාන්ද්‍රණයේ යම්කිසි අඩුවක් පෙන්නුම් කරලා තියෙනවා. ඒක එයා කාපු බීපු දෙයක් නිසා වුණ දෙයක් කියලයි අපි හිතන්නේ."

රටම කම්පාවට පත්කරමින් මේ වෙනකොටත් නෙතාෂා සදහටම මෙලොවෙන් සමුඅරන් හමාරයි.

**"කොයිතරම් ආදරෙන් දරුවෝ හැදුවත් අපිට සදහටම එයාලා අපේ ළඟ තියාගන්න බෑ. එයාලගේ අනාගතය හදාගන්න වගේම විවාහ වෙලා යන දවසට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපිට දරුවෝ අතාරින්න සිද්ධ වෙනවා. ඒත් එහෙමයි කියලා කිසිම වෙලාවක ඒ අය එක්ක තියෙන සම්බන්ධයකම් දුරස් කරගන්න එපා. මමයි මහත්තයයි ඒක ඒ විදියටම කරපු දෙමව්පියෝ දෙන්නෙක්. අපිට අපේ දුවව ආපහු ලැබෙන්නෙ නෑ. ඒත් ෆෝන් එකෙන් හරි නිතරම දූගේ ළඟ හිටපු එක අපිට එක පැත්තකින් සැනසීමක්. ඒ වගේම මට අනිත් අයට කියන්න ඕනේ හරියට දේවල් නොදැන දරුවන්ට කතා හදන්න එපා. කතා කියන්න එපා. ඒක ජීවත්වෙලා ඉන්න දෙමව්පියන්ට මහා දුකක්.**

**අනික රජය මැදිහත් වෙලා අපේ රටට ප්‍රමිතියක් තියෙන වෛද්‍ය විද්‍යාල පිහිටුවන්න කටයුතු කළා නම් දෙමව්පියන්ට දරුවන්ට මෙහෙම දේවල්වලට මූණදෙන්න වෙන්නෙ නෑ කියන එකයි මගේ අදහස."**

■ ලිහිණී මධුෂිකා

## ඩයට් කරලා කෙට්ටු කරගන්න තරම් මහත ඇඟක් දුවට තිබුණේ නැහැ



දැන්වීමකි

# සුරක්ෂිතව මව් කිරි ලබා දීමේ යහ පුරුදු අනුගමනය කරමු



දරුවා සහ මව අතර සම්බන්ධතාව ශක්තිමත් කරමින් දරුවාගේ වර්ධනයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ සපයමින්, දරුවාගේ ප්‍රතිශක්තිය ඉහළ නංවන්නට සහය වන්නේ මව් කිරියි. දරුවකුගේ අඛණ්ඩ වර්ධනය වෙනුවෙන් මූලික පෝෂණ අවශ්‍යතාව සපුරන මව් කිරි දෙන විට මව්වරුන්ට විවිධ ආකාරයේ ගැටලු පැන නගියි.

දරුවාට මව් කිරි දෙන විට, කිරිවලින් බඩ පිරෙන දරුවා සතුටටත්, සුව පහසුවටත් පත් වේ. මින් දරුවාගේ හැඬීම නැවතී දරුවා ඉක්මනින් නින්දට යයි. දරුවකුගේ උපතේ සිට අඛණ්ඩව මාස 06ක කාලයක් මව් කිරි ලබා දිය යුතු බව වෛද්‍ය නිර්දේශයයි. දරුවා කිරි ඉල්ලන ආකාරය අනුව දරුවාට කිරි ලබා දිය යුතුය. හොඳින් කුස පිරී සුවසේ නින්දට යන දරුවා හඬන්නේ නම් නැවත දරුවාට කිරි ලබා දිය හැකියි. උපරිම පැය 3-4ක කාලයක් ඉක්මවා නින්දේ පසු වන්නේ නම් දරුවා ඇහැරවා නැවත කිරි ලබා දිය යුතුය.

කිරි ලබා දෙන අතරතුර දරුවා හැඬීම, කිරි බීම ප්‍රතික්ෂේප කිරීම, බලෙන් කිරි ලබා දෙන විට ඇතැම් විට කිරි වමනය කිරීම ආදිය සිදු වන විට, දරුවා ඉන් එහා කිරි නොබොන නිසා කිරි ලබා දීම නතර කිරීමට මව්වරුන් අවබෝධ කර ගත යුතුයි. දරුවා කිරි බීමෙන් පසු මුනින් අතට හරවා, මවගේ උරහිස මත තබා පිටට සෙමින් තට්ටු කර වාතය පිට කිරීම හෙවත් ගුඩුස් යැවීම නිරන්තරයෙන් කළ යුත්තකි.

දරුවා කිරි නොබොන බවට හේතුව මව් කිරි ලබා දීමේ ක්‍රමවේද පිළිබඳ ඇති නොදැනුවත් බව සහ අත්දැකීම් නොමැති බවයි. ප්‍රථම වරට මව්වරුන් වන බොහොමයක් දෙනා මේ ගැටලුවට මුහුණ දෙයි. කිරි ලබා දීමේ දී, සම්පූර්ණ තන පුඩුවම දරුවාගේ මුවෙහි රැඳිය යුතුයි. මවගේ අත්ලෙහි දරුවාගේ හිසත්, අතේ මැණික් කටුව සහ වැලමිට අතර ප්‍රදේශයේ දරුවාගේ කොන්ද හේත්තු කර දරුවාව නිවැරදිව හරස් අතට පිහිටුවා ගෙන කිරි ලබා දිය යුතුය. මෙම ක්‍රමවේදය නිසියාකාරව පුරුදු වීමෙන් දරුවා හොඳින් කිරි බොන අතර, එසේ නැති වුවහොත් දරුවාට නිරන්තරයෙන් කුසගිනි ඇති වී පැය 1-2 අතර කාලයක් හැඬීම සිදු කරයි.

කිරි ලබා දෙන මවගේත්, දරුවාගේත් සනීපාරක්ෂාව යහපත්ව පවත්වා ගැනීම ඉතාම වැදගත් වේ. මව ස්නානය කර පිරිසිදුව සිටීම, දරුවාට කිරි දීමට පෙර දෑත්, පියයුරු සහ තන පුඩු පිරිසිදුව තබා ගැනීමට වග බලා ගත යුතුය.

මව්වරුන්ට වෙනත් රෝග නොමැති නම් කිරි එරීමේ හෝ කිරි අඩු වීමේ ගැටලුවක් වෛද්‍ය විද්‍යාත්මකව සිදු නොවේ. එය නිශ්චිත ක්‍රමවේදයට මව් කිරි නොදීමේ, කිරි දොවා නොගැනීමේ ගැටලුවකි. නිදසුනක් ලෙස දරුවාට තන පුඩුවෙන් මව් කිරි ලබා දීමේ දී හෝ අතින් කිරි දෙවීමේ දී, කිරි මිලි ලීටර් 05ක ප්‍රමාණයක් දොවා ගත හොත්, ඊළඟ වටයේ දී කිරි මිලි ලීටර 07ක ප්‍රමාණයක් ඇදී එයි. මෙම කිරි මිලි ලීටර 07ම දොවා ගත් පසු ඊළඟ වටයේ දී කිරි මිලි ලීටර 10ක ප්‍රමාණයක් ඇදී එයි. මෙසේ මව් කිරි නිෂ්පාදනය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වේ. එක් පියයුරකින් කිරි දොවා ගත් පසු, දෙවෙනි වරට කිරි දොවා ගත යුත්තේ අනෙක් පියයුරෙනි. මෙසේ දොවා ගන්නා කිරි, අසුරණයේ හොඳින් සීල් කර ශීතකරණයේ තබයි. කල් තබන කිරි භාවිතයට පෙර රත් කිරීමෙන් කිරිවල අඩංගු පෝෂ්‍ය කොටස් විනාශ විය හැකි නිසා කිරි ලබා දීමට නියමිත වේලාවට පැය 2-3කට පෙර දොවා ගත් කිරි බෝතලය ශීතකරණයෙන් රැගෙන කාමර උෂ්ණත්වයට පැමිණෙන තෙක් තැබීම වඩාත් සුදුසුයි. ඉක්මනින් කිරි ලබා දීමට අවශ්‍ය නම් කිරි බෝතලය මද උණුසුම් වතුර භාජනයක ගිල්වා තබා සාමාන්‍ය උෂ්ණත්වයට පැමිණි පසු ලබා දිය හැක.

මව් කිරි ලබා දීමෙන් සිරුර අවලස්සන වන බවට සමාජයේ ඇති දුර්මත අනුගමනය නොකර සෑම විටම දරුවාට මවගේ තන පුඩුවෙන් කිරි පෙවීමත්, වෙනත් ආදේශන වෙනුවට මව් කිරි දීමටත් කටයුතු සලසමින් දරුවාගේ කායික, මානසික සුරක්ෂිත බව රැක ගත යුතුයි.

**Dr. Mahika Udara**
වෛද්‍ය නිලධාරී
(MBBS Colombo)
සෞඛ්‍ය අමාත්‍යාංශය



beauty



# වැරදි පුරුදු නිසා වැරදි තැනක කුරුලෑ ආවොත් මොකද කරන්නේ?

මීට අවුරුදු කීපයකට කලින් ඕස්ට්‍රේලියාවේ ක්වීස්ලන්ඩ්වලින් බොහොම පෞරාණික ලෙන් බිත්තියක් සොයාගත්තා. පුරා විද්‍යාඥයෝ මේකට නම දැම්මේ “The wall of one thousand vulvas (යෝනි මාර්ග දහසක් ඇති බිත්තිය)” කියලා.

ලෙන් බිත්තිය පුරා ඇඳලා තියෙන්නේ ස්ත්‍රී නිමිති වීම තමයි එහෙම නමක් දන්න හේතුව. මේ චිත්‍ර ඇඳලා තියෙන්නේ ඕස්ට්‍රේලියාවේ ආදිවාසී ජනකණ්ඩායමක් වෙච්ච් ඇබෝජියන්වරුලු.

ඔය දැන් මිනිස්සු ශිව ලිංගය වන්දනාමාන කරනවා වගේ ඇබෝජියන්වරුලු ඒ කාලේ ස්ත්‍රී නිමිත්ත වන්දනාමාන කළාලු. ජීවය බිහිකරන කේන්ද්‍රස්ථානය විදියට ඒ අය ස්ත්‍රී නිමිත්තට භක්තිවන්ත වුණාලු. ඉතින් යම්කිසි සුබ කටයුත්තක් කරන්න කලින් ඒ අය මේ බිත්තියේ ස්ත්‍රී නිමිත්තක් ඇඳලා ඒකට වන්දනාමාන කළා කියලා තමයි කියන්නේ. මේ දහස් ගාණක් ස්ත්‍රී නිමිති තියෙන බිත්තිවලින් ඒ කාලේ ස්ත්‍රී ලාලිත්‍ය ස්වභාවය වගේම ඒ උදවියට තිබුණු ලෙඩරෝග ගැනත් දළ අදහසක් ගන්න පුළුවන් වුණාලු.

ගොඩක් උදවිය තමන් දැකලා තියෙන ස්ත්‍රී නිමිති ඇඳලා තියෙන්නේ ලප, කුරුලෑ, ගැටිති වගේ දෙවල් එක්කලු. ඉතින් කියන විදියට ඔය කාලෙ ඉඳපු කාන්තාවන් පවා යෝනිය වටා එන ගෙඩි, කුරුලෑ වගේ දේවලින් සෑහෙන පීඩා විඳලා තියෙනවා.

ස්ත්‍රී නිමිත්තේ එන කුරුලෑ නිසා අදටත් ගොඩක් කාන්තාවන් අපහසුවට පත්වෙනවා. හැබැයි ඇහැට කනට පේන්න තියෙන තැන්වල එන කුරුලෑ ගැන තරමට කවුරුත් රහස් තැන්වල එන කුරුලෑ ගැන කතා නොකරන එකයි වැඩේ. ඒ නිසා අපේ කාන්තාවන්ට මේවා පාලනය කරගන්න එහෙමට දැනුමක් නෑ. රහස් තැන්වල එන පියුබික් ඇක්නි (pubic acne) ඇතිවෙන එක වළක්වන්න හැටියි ඒවට ගෙදරදි කරන්න පුළුවන් පිළියම් ගැනයි කතා කරන්න හිතුවේ ඒකයි.

යෝනි මාර්ගයට ඉහළ රෝම තියෙන තැන්වල තමයි පියුබික් කුරුලෑ වැඩිපුර හැදෙන්නේ. ඊට අමතරව ඉකිල්ල වගේ තැන්වල වුණත් මෙව්වා එන්න බැරි නෑ. කළු, සුදු නැත්තම් රතු පාට විශාල ගෙඩියක් විදියටයි එන්නේ. මූණේ එන කුරුලෑවලට වඩා රහස් තැන්වල එන කුරුලෑවල වේදනාව වැඩියි. වේදනාව කොච්චරද කියනවා නම් මේ කුරුලෑ හැදුනහම උණ හැදෙන්න වුණත් පුළුවන්.

පියුබික් කුරුලෑ ඇතිවෙන්නේ ඇයි කියලා අපි දැන් බලමුකෝ. හෝර්මෝන අසමතුලිතතාවය නිසා සමහරුන්ට මේ කුරුලෑ එනවා. ඒ වගේම අපේ වැරදි පුරුදුත් මේ තැන්වල කුරුලෑ එන්න හේතුයි.

පළමුවැන්න රේසර්වලින් රහස් තැන්වල රෝම කපන එක. රේසරෙන් මේ තැන්වල රෝම ඉවත් කළාම කේශ මූලයට හානිවෙන්න තියෙන ඉඩ වැඩියි. පස්සේ එතැන ආසාධනය වෙලා තඩි කුරුලෑ එනවා. අනික රේසර නිසා කේෂ මූල අවහිර වෙන්නත් පුළුවන්. එතකොටත් ඉක්මනින්ම කුරුලෑ එනවා. රේසර්වලින් ශේව් නොකර රහස් පැත්තේ රෝම අයින් කරන්න වෙන ක්‍රමයක් පාවිච්චි කරන්න. එහෙමත් නැත්තම් රේසරෙන් රෝම ඉවත් කළ හැටියේ එතැනට මොයිස්චරයිසින් ක්‍රීම් ටිකක් ගාන්න. නැත්තම් උණුවතුරෙන් පොඟවපු තුවායකින් ඒ තැන් සම්බාහනය කරන්න. එතකොට කුරුලෑ එන එක ටිකක් පාලනය කරගන්න පුළුවන්.

ඊළඟ හේතුව යටඇඳුම්. ඇඟට ගොඩාක් තද යටඇඳුම් අඳින්න එපා. එතකොට සමට ඔක්සිජන් යන්නේ අඩුවෙන්. එහෙම වුණාම ඉක්මනින්ම රෝම කූප අවහිර වෙලා ඒ තැන් ආසාදන වෙනවා. ඒ වගේම නයිලෝන් වගේ රෙදි අඳින අයටත් පියුබික් කුරුලෑ එනවා වැඩියි. නයිලෝන් වගේ දහඩිය උරා නොගන්න ඇඳුම් ගොඩ වෙලාවක් ඇඳගෙන හිටපුවහම ඒ තැන්වලට දහඩිය දානවා වැඩියි. එතකොට දහඩිය, කුණු, දූවිලි එක්කාසු වෙලා රෝම සෙල අවහිර වෙලා කුරුලෑ හැදෙනවා.

රහස් තැන්වලට පාවිච්චි කරන ඩියෝඩ්‍රන්ට්, පර්ෆියුම්, වයිප්ස් සහ සේදුම්කාරකත් පියුබික් කුරුලෑ ඇතිවෙන්න හේතුයි. ඒ වගේම සමහරුන්ට ඔපස් කාලෙට අඳින සනීපාරක්ෂක තුවා ආසාත්මික වෙලත් මේ ගෙඩි හැදෙනවා.

**සුබ කටයුත්තක් කරන්න කලින් ඒ අය බිත්තියේ ස්ත්‍රී නිමිත්තක් ඇඳලා ඒකට වන්දනාමාන කළාලු**

මේ තැන් පිරිසුදුවට තියාගන්නේ නැති කොටත් කුරුලෑ හැදෙනවා. ඒ වගේම සුද යාම වගේ ගැටලු තියෙන අයටත් නිතරම පියුබික් කුරුලෑ එනවා.

ඉතින් මුල්ම දේ නිතරම රහස් ප්‍රදේශය පිරිසුදුව තියාගන්න. වොශ්රූම් ගියාට පස්සේ ඒ තැන්වල තෙතමාත්තු කරලා වියළිවට තියාගන්න බලන්න. මොකද තෙත ස්වභාවය වැඩිවෙන තරමට කුරුලෑ විතරක් නෙමෙයි යෝනි ආසාදන පවා ඇතිවෙන්න තියෙන ඉඩ වැඩියි.

නිතරම පියුබික් ඇක්නි එන කෙනෙක් නම් ඔසප් කාලෙට රහස් තැන්වල අනවශ්‍ය රෝම කපන්න එපා. ඒකෙන් කුරුලෑ වැඩිවෙන්න පුළුවන්. නයිලෝන් යටඇඳුම් වෙනුවට නිතරම කපු ඇඳුම් අඳින්න බලන්න.

පියුබික් කුරුලෑවක් ආවහම ඒකේ උඩ බිලැක් හෙඩ් එකක් වගේ කළු කොටසක් ඇතිවෙනවා. පස්සේ ගෙඩිය ඇතුළේ සැරව වගේ පිරෙන්න පුළුවන්. ඔන්න එතකොට අපේ නෝනලා ටික ඕක කඩන්න, මිරිකන්න, නියපොතු ගහන්න පටන් ගන්නවා. වේදනාව ඇර පියුබික් කුරුලෑවලින් වෙනත් හානියක් නැහැ. හැබැයි අර කිව්ව විදියට අනවශ්‍ය දේවල් කරලා වැඩේ වණ කරගතොත් සංකීර්ණ ප්‍රශ්න ඇතිවෙන්නත් බැරි නැහැ. ඒ නිසා කිසිම වෙලාවක මේ ගෙඩි කඩන්න එපා. අනික කුරුලෑව කඩපුවහම තත්ත්වය හැමතැනකම පැතිරෙන්නත් ඉඩයි.

පුළුවන් නම් බෙන්සොයිල් පෙරොක්සයිඩ් (Benzoyl peroxide) 5%ක් අඩංගු ක්‍රීම් එකක් ගාන්න. සාලිසිලික් ඇසිඩ් (salycylic acid), ග්ලයිකොලික් ඇසිඩ් (Glycolic acid) අඩංගු රූපලාවණ්‍ය ආලේපවලිනුත් කුරුලෑව ඉක්මනින් සුව කරගන්න පුළුවන්. ඒ දේවල් නැත්තම් ටී ට්‍රී ඔයිල්, කෝමාරිකා ස්වල්පයක් ආලේප කරන්න.

කුරුලෑවෙන් ඉවසන්න බැරි වේදනාවක් එනවා නම් හරි දවස් ගාණක් යනකල් සුවවෙන්නේ නැත්තම් හරි චර්ම රෝග වෛද්‍යවරයෙක් හෝ ප්‍රසව හා නාරිවේද වෛද්‍යවරයෙක්ව මුණගැහෙන්න කියන එකත් මතක් කරන්න ඕනේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

දැන්වීමකි

# ලීසිං සේවාවේ නව සංස්කෘතියක් නිර්මාණය කිරීමට කැපවෙන HNB ලීසිං

**ලීසිං සම්බන්ධයෙන් සමාජය තුළ නොයෙකුත් මත තිබුණත්, ඇත්තටම ලීසිං කියන්නේ තමන්ගේ ජීවිත ජයග්‍රහණය කරවීමට නිරන්තරව වෙහෙසෙන අයට එම ජයග්‍රහණ අත්පත් කර ගනිමින් තමන්ගේ හීන කරා යාමට මග විවර කර දෙන සේවාවකි. මෙරට ලීසිං පහසුකම් පළමුවෙන්ම ආරම්භ කළ පෞද්ගලික වාණිජ බැංකුව වන HNB එමගින් දේශීය ජනතාවගේ ජීවිත උසස් කිරීම වෙනුවෙන් හඳුන්වා දීමට සමත් වූ සුවිශේෂ සේවාවක් විදිහට HNB ලීසිං සේවාව දැක්විය හැකිය.**

### පාරිභෝගික කේන්ද්‍රීය සංස්කෘතිය

නිරන්තරව පාරිභෝගිකයන්ගේ පහසුව සහ ඔවුනගේ අවශ්‍යතාවය වෙනුවෙන් කැපවෙන හැටන් නැෂනල් බැංකුව, වර්තමානයේ සමස්ත ලාංකීය ජනතාව මුහුණපා සිටින ආර්ථික දුෂ්කරතාවයට සහනයක් සැලසීම වෙනුවෙන් ආකර්ෂණීය සේවා රැසක් හඳුන්වා දී ඇත. මේ යටතේ හැටන් නැෂනල් බැංකුව මගින් නම්‍යශීලි ලීසිං සැලසුම් හඳුන්වා දීම යටතේ හඳුන්වා දෙනු ලැබූ නව ක්‍රමවේදයක් ලෙස Flexible plan සේවාව දැක්විය හැකිය. මෙහිදී පාරිභෝගිකයකයින් හට තමන්ට පහසුවෙන් සහ තමන්ගේ ගෙවීම් හැකියාවට සරිලන ආකාරයෙන් ලීසිං වාරික සකසා ගැනීමේ පහසුකම ලබා දී ඇත. එමෙන්ම තමන්ගේ හැකියාව අනුව කුඩා ප්‍රමාණයේ වාරිකයක සිට ක්‍රමයෙන් වැඩිවන ආකාරය වැනි විවිධාකාරයේ වාරික ගෙවීම් ක්‍රමවේද ඔස්සේ පහසුවෙන් ලීසිං සේවා ලබා ගැනීමේ පහසුකම ලබා දී ඇත. තවද තමන්ගේ අතට මුදල් එන අවස්ථාව අනුව වාරික ගෙවා වාරිකය හෝ ගෙවීමේ කාලසීමාව අඩුකර ගැනීම වැනි සහන රැසක් මේ ඔස්සේ ලබා දී ඇත. මෙමගින් නව ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම තුළින් වඩාත් ආකර්ෂණීය සේවාවක් මෙන්ම ඉහළ සහ කාර්යක්ෂම පාරිභෝගික සේවාවක් සැපයීම මූලික අපේක්ෂාව වේ.

### ක්ෂුද්‍ර මූල්‍ය ලීසිං සේවා

රටක සංවර්ධනය පවතින්නේ ව්‍යවසායකත්වය මතයි. මේ නිසා රට තුළ ව්‍යවසායකත්වය වර්ධනය කිරීමේ වගේම ව්‍යවසායකත්වයට නව පිරිස් නැඹුරු කර ගැනීමේ අරමුණින් මෙන්ම, ඔවුන් ශක්තියක් වීමේ අරමුණින් HNB ලීසිං වෙතින් ක්ෂුද්‍ර මූල්‍ය ලීසිං පහසුකම් හඳුන්වා දී ඇත. දේශීයව පළමුවරට හඳුන්වා දී ඇති මෙම පහසුකම ඔස්සේ බිම් මට්ටමේ ව්‍යවසායකයින් හට පියවරෙන් පියවර සිය ව්‍යාපාර වර්ධනය කර ගැනීමට මනා අවස්ථාවක් ලබා දී ඇත. එමෙන්ම එවැනි හැකියාවක් ඇති ව්‍යාපාර සහ ව්‍යවසායකයන් වෙනුවෙන් සිය ව්‍යාපාර වර්ධනය කරගැනිම සඳහා සැලසුම් රැසක් හැටන් නැෂනල් බැංකුව මගින් හඳුන්වා දී ඇත. මෙහිදී අදහස් දක්වමින් හැටන් නැෂනල් බැංකුවේ ලීසිං ප්‍රධානි කේ. සී. සුසිත් පෙරේරා මහතා ප්‍රකාශ කර සිටියේ, ''පියවරෙන් පියවර ව්‍යවසායකත්වය වර්ධනය කිරීමේ අරමුණින් තමයි අපි මේ ලීසිං සේවාව ආරම්භ කිරීමට යොමුවුණේ. එතනදී හැටන් නැෂනල් බැංකුව විදිහට අපි ගනුදෙනුකරුවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා ලීසිං පහසුකම් ලබා දීමට කටයුතු කරනවා වගේම ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භයේ සිටම උපදෙස් ලබා දෙමින් ව්‍යාපාර වර්ධනය කර ගැනීම සඳහා උපදෙස් ලබාදීමත් සිදුකරනවා. මෙහිදී ඒ අයට මූල්‍ය පරිපාලනය සහ ව්‍යාපාරික දැනුම ලබාදීම වෙනුවෙන් විශේෂ පුහුණු වැඩසටහන් පවා ක්‍රියාත්මක කරනවා.''

### සහන සේවා රැසක්

පාරිභෝගිකයන්ගේ ඉහළ විශ්වාසයක් දිනා ගත් හැටන් නැෂනල් බැංකුව, වර්තමාන ආර්ථික දුෂ්කරතා හමුවේ පීඩාවට පත්ව සිටින සිය ගනුදෙනුකරුවන් වෙනුවෙන් විශේෂ සහන රැසක් ද ක්‍රියාත්මක කිරීමට යොමුව ඇත. බැංකුවක් විදිහට තම ගනුදෙනුකරුවන්ගේ වර්ධනය වෙනුවෙන්ම කැපවෙමින්, ඔවුන්ගේ ව්‍යාපාර නැවත ගොඩනගාගැනීම වෙනුවෙන් දිරි දීමක් වශයෙන් ක්‍රියාත්මක කර ඇති මෙම සේවාව තුළින් අඛණ්ඩව ලීසිං වාරික ගෙවීමේ ඉතිහාසයක් ඇති, අද වන විට විවිධ හේතූන් නිසා වාරික ගෙවීමේ දුෂ්කරතාවයෙන් පසුවන සිය



ලීසිං අංශ ප්‍රධානි
කේ. සී. සුසිත් පෙරේරා

ගනුදෙනුකරුවන් වෙනුවෙන් විශේෂ සහන වැඩසටහන් රැසක් හඳුන්වා දී ඇත. මේ යටතේ ඔවුන් ගෙවීමට ඇති හිඟ වාරික තමන්ගේ ආදායමට සරිලන ආකාරයට ප්‍රතිව්‍යුහගත කර ගෙවීමේ අවස්ථාව ලබා දෙමින් අඛණ්ඩව වාරික ගෙවීමේ අවස්ථාව ලබා දී ඇත. මීට අමතරව කිසිම අමතර පොලී අයකිරීමකින් තොරව එකඟ වූ පොලී අනුපාත යටතේ ඉදිරි ගෙවීම් කාර්යයන් කිරීමේ අවස්ථාව ද ලබා දීමෙන් පාරිභෝගිකයන් වෙත යොමුවන අමතර පීඩනයෙන් නිදහස් කර ඇත. මෙමගින් හැටන් නැෂනල් බැංකුව, ජාතික කර්තව්‍යයක නිරත වෙමින් දේශීය ව්‍යවසායකත්වය ආරක්ෂා කරමින් ඔවුන් වෙත නැවත නැගී සිටීම සඳහා අවස්ථාවක් සහ ශක්තියක් ලබා දී ඇත.

### ලීසිං ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ රැසක්

දිවයිනේ ප්‍රමුඛතම ලීසිං සේවා සැපයීමේ බැංකුවක් වන හැටන් නැෂනල් බැංකුව, වසර ගණනාවක් පුරා මෙම ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සේවාවේ නිරතවීම තුළින් ඉහළ කීර්තියක් මෙන්ම විශ්වාසයක් දිනාගැනීමට සමත්ව ඇත. මෙහි ප්‍රතිඵලයක් විදිහට මෙම බැංකුව අද වන විට දේශීය මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද කීර්තියක් දරණ බ්‍රවුන්ස්, ඩීමෝ, හේලිස් වැනි සමාගම් රැසක් සමග ගිවිසුම ගත වීම තුළින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ වාහන සහ උපකරණ මිලදී ගැනීම්වලදී ගනුදෙනුකරුවන් හට ඉහළ ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමේ අවස්ථාව ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ලීසිං ප්‍රධානි කේ. සී. සුසිත් පෙරේරා මහතා ප්‍රකාශ කර සිටියේ, ''අද වනවිට කෘෂිකර්මාන්තයේ යෙදෙන තරුණ පරපුර නවීන තාක්ෂණය භාවිත කිරීමට වැඩි උනන්දුවක් දක්වනවා. මේකට පිලියමක් විදිහට අපි පවතින පොලී අනුපාත යටතේම ඔවුන්ට මේ පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව ලබාදීමට ඉදිරිපත් වී සිටිනවා. එයින් දේශීය කෘෂිකර්මාන්තය ශක්තිමත් කිරීම වගේම අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම අපේ මූලිකම අපේක්ෂාවයි.''

### HNB Prestige Prime Credit Card

HNB ලිසිං සේවාව සමඟ එක්වෙන ගනුදෙනුකාරහවතුන් වෙනුවෙන් නව ප්‍රතිලාභ රැසක් ලබාදීම වෙනුවෙන් මෙම HNB Prestige Prime Credit Card පත හඳුන්වා දී ඇත. හැටන් නැෂනල් බැංකුව සහ ඔටෝ මොබයිල් ක්ෂේත්‍රයේ ප්‍රකට සමාගම් රැසක් අත්සන් කර ඇති ගිවිසුම්වලට අනුව ගනුදෙනුකරුවන් හට වාහන කොටස් මිලදී ගැනීම, වාහන සේවා වාර සේවා (Vehicle Services) වැනි අවස්ථා සඳහා ආකර්ෂණීය වට්ටම් හිමිකර ගැනීමේ අවස්ථාව ලබා දී ඇත.

### ඔබට පණිවුඩයක්

''අද වෙනකොට පොලී අනුපාතය අඩුවෙමින් පවතින තත්වයක් තුළ ලීසිං පහසුකම් ලබා ගැනීමට බොහෝ අයගේ වැඩි නැඹුරුතාවයක් තිබෙනවා. මේ නිසා ලීසිං ක්ෂේත්‍රයේ නව පිබිදීමක් ඇතිවෙලා තිබෙනවා. මෙවැනි තත්වයක් ඇතිවීම සම්බන්ධයෙන් බැංකුවක් විදිහට අපි විශාල කාර්යයක් සිදුකර තිබීම ගැන අපිට තිබෙන්නේ නිහතමානි සතුටක්. ඒ වගේම HNB ලීසිං සේවාව සමඟ එක්වෙන අයට මට කියන්න තිබෙන්නේ, ඔබ වඩා විනිවිද බවින් සහ අවංකව හැටන් නැෂනල් බැංකුව සමග කටයුතු කිරීමෙන් විශාල ප්‍රතිලාභ සහ පහසුකම් රැසක් හිමිකර ගැනීමේ අවස්ථාව තිබෙන බවයි. අපි නිතරම උත්සහ කරන්නේ අපේ ගනුදෙනුකරුවන් සමග දිගුකාලීන සම්බන්ධතාවයක් ගොඩනගා ගන්නයි. එතනදී විශ්වාසය වැදගත් වෙනවා. විශ්වාසය තුළින් ඇතිවන අවබෝධය ඔබට ඔබේ ව්‍යාපාරික සිහින වෙත යාමට මූලික අඩිතාලම සපයනවා. ඒ නිසා බැංකුවක් විදිහට අපි ඔබට සේවය සැලසීමට, ඔබේ ගැටලුවලට සවන්වදීමට වගේම ඒ සම්බන්ධයෙන් නම්‍යශීලිව කටයුතු කරන්නත් සූදානම්. මේ නිසා ඔබේ ලීසිං සම්බන්ධ ගැටලු අප සමග කතා කර එයට සාර්ථක විසඳුම් ලබා ගැනීමෙන් විශ්වසනීය සම්බන්ධතාවයක් ගොඩනගා ගන්න යොමුවන්න.''

සටහන : පාලිත අබේලාල්

**2010 ජූලි මස ඉන්දියානු ක්‍රිකට් කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණියේ දීර්ඝ තරඟ සංචාරයක් වෙනුවෙනි. මුලින් ටෙස්ට් තරඟාවලිය ආරම්භ වූ අතර ඔවුන්ගේ කණ්ඩායමට විරේන්දර් ශෙවාග්, සචින් තෙන්ඩුල්කාර්, රාහුල් ඩ්‍රාවිඩ්, යුවරාජ් සිං, හර්බජාං සිං මෙන්ම ඉෂාන්ත් ශර්මා වැනි එවකට නම් දැරූ ප්‍රබල ක්‍රීඩකයින් රැසක්ම ඇතුළත් විය. එනිසා කවුරුත් හිතුවේ ඉන්දීය කණ්ඩායම ටෙස්ට් තරඟාවලිය පහසුවෙන්ම ජයග්‍රහණය කරනු ඇති බවයි. එහෙත් ගාල්ලේ පැවති පළවැනි ටෙස්ට් තරඟයෙන්ම ශ්‍රී ලංකාවට කඩුලු දහයක අතිවිශිෂ්ට ජයග්‍රහණයක් හිමිවිය. එහිදී ආරම්භක පිතිකරු තරංග පරණවිතාන මුල් ඉනිමේදී ලකුණු 111ක් සහ දෙවැනි ඉනිමේදී නොදැවී ලකුණු 23ක් ලබාගත්තේ එකී ජයග්‍රහණයට මග සකසමිනි. ඉතින් එවැනි ජයග්‍රහණ රැසක් වෙනුවෙන් පිත්තෙන් දායක වූ තරංග පරණවිතාන ගැන මේ කතාබහ ඔහුගේ ආදරණීය බිරිඳ වන තිලිනි පරණවිතාන සමගිනි.**



# වෙඩින් එකට මාස තුනක් තියෙද්දි එයාගේ පපුවට වෙඩි වැදුනා

## තරංග පරණවිතානගේ බිරිඳ තිලිනි පරණවිතාන

**තරංග කෑගල්ලේ. තිලිනි ගාල්ලේ. දෙන්නා මුණගැහුනේ කොහොමද?**

2004 අවුරුද්දේ මාර්තුවල මං කොළඹ පෞද්ගලික බැංකුවක ඉන්ටවිව් එකකට ගියා. තරංගත් ඒකට ඇවිල්ලා හිටියා. එතැනදී තමයි මුලින්ම මට එයාව මුණගැහුනේ.

***ඒ හමුවීම යාළුකමට පෙරලුනු හැටි ගැන කිව්වොත්?**

එදා ඉන්ටවිව් එකට 26ක් ඇවිත් හිටියා. ඉන්ටවිව් එක පාස්වුණේ ඒකෙන් හතරදෙනයි. ඒ හතර ඇතුලේ අපි දෙන්නත් හිටියා. අපිට ජොබ් එක ලැබුණා. හැබැයි අපි අලුත් හින්ද බැංකුවේ වෙන කවුරුත් අඳුරන්නේ නෑනේ. ඉතින් අපි දෙන්නා යාළුවෝ වුණා.

**තරංගට ඒ යාළුකම ආදරේකට හරවගන්න එච්චර අමාරුවුණේ නැතිලු නේද?**

(සිනාසෙමින්) ඒක නම් ඇත්ත. මුණගැහිලා මාස හතරකින් වගේ අපි ආදරවන්තයෝ වුණා. 2004 ජූලිවල තමයි අපි ආදරේ කරන්න පටන්ගත්තේ.

**තරංගට ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන්න අවස්ථාව ලැබුණේ ආදරේ කරන කාලෙදීමයි නේද?**

ඔව් 2009 පෙබරවාරි මාසේ තිබුණු පාකිස්තානු සංචාරය වෙනුවෙන් එයාට ජාතික කණ්ඩායමට කතා කළා. ඒ ටෙස්ට් තරඟාවලියට.

**හැබැයි ඔහුගේ මංගල තරඟ සංචාරය අන්තිමේ අමතක නොවෙන සංචාරයක් වුණා නේද?**

ඒ තරඟාවලිය අතරතුරේ තමයි ශ්‍රී ලංකා කණ්ඩායමට ලාහෝර් ත්‍රස්ත ප්‍රහාරය එල්ලවුණේ. දවස කිව්වොත් 2009 මාර්තු 03 වැනිදා. එදා තරංගගේ පපුවටත් වෙඩි වැදිලා තිබුණා. ජීවිතේ බේරිලා තිබුණෙත් අනූනවයෙන්. ඒ වෙනකොට අපේ විවාහයට තිබුණේ හරියටම මාස තුනයි.

**ඒ ආරංචිය ලැබෙද්දී තිලිනිට මොකද හිතුණේ?**

එදා මං ඔෆිස් එකේ වැඩ කරන ගමන් හිටියේ. එකපාරට බොස් ඇවිත් තමයි ආරංචිය කිව්වේ. වෙඩි වැදුනු ක්‍රීඩකයෝ අතරේ තරංගගේ නමත් තියෙනවා කිව්වා. ඒක ඇහුවා විතරයි මගේ මුළු ඇඟම සීතල වෙලා ගියා. මොකක්ද කරන්න ඕනෙ කියලා හිතාගන්න බැරිවුණා. පස්සේ මං තරංගගේ ගෙදරට කතා කරලා ඇහුවා. ඒ වෙනකොට එයාලත් හරියට විස්තරයක් දැනගෙන හිටියේ නෑ. ඊටපස්සේ එයාගේ අයියා කෙනෙක්ට කතා කළා. එයා කිව්වා ඒක ඇත්ත කියලා. ඒ වෙලාවේ ඉඳන් තරංගව දකිනකල් ඉවසිල්ලක් තිබුණේ නෑ. කොහොමහරි එයාලා එක්ක ආවට පස්සේ එයාර්පෝට් එකේදී තරංගව දැක්කම තමයි මගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ.

**හැබැයි විවාහයට වෙඩි වැදිච්චි එක බාධාවක් වුණේ නෑ නේද?**

දෙවියන්ගේ පිහිටෙන් එයාට ඉක්මනට සුව වුණා. ඉතින් දින දගෙන හිටපු දවසේම අපිට විවාහවෙන්න පුළුවන්කම ලැබුණා. 2009 ජූනි 05 වැනිදා තමයි අපි දෙන්නා විවාහ වුණේ.

**දැන් තරංග එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

මේ අවුරුද්දට අපි විවාහවෙලා අවුරුදු 14ක්. දැන් අපිට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. පුතාලා දෙන්නයි දුවයි. ලොකු පුතාට වයස 13යි. දුවට 9යි. පොඩි පුතාට 8යි. අපි පස්දෙනා සතුටින් ඉන්නවා. ලොක්කා නම් තාත්තගේ පාරේ යයි කියලා හිතෙනවා. මොකද එයත් දැන් ක්‍රිකට් ක්‍රීඩා කරනවා.

**තරංග ක්‍රීඩා කරපු තරඟ අතරින් අමතක නොවන තරඟයක් තියෙනවද?**

එයා පළවැනි ශතකය ගහපු තරඟය කවදාවත් අමතක වෙන්නේ නෑ. ඒ තරඟය තිබුණේ ඉන්දියාව එක්ක. ඒක අමතක නොවෙන්න හේතු කීපයක් තියෙනවා. පළවැනි එක ඒක මුරලි අයියා ක්‍රීඩා කරපු අන්තිම ටෙස්ට් තරඟය. එතැනින් ගියාම ඒක තරංගගේ මංගල ශතකය ගහපු තරඟය. අනෙක තමා ඒ තරඟය තිබුණේ ගාල්ලේ. ගාල්ල කියන්නේ අපේ ගමනේ. ඉතින් ඔන්න ඔය කියපු දේවල් එක්ක මට ඒ තරඟය අමතක වෙන්නේ නෑ.

**තරංග ක්‍රිකට් ක්‍රීඩකයෙක් වෙන්න ලොකු කැපකිරීමක් කළාලු නේද?**

අනේ ඔව්. එයාගේ ගම කෑගල්ලේ ගලිගමුව. ඒ වගේ පැත්තකින් ජාතික කණ්ඩායමට ක්‍රීඩකයෙක් ඇවිල්ලම නෑ. ඉතින් තරංගට ජාතික කණ්ඩායම දක්වා යන්න ලොකු කට්ටක් කන්න වුණා. ඒ අතරේ එකපාරක් එයා මානසික අතින් බිංදුවට වැටෙන සිදුවීමකුත් වුණා. ඒ එයාගේ දෙවැනි අයියා යුද්ධ කාලේ බෝම්බ ප්‍රහාරයට අහුවෙලා නැතිවුණු එක. ඒ සිද්ධියත් එක්ක තරංග සෑහෙන්න මානසිකව වැටුණා.

**කෑගල්ලේ මිනිස්සුන්ට තරංග වීරයෙක් කියන්නේ ඇත්තද?**

අම්මෝ ඔව්. එයා ජාතික කණ්ඩායමට තේරුණු වෙලාවේ එයාගේ ලොකු බැනර් කෑගල්ල පුරා ගහලා තිබුණා. අදටත් තරංග ගමේ එනවා කිව්වම ගොඩාක් අය එනකල් මගබලාගෙන ඉන්නවා. ඒ තරම් කෑගල්ලේ අය එයාට ආදරෙයි.

***තිලිනිට ක්‍රිකට් ගහන්න බැරිද?**

(සිනාසෙමින්) අනේ ක්‍රිකට් ගහන්න නම් බෑ. ඒත් මට හොඳට බැඩ්මින්ටන් ගහන්න පුළුවන්.

**එයා ක්‍රිකට් පිටියේ වාසනාවයි අවාසනාවයි දෙකම තිබුණු ක්‍රීඩකයෙක් නේද?**

ඒක ඇත්ත. ලොකුම වාසනාව එයාට සංගා, මහේල, ඩිල්ෂාන්, මුරලි, මාලිංග වගේ හැම ක්‍රීඩකයෙක් එක්කම ක්‍රීඩා කරන්න ලැබුණා. ඒත් අවාසනාව තමයි එයාව එක්දින තරඟවලට කැඳෙව්වේ නැති එක. මං හිතන්නේ අදටත් එයා ඒ ගැන පසුතැවෙනවා.

**තරංගට රහට උයන්න පුළුවන්ලු. ඒත් ඒක පෙන්නන්නේ නැලු. කතාව ඇත්තද?**

ඔව් එයාට හොඳට උයන්න පුළුවන්. ඒත් උයන්න පුළුවන් කියලා පෙන්නන්නේ නෑ. එහෙම පෙන්නගෙන ආවොත් හැමදාම උයන්න වෙයි කියලා හිතෙනවා ඇති.

**එයා ක්‍රිකට් නොගැහුවා නම් අද මොන වගේ රැකියාවක් කරයිද?**

අනිවාර්යයෙන්ම බැංකු ක්ෂේත්‍රයේ රැකියාවක් තමයි.

**එයාගේ දෙවැනි අයියා යුද්ධෙ කාලේ බෝම්බෙකට අහුවෙලා නැතිවුණා. ඒ සිද්ධියත් එක්ක තරංග සෑහෙන්න මානසිකව වැටුණා**



**තරංග පරණවිතානගේ ආදරණීය බිරිඳ විදියට තිලිනිට තියෙන්නේ මොන වගේ ආඩම්බරයක්ද?**

ඇත්තටම තරංගගේ බිරිඳ වෙන්න ලැබුණු එක ගැන මට නිහතමානී ආඩම්බරයක් තියෙනවා. මොකද එයා මුළු රටක්ම ආදරේ කරපු ක්‍රීඩකයෙක්. ඒ විදියට ආදරේ ලබන්නත් වාසනාව තියෙන්න ඕනේ. ඒ අතින් ඔහු හරිම වාසනාවන්තයි. ඉතින් අදටත් මට එයා ගැන පුදුම ආඩම්බරයක් දැනෙන්නේ.

■ රුවන් එස්. සෙනවිරත්න

දැන්වීමකි

# කාන්තාවක් විදිහට ස්වාධීනව ගොඩනැගෙන්න මට ශක්තියක් වුණේ යූනියන් ඇෂුවරන්ස් සමාගම...

සුන්දරත්වය සහ ධෛර්යසම්පන්න බව කාන්තාවන් සමග බැඳී ඇති ගුණාංග දෙකකි. සිය ජීවිතය වගේම අන්‍යයන්ගේ ජීවිත ජයග්‍රහණය කරමින් රක්ෂණ ක්ෂේත්‍රයේ දිග්විජය කළ කතුන් සඳහා යූනියන් ඇෂුවරන්ස් සමාගම සුවිශේෂ වූ ස්ථානයකි. මේ එවන් දිරිය කාන්තාවකගේ හඬයි. ඇය මාතලේ යූනියන් ඇෂුවරන්ස් ශාඛාවේ පුද්ගලික මූල්‍ය කළමනාකාර චම්පා සිරිවර්ධනයි.

**"යූනියන් ඇෂුවරන්ස් කියන්නේ කාන්තාවන්ට රැකියාවක් කිරීමට සුදුසුම ස්ථානයක් වගේම දක්ෂතා තුළින් වෘත්තිය ක්ෂේත්‍රයේ ඉහළටම යාමට හැකි ආයතනයක්."**

### ඔබ රක්ෂණ වෘත්තියට යොමුවන්නේ කොහොමද?

මම රජයේ රැකියාවක් කරපු කෙනෙක්. 2008 වසර වගේ යුද්දෙ උණුසුම් ම කාලෙ උතුරු මැද පළාත තුළ රැකියාව කිරීම දුෂ්කර නිසා හදිසියේම රැකියාවෙන් අස්වෙන්න තීරණය කරනවා. ඉන් පසුව 2015 වෙනකන් මම කිසිම රැකියාවක් නොකර නිවසට වෙලා හිටියා. මම රක්ෂණ ක්ෂේත්‍රයට යොමුවන්නේ එවකට යූනියන් ඇෂුවරන්ස් සමාගමේ කණ්ඩායම් කළමනාකාර හර්ෂ විජේබණ්ඩාර මහතාගේ බලකිරීම නිසයි. එතුමා රක්ෂණය සම්බන්ධයෙන් මගේ හිතේ තිබුණු සෘණාත්මක ආකල්ප වෙනස් කිරීමට සමත් වෙනවා. මේ හේතුව නිසාම 2015 වසරෙ අගභාගයේ දී විතර මම යූනියන් ඇෂුවරන්ස් සමාගම සමග සම්බන්ධ වෙනවා.

### රක්ෂණය සම්බන්ධයෙන් ඔබේ අදහස වෙනස් වෙන්නේ කොහොමද?

මම යූනියන් ඇෂුවරන්ස් සමාගමත් එක්ක සම්බන්ධ වෙන්න ප්‍රථමයෙන් රක්ෂණය කියන්නේ අපිට අත්‍යවශ්‍ය දෙයක් නෙවෙයි කියන අදහසින් තමයි හිටියේ. මේ හින්දම මගේ සහෝදරියන්ට පවා මම කිව්වේ ''ඔයාල එයාලට අහුවෙලා ඉන්නේ'' කියල. නමුත් අද මට තේරෙනවා රක්ෂණයේ තියෙන වැදගත්කම. ඒකෙන් මොනතරම් ප්‍රතිලාභ ලබාගැනීමට අපට පුළුවන්ද කියල. මම මගේ වෘත්තිය තුළින් කරන්නෙත් රක්ෂණයේ තියෙන වැදගත්කම සහ ඒ පණිවුඩය සමාජය වෙත ගෙන යන එක. රක්ෂණය සම්බන්ධයෙන් මගේ අවබෝධය පුළුල් කළේ එවකට මාතලේ ප්‍රාදේශීය කළමනාකාර, වර්තමානයේ මධ්‍ය පළාත් කලාපීය කළමනාකාර රංජිත් රාමනායක මහතා. එතුමන් රක්ෂණයේ සැබෑ අර්ථය සහ ඒක අපේ අනාගත ජීවිතය සැලසුම් කිරීමට බලපාන ආකාරය පැහැදිලි කරලා දුන්නා. ඒ වගේම මගේ දක්ෂතා හඳුනාගෙන අද මගේ සාර්ථකත්වයට අඩිතාලම දැමීමට විශාල කාර්යභාරයක් සිදුකලා. ඒ වගේම තමයි දැනට විදේශගතව සිටින, එවකට ප්‍රාදේශීය කළමනාකරු විදිහට සේවය කළ සමුදු විජේසිංහ මහතා. මේ අයගේ මගපෙන්වීම ඔස්සේ රක්ෂණයේ වැදගත්කම සාර්ථකව සමාජයට ගෙන යාමට වගේම බොහෝ දෙනෙකුගේ ජීවිත වෙනස් කිරීමට මට හැකියාව ලැබුණා.

### කාන්තාවක් විදිහට ඔබ අත්විඳි වෘත්තිය අභියෝග ගැන කතා කළොත්?

වෘත්තියක් කියන්නෙම අභියෝගයක්. මම රක්ෂණ වෘත්තියට යොමුවීම ම මම මටම කරපු අභියෝගයක්. අද වෙනකොට වසර හතක වගේ කෙටි කාලයක් තුළ මම රක්ෂණ වෘත්තිය ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණ රැසක් හිමිකර ගනිමින් සාර්ථක ගමනක් ඒමට හැකිවෙලා තිබෙනවා. ඒ ගමනේ දී කාන්තාවක් විදිහට මම මුහුණදුන් අභියෝග සාර්ථක ආකාරයෙන් ජග්‍රහණය කිරීමට මට පන්නරය ලබා දුන්නේ යූනියන් ඇෂුවරන්ස් සමාගමයි. එතනදී මට ලැබුණු පුහුණුව වගේම මගපෙන්වීම, කණ්ඩායමේ සහයෝගය මට විශාල ශක්තියක් වුණා. ඒ වගේම කැපවීම, සැලසුම් සහගතවීම වගේම සෑම කාර්යයක්ම නියමිත කාලයට පෙර අවසන් කිරීම තුළින් මට සාර්ථක ආකාරයෙන් අභියෝග ජයගැනීමට වගේම සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීමටත් හේතුවුණා.

### රක්ෂණ වෘත්තියට යොමුවීම සම්බන්ධයෙන් අද ඔබේ අදහස මොකද්ද?

මම මගේ ජීවිතයේ ගත්ත ඉතාමත් වැදගත්ම වගේම සාර්ථකම තීරණය යූනියන් ඇෂුවරන්ස් සමාගමෙන් රක්ෂණ වෘත්තියට යොමුවීමට තීරණය කිරීම කියන සතුට අද මට තිබෙනවා. මේක ඇත්තටම වෘත්තියක්ම නෙවේ. මේක සමාජ සත්කාර්යයක්. ඒ වගේම අයෝජන කාර්යයක්. එක වෙලාවක මම වෘත්තිකයෙක් වෙනවා වගේම තවත් විටෙක මම ව්‍යවසායකයෙකුත් වෙනවා. මොකද මගේ ඉපැයීම තීරණය කරන්නේ මම. රක්ෂණ අලෙවි නියෝජිතවරයෙක් විදිහට මට මගේ දෛනික කාර්යයන් මට ගැළපෙන ආකාරයෙන් සැලසුම් කිරීමේ හැකියාව තිබෙනවා. මේ නිසා මට මගේ පෞද්ගලික ජීවිතය වගේම වෘත්තිය ජීවිතයත් සාර්ථක ආකාරයෙන් සැලසුම් කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වගේම සීමාවකින් තොරව ඉපැයීමේ අවස්ථාව තිබීම තුළින් මගේ ඉලක්කවලට ඉතා වේගයෙන් ගමන් කිරීමේ හැකියාව මට තිබෙනවා. මේ නිසා සමහර මාසවලදී මාසයකට රු. මිලියනය ඉක්මවූ ආදායමක් පවා හිමිකර ගැනීමේ අවස්ථාව උදාවෙලා තිබෙනවා. ඒ වගේම රක්ෂණ වෘත්තිකයෙක් විදිහට මම අද ලබන පහසුකම්, වරප්‍රසාද වගේම සමාජ පිළිගැනීම රජයේ සේවකයෙකු විදිහට මට කිසිම වෙලාවක අත්කර ගැනීමට ලැබෙන්නේ නැහැ.

### ඔබේ සාර්ථකත්වයට යූනියන් ඇෂුවරන්ස් සමාගමෙන් ලැබුණේ මොන වගේ සහයෝගයක්ද?

අපේ හැකියාවන් මැනවින් හඳුනාගෙන, අපේ ඉලක්ක වෙත අපව මෙහෙයවීමේ හැකියාව යූනියන් ඇෂුවරන්ස් සමාගමේ කාර්යමණ්ඩලයට තිබෙනවා. එතැනදී අපිට ලබාදෙන සාර්ථක පුහුණුව අපිට වෘත්තිය කාර්යයන් වගේම පෞද්ගලික ජීවිතය පවා සාර්ථක කර ගැනීමට හේතුවෙලා තිබෙනවා. විශේෂයෙන් අපේ ගනුදෙනුකරුවන්ගේ සැබෑ අවශ්‍යතා හඳුනා ගැනීම, ඔවුන්ට ඒ සඳහා සාර්ථක සැලසුම් ඉදිරිපත් කිරීම වගේම කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් පරිපූර්ණ දැනුමක් ලබාදීම තුළින් අපට සාර්ථක සේවාවක නිරතවීමේ හැකියාව ලබා දී තිබෙනවා. ඒ වගේම ආයතනයක් විදිහට අපගේ හැකියාවන් සහ දක්ෂතාවන් නිරන්තරව ඇගැයීම වගේම ඒ සම්බන්ධයෙන් ප්‍රචාරණයන් පවා සිදුකිරීම අපේ වෘත්තිය කාර්යයන් සාර්ථක ආකාරයෙන් කිරීමටත් අපට අගයක් එක්කරදීමටත් සමත්වෙලා තිබෙනවා.

### ඔබ ලැබූ ජයග්‍රහණ සම්බන්ධයෙන් කතාකළොත්?

මට ලැබුණු සහයෝගයත් එක්ක සමාගමට සම්බන්ධවෙලා අවුරුද්දක වගේ කාලයක් ඇතුළත යූනියන් ඇෂුවරන්ස් සමාගමේ වාර්ෂික සම්මාන ප්‍රදානෝත්සවයේ දී ප්ලැටිනම් සම්මානය දිනා ගැනීමට හැකිවුණා. ඉන්දුනීසියාවේ දී පවත්වපු ඒ සම්මාන උළෙල මගේ පළවෙනි විදේශීය සංචාරයත් වුණා. මේ ලබපු ශක්තිය තුළින් මට 2021 සහ 2022 වසරවලදී රක්ෂණ අලෙවි නියෝජිතවරයකුට ජාත්‍යන්තරව ලැබිය හැකි ඉහළම සම්මානයක් වෙන MDRT සම්මාන වගේම Business Championship සම්මානය පිටපිට දෙවතාවක් හිමිකරගැනීමට හැකිවෙනවා.

### ඔබ කාන්තාවක් විදිහට ගෙදරදොර වැඩ කටයුතුත් එකක් වෘත්තිය කාර්යයන් කරගන්නේ කොහොමද?

කාන්තාවකට ගෙදරදොර වැඩ කටයුතුත් එකක් වෘත්තියක් කරගන්නවා නම් ඒකට සුදුසුම වෘත්තිය තමයි රක්ෂණ වෘත්තිය. එතනදී කාලය කළමනාකරණය වගේම මැනවින් සැලසුම් සහගත වීම වැදගත් වෙනවා. කාන්තාවක් විදිහට මම මගේ වෘත්තිය කාර්යයන් උදේ 8 සිට සවස 4 දක්වා කාලය තුළ අවසන් කිරීමට සැලසුම සකසා ගන්නවා. ඒ වගේම මට දිනපතා කාර්යාලයට යාම අවශ්‍ය නොවීම වගේම මට නිදහස් වෙලාවට වැඩ කටයුතු කිරීමේ අවස්ථාව තිබීම නිසා සාර්ථකව වෘත්තිය කටයුතුත් කිරීමේ හැකියාව ලැබෙනවා. ඒ වගේම යූනියන් ඇෂුවරන්ස් සමාගම තුළ වෘත්තිය වශයෙන් ඉදිරියට යාමට තිබෙන පසුබිම කාන්තාවන් විදිහට අපේ ශක්තියට නව අගයක් ලබා දෙනවා. මේ නිසා මම සියලුම කාන්තාවන්ගෙන් යූනියන් ඇෂුවරන්ස් සමග අත්වැල් බැඳගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

### රක්ෂණ වෘත්තිය සමඟ සම්බන්ධ වී ජීවිතය ජයගැනීමට කැමති කාන්තාවන්ට ඔබට දීමට ඇති උපදේශය කුමක්ද?

ඔබ රක්ෂණ වෘත්තියට යොමුවෙනවා නම් ඒකට සුදුසුම තැන තමයි යූනියන් ඇෂුවරන්ස් සමාගම. කාන්තාවක් විදිහට ඔබට අවශ්‍ය මගපෙන්වීම නිවැරදිව මේ ස්ථානයෙන් ලබා දෙනවා වගේම ඔබව වෘත්තිකයෙන් විදිහට සංවර්ධනය කිරීමත් සිදුකරනවා. ඒ වගේම ඔබට ඔබගේ ජීවිතයේ සියලුම ඉලක්ක ජයග්‍රහණය කිරීමට අවශ්‍ය සහාය වගේම පසුබිමත් මේ වෘත්තිය තුළින් නිර්මාණය කර ගැනීමේ හැකියාව තිබෙනවා. මෙතැනදී ඔබගේ කැපවීම, අධිෂ්ඨානය වගේම සැලසුම්සහගතව කටයුතු කිරීම ඉතාම වැදගත් වෙනවා. විශේෂයෙන් වෘත්තිය තුළ ඔබ කළයුතු සහ නොකළයුතු දේවල් සම්බන්ධයෙන් ඔබේ අවබෝධය වැදගත් වෙනවා. ඔබගේ සාර්ථකත්වය පවතින්නේ ඔබේ හැසිරීම මතයි. මේ නිසා වෘත්තිය ගරුත්වය සහ ආයතනයේ ගරුත්වය ආරක්ෂා කරගනිමින් කටයුතු කිරීමෙන් ඔබට සාර්ථක වෘත්තිය ගමනක නිරතවීමේ හැකියාව තිබෙනවා.

### ඔබේ අනාගත බලාපොරොත්තු මොනවාද?

මේ වෙනකොට මම යූනියන් ඇෂුවරන්ස් සමාගම තුළ සියලුම ජයග්‍රහණයන් හිමිකරගෙන තිබෙනවා. ඒ වගේම MDRT දෙවරක් හිමිකරගත්තා. මගේ අනාගත බලාපොරොත්තුව තමයි අන්තර්ජාතික TOT (Top Of Table) සම්මාන හිමිකරගෙන ආයතනයට වගේම මගේ ප්‍රදේශයටත් කීර්තියක් අත්කර දීම.

**සටහන : පාලිත අබේලාල්**



යූනියන් ඇෂුවරන්ස් - මාතලේ ශාඛාව පුද්ගලික මූල්‍ය කළමනාකාර චම්පා සිරිවර්ධන

# කිරල කෙල්ලගේ කිරල ලේක්

දිල්කි ශෂිකලා සිල්වා

**"ගොඩක් අය පෝසත් වීම ගැන කතා කරනවා. හැබැයි ඒ අය පෝසත් වෙන්න මුකුත් කරන්නේ නැහැ."**

මේක පෝසත් තාත්තා සහ දුප්පත් තාත්තා (rich dad poor dad) කියන පොතෙන් උපුටාගත්තු කොටසක්. මේ පොත ලිව්වේ ඇමරිකානු ව්‍යාපාරික රොබට් ටී.කියෝසකි. රටවල් 109ක් පුරා මිලියන ගණනින් අලෙවි වෙච්ච මේ ව්‍යාපාරික පොත නිසා ජීවිතේ වෙනස් කරගත්තු උදවිය අනන්තයි. අපේ කතා නායිකාව දිල්කි ශෂිකලාත් ඒ ගොන්නෙන් අයෙක්.

**"ඕලෙවල් කරන කාලෙදි මම රිච් ඩැඩ් පුවර් ඩැඩ් පොත කියෙව්වා. කවදහරි මගේම කියලා දෙයක් කරනවා කියලා පොත කියෙව්වට පස්සේ මම හිතාගත්තා."**

වද ඇතිවෙච්ච සිතුවිල්ල නිසා තරුණ වයසින්ම ඇය අද සාර්ථක ව්‍යාපාරිකාවක් වෙලා. බණ්ඩාරගම බොල්ගොඩ තියෙන කිරල ලේක් වීව් එකේ හිමිකාරිය ඇය. මේ ලස්සන ෆොටෝ ලොකේෂන් එක දැන් ගොඩක්දෙනා අතරේ ප්‍රකටයි. ඒ ප්‍රසිද්ධිය නිසාම දිල්කිට දැන් ගොඩක් අය කියන්නේ 'කිරල කෙල්ල' කියලා. ඉතින් මහන්සියෙන් සාර්ථකත්වයට ආපු ගමන ගැන කතා කරන ගමන් 'ධරණී' කවරයට ඇගේ ඡායාරූප කිහිපයක් ගන්න අපි බණ්ඩාරගම ඇගේ ෆොටෝ ලොකේෂන් එකට ගියා.

**"මෙතන අක්කර දෙකහමාරක් තියෙනවා. කිසිම කෘත්‍රිම නිර්මාණයක් නැහැ. හැමදේම ස්වභාවිකයි."**

දිල්කිව මුණගැහෙන්න යන්න කලින් කිරල ලේක් එකේ ලස්සන ඡායාරූප කිහිපයක් අපි දැක්කා. එච්චරයේ තියෙනවා වගේම මේ තැන ඇත්තටම මනරම්. කතාවෙන් කතාව දිල්කි අපිව ලේක් එක ඇතුළටම එක්කරගෙන ගියා. වත්ත මැදට වෙන්න ටිකක් ලොකු විලක් තිබුණා. විල අවට තිබුණේ ලස්සන මල් පිරිච්ච පරිසරයක්.

"මේ මල් පාර අයිනේ තිබිලයි ගෙනැල්ලා හිටෙව්වේ. කෑගල්ල පැත්තේ අය මේ මලට කියන්නේ 'ලොක්කන් නට්ටන්' කියලලු."

පුස් නැටි වගේ දිගටි ලස්සන මල්යායකට අත් දික්කරලා දිල්කි අපිට කිව්වා. ලේක් එකේ ඇවිදින ගමන්ම මම දිල්කි එක්ක කතාවට බැස්සා.

**අර පොත කියෙව්වට පස්සේ ව්‍යවසායිකාවක් වෙන්න ආසා හිතුණා කිව්වනේ. ඉතින් ඊටපස්සෙ?**

"මම ඉගෙනගත්තේ බණ්ඩාරගම ජාතික පාසලේ. සාමාන්‍ය පෙළ කරලා ඉවර වුණාට පස්සේ ව්‍යාපාරිකාවක් වෙන්න හිතාගෙනම වානිජ විෂයන් තෝරාගත්තා. මට ඉන්නේ අම්මයි, තාත්තයි විතරයි. කවදකහරි මගේම දෙයක් කරනවා කියන එක මම අම්මලාටත් කිව්වා. ඒ තීරණය ගැන එයාලත් ගොඩක් සතුටු වුණා."

ව්‍යාපාරයක් කරනවා කියන අදහස තිබුණාට කරන්න ඕන මොකක්ද කියන එක ගැන ඇයට ලොකු අදහසක් තිබුණේ නැතිලු.

"පස්සේ මම එක එක දේවල් ඉගෙනගන්න පටන්ගත්තා. රූපලාවණ්‍ය, තොරතුරු තාක්ෂණය, ග්‍රැෆික්, නැටුම් වගේ දේවල්. ඒ දේවලින් මගේම දෙයක් කරන්න පුළුවන් වෙයි කියන අදහස තිබුණා. ඒ නැතත් බැකප් එක්ක විදියට අපි විෂයන් කිහිපයක් ඉගෙනගන්න ඕනේ. එතකොට එකක් නැතත් තව එකක් තියෙනවනේ."

ඉගෙනගන්න දෙයක් කවදවත් අපතේ යන්නේ නැහැ කියලා කියද්දි විලට සේරුවෙකුයි, දියකාවෙකුයි ආවා.

**"අපේ අම්මයි තාත්තයි මල් පෝච්චි ව්‍යාපාරයක් කරනවා. වත්ත ලස්සනට තියාගන්න ඒ කාලේ ඉඳලම තාත්තා කැමතියි. තාත්තගේ වැඩේම වත්ත ලස්සන කරන එක. වත්ත මැද ඉස්සර පොඩි විලක් තිබුණා. තාත්තා පොඩි තාච්චියකුයි උදැල්ලකුයි අරන් ගිහින් අතින්ම හාරලා තමයි ඒ විල මේ ගාණට ලොකු කළේ. තාත්තට ඒ වැඩේට අවුරුදු 6ක් විතර ගියා. මේ විල පර්චස් 80ක් දක්වා විහිදිලා තියෙනවා."**

පර්චස් අසූවක විලක් තනි මනුස්සයෙක්ගේ අතින් හාරලා හදපු එක ඇත්තටම විශ්වකර්ම වැඩක්.

"භාතිය දිල්ෂාන් කියලා අපේ නෑදෑ වෙන අයියා කෙනෙක් ඉන්නවා. එයා ඡායාරූප ශිල්පියෙක්. මෙච්චර ලස්සන වත්තක් අපරාදේ නිකන් තියාගෙන ඉන්නේ, මේක ෆොටෝ ලොකේෂන් එකක් කරමු කියලා අයියා දවසක් කිව්වා. පස්සේ අම්මයි තාත්තයි මායි එකතු වෙලා ෆොටෝ ලොකේෂන් එකකට ගන්න පුළුවන් විදියට වත්ත හදන්න පටන්ගත්තා. වැඩ ඉවර වෙන්නත් කලින් අයියා ලොකේෂන් එකට ඇවිල්ලා ෆොටෝ ෂූට් එකක් කළා. පස්සේ හිතුවෙවත් නැති විදියට ඒ ෆොටෝ ටික ෆේස්බුක් එකේ වයිරල් වුණා. පස්සේ ඒක දැකලා තව තවත් කට්ටිය එන්න පටන්ගත්තා."

දිල්කිගේ ෆොටෝ ලොකේෂන් එකේ පළවැනි වැඩේ කළේ 2022.03.08 වැනිදලු. එද ඉඳලා වැල නොකැඩී පිරිස් මේ ලොකේෂන් එකට ෆොටෝ ගහන්න එනවලු. ප්‍රසිද්ධ නළු නිළියෝ පවා මෙතැන ෆොටෝෂූට් කරලා තියෙනවා.

"ගොඩක් අය ෂූට් කරන්නේ විලේ. වතුර ඔන්චිල්ලාවට කට්ටිය හරි කැමතියි. මේ ඔරු දෙකෙන් කට්ටියව එතනට ගිහින් දන්නේ මම. සමහර බ්‍රයිඩ්ලා එනවා උදව්වට කවුරුත් නෑ. එවෙලට එයාලට උදව් කරන්න මම යනවා. රූපලාවණ්‍ය වැඩත් දන්න නිසා වෙලාවකට ඒවා පවා කරලා දෙනවා. මගේ උදව් ඕන වුණත් නැතත් ෂූට් එක කරන තැන කොහොමත් මම ඉන්නවා."

සල්ලි අරන් ඕන දෙයක් කරගන්න කියලා අත පිහිදගන්නවට වඩා බාරගත්තු වැඩේ කැපවීමෙන් කරන එක ව්‍යාපාරයක සාර්ථකත්වයට හේතු වෙනවා කියන එකයි ඇය කිව්වේ.

**"ලොකේෂන් එක මේන්ටේන් කරන වැඩ සේරම කරන්නේ අම්මයි, තාත්තයි. ඒකට ඒ දෙන්නා පාන්දර 4.30ට විතර නැගිටිනවා. දවල් වෙද්දි ලොකේෂන් එකට ගොඩක් අව්වයි. මම අව්වේ වැඩ කරනවට නම් තාත්තා ටිකක් අකමැතියි. ඒත්ත එහෙම කියලා බැහැනේ. මම තොප්පියක් දගෙන හරි අව්වට බහිනවා. මේ ළඟදි දවසක් මට මරු වැඩක් වුණා. ළඟදි ඔරුව අරන් ලේක් එක මැදට යන්න යද්දි හුළං නිසා ඔරුව පෙරලුණා. අපේ ලේක් එක ගැඹුරු නැහැ. ඒ නිසා බයවෙන්න දෙයක් නැහැ. හැබැයි ඉතින් වැඩ කරද්දි ඔය වගේ දේවලටත් අපි මුහුණ දෙන්න වෙනවා."**

**එතකොට දිල්කිට 'කිරල කෙල්ල' කියන්නේ මොකද?**

"අපේ වත්තේ කිරල ගස් 200ක් විතර තියෙනවා. අවුරුදු 100 පරණ කිරල ගහකුත් මෙතැන තියෙනවා. කිරල ගස් නිසා තමයි අපි මේ ලොකේෂන් එකට කිරල ලේක් කියලා දැම්මේ. ඒ නිසාමදෝ දැන් ගොඩක් අය මට කිරල කෙල්ල කියලා කතා කරනවා. මමත් ඒ නමට හරි කැමතියි."

දිල්කි ඒ කතාව කිව්වේ තැන තැන තියෙන කිරල ගස් අපිට පෙන්වන ගමන්. දිල්කිට තවම අවුරුදු 25යිලු. ඒ තරම් වයසක් නැති වුනත් ඇය මේ වෙද්දි ඉතාම හොඳ ආදායමක් උපයන තරුණියක්.

**"වැඩ කරද්දි මට මහන්සි දැනෙන වෙලාවල් තියෙනවා. හැබැයි ඒ මහන්සි වෙන්නේ මම වෙනුවෙන්මයි කියලා දැනෙනකොට ඒ මහන්සිය නැතිවෙලා යනවා. මම තෝරගත්තු පාර ගැන අද අම්මටයි තාත්තටයිත් ගොඩක් සතුටුයි."**

**මනුස්සයෙක්ට ඉගෙනගන්න වයසක් නැහැ. කවදාවත් ඉගෙනගන්න එක නතර කරන්න එපා.**



**ඉගෙනගන්න දෙයක් කවදාවත් අපතේ යන්නේ නැහැ කියලා කියද්දි විලට සේරුවෙකුයි, දියකාවෙකුයි ආවා**



දිල්කිගේ තාත්තා අජිත් ප්‍රියන්ත සිල්වා. අම්මා නිල්මිනි කටුගම්පල. දිල්කිගේ හෙවනැල්ල ඒ දෙපල කියන එක ඇය නිතරෝම වගේ මතක් කළා.

“මම අනිත් අයටත් කියන්නේ රස්සාවක් කරන්න. ඒකට කමක් නැහැ. හැබැයි රැකියාවට විතරක් සීමාවෙන්න එපා. රැකියාවක් කරන අතරෙම හරි පුංචියට ස්වයං රැකියාවක් හරි කරන්න. මොකද තමන්ගෙම කියලා දෙයක ලාබයෙන් ලැබෙන ආත්මතෘප්තිය අනුන් යටතේ රැකියාවක් කරලා ලබාගන්න බැහැ.

කිරල කෙල්ල ඒ කතාව කිව්වේ ‘ධරණී’ කියවන අයට පණිවිඩයක් දෙන්න හිතාගෙනයි.

**“තව දෙයක්. මම මේ දවස්වල ෆොටෝ එඩිටින් ඉගෙනගන්නවා. මනුස්සයෙක්ට ඉගෙනගන්න වයසක් නැහැ. කවදාවත් ඉගෙනගන්න එක නතර කරන්න එපා. මොකද මොන දේ නැති වුණත් අන්තිමට ඉතිරි වෙන්නේ ඉගෙනගන්න දේවල් විතරයි.”**

දියුණු වෙන්න කැමති තරුණියන්ට දිල්කිගේ කතාව ආදර්ශයක්. ‘ධරණී’ කවරය සරසන්න අපි ඇයට ආරාධනා කළෙත් ඒකයි. කතාබහෙන් පස්සේ කිරල ලේක් ලොකේෂන් එක වටේම ලස්සන සිරි නරඹලා අපි බණ්ඩාරගමින් කොළඹ එන්න පිටත් වුණා..


**■ සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - සමන් අබේසිරිවර්ධන**

**හැඩගැන්වීම**

**හිරු බ්‍රයිඩ්ල්-බණ්ඩාරගම**

# අපි හිනාවෙනවට වඩා අඬ අඬා ඉන්නවනම් මිනිස්සු කැමතියි



“නිරූ... පිස්සුද ඕයි තමුසෙට? තනියම හිනාවෙන්නේ?” මෙවින්දගේ හඬින් මම උඩ ගිහින් බිම වැටුණා.

“ආ?” මම ඇහුවා.

“මම ඇහුවේ තනියමෙ හිනාවෙන්නේ ඔල්මාදෙද කියලා.” මෙවින්ද ආයෙමත් ඇහුවා.

“පෑන් කේක් කෑවද? ආ මේ තේ එක බොන්න.” මම මෙවින්දගේ අතට දුන්නේ උණු උණුවේ දුම් දන තේ එක.

මෙවින්ද මම දිහා බලාගෙන හිටියේ ඇස් ලොකු කරගෙන. එතැනින් එහාට ආයෙමත් වචනයක්වත් නොකියා මම මට හදාගත්තු තේ එක බොන්න පටන්ගත්තා.

“නිරූ...”

“හ්ම්ම්...”

එතකොටම තමයි එතැනට මගේ ලොකු නෑනා ආවේ.

“මමත් බලාගෙන අයියේ. ටික දවසක ඉඳන් මෙයා උඩ බලන් තනියම හිනාවෙනවා. මම ඒත් බැලුවා ෆෝන් එකක්වත් නැති ගෑනි මොනාට හිනාවෙනවද කියලා.” ඇය කියනවා මට ඇහුනා.

මට ඒක ඇහුනේ යන්තමට වගේ. නෑනා එහෙම කිව්වා මට දැනුණා. ඒත් ඒ වචන මගේ කණේ ගෑවී නොගෑවී ගියා මිස වෙනදා වගේ මගේ හිත පතුලේ ගිහින් නතර වුණේ නැහැ. ඉතින් මම හිනාවෙවීම මිදුලට බැස්සා. තේ කෝප්පයත් අරගෙන ඔන්චිල්ලාවේ වාඩිවුණ මම හිනාවෙවීම තේ බොන්න පටන්ගත්තා.

ඔයාලට නොපෙනෙන මට පෙනෙන ලෝකයක් තියෙනවා. ඒ බව මෙවින්දටවත්, මෙවින්දගේ නංගිටවත් කියලා පලක් නැහැ. එයාලා ඒක විශ්වාස කරන්නේ නැහැ. මේ මට විතරක් පේන ලෝකේ ගෑනු මිනිස්සු පිරිලා හිටියා. පොඩි ළමයි පිරිලා හිටියා. එයාලා හැමෝම හිටියේ හිනාවෙවී.

ඒ විතරක් නෙවෙයි එයාලා නිතරම මාවත් හිනැස්සුවා. එයාලා කියන හැම වචනයක් ගානෙම, එයාලා කරන හැමදෙයක් ගානෙම මට දැනෙන්නේ සතුටක්. ඉතින් මට හිනායන එක වැරදිද?

මෙවින්ද, එයාගේ නංගි කියන කතාවලට මට කවදාවත් සතුටක් දැනුණේ නැහැ. කවදාවත් හිනාගියේ නැහැ. කඳුළු ආවා විතරමයි.

“නිරූ, මොනවද අර ලොකු නංගි කියන්නේ? නිතරම පිස්සුවෙන් වගේ හිනාවෙනවා කියලා.” අර නොපෙනෙන ලෝකේ අවුරුදු 12ක දරුවෙක් එක්ක මම හුරතල් වෙවී හිනාවෙවී ඉද්දිමයි මෙවින්ද ආයෙමත් කඩන් පාත්වුණේ.

“ආ... තේ එක බීලා ඉවරද? කෝප්පේ තියන්න මම හෝදන්නම්.” මම මෙවින්දට කිව්වේ ඒ නොපෙනෙන දරුවාව අත්අරින්නේ නැතුව. මට දැනුණේ මම ලෝක දෙකක් අතර අතරමං වෙලා කියලා. මෙවින්ද ඉන්න ලෝකේ මට දැන් එපාවෙලා.

වැඩ, හිත් රිදවීම්, කොන් කිරීම්, කඳුළු පිරුණු ලෝකෙකට වඩා අර විහිලු තහළු පිරුණු, හිනාව පිරුණු ලෝකේ කොච්චර ලස්සනද?

“නිරූ තමුසෙගෙ ඔළුව හොඳ නැද්ද?” මෙවින්ද අහද්දී මම ඒ දරුවට යන්න ඇරලා මෙවින්ද ඉන්න ලෝකෙට සම්පූර්ණයෙන්ම ආවා.

“ඇයි?”

“ඇයි අහන්නේ? මොකක් ඇහුවත් තනියම හිනාවෙන්නේ?” මෙවින්ද මට සැර දැම්මා.

“මම ඉස්සර තනියම අඬද්දී ඔයා කවදාවත් ඇහුවේ නැහැනේ මම අඬන්නේ ඇයි කියලා. එතකොට කිව්වේ බොරුවට කිඹුල් කඳුළු හෙළනවා කියලනේ. ඉතින් මම තනියම හිනාවෙද්දී ඇයි අහන්නේ?” මම එහෙම ඇහුවේ ඇත්තටමයි.

මෙවින්දගේ මුහුණට පුදුමයක්, බයක් වගේ පෙනුමක් එනවා මට යන්තමට පෙනුණා. එතකොටම අර නොපෙනෙන ලෝකේ ඉන්න තරුණ කපල් එකක් මා දිහා බලලා ගොඩක් සතුටු හිතෙන කතන්දරයක් කියන්න ගත්තා. මෙවින්දගේ ලෝකෙන් සම්පූර්ණයෙන්ම මිදුණු මගේ හිත එයාලාගෙ ලෝකෙට ඇදිලා ගියා. ඊටපස්සේ මම හයියෙන් හිනාවුණා. කඳුළු එනකම්ම හිනාවුණා.

මෙවින්ද මගෙ හිනාව දිහා බලාගෙන හිටියද, පුදුම වුණාද, තරහ ගත්තද මට පෙනුණේ නැහැ. මොකද ඒක මට තවදුරටත් වැදගත් වුණේ නැහැ.

**■ සමාධි ඩයස්**



ඔබගේ සමීපතමයෙකුට හෝ ආදරය කරන කෙනෙකුට ඔහුගේ/ඇයගේ අති විශේෂ දිනයක තෑගි කිරීමට ඕනෑම ආකාරයක චිත්‍රයක් සඳහා කරුණාකර මාව සම්බන්ධ කරගන්න.
WhatsApp 0776308446 හෝ
ඊමේල් rienzie.christopher@gmail.com





**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදාගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යේෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. හෙතෙම නීතිය නවීකරණයට මෙන්ම නීතිය පිළිබඳ සරල අන්දමින් දැනුවත් කිරීමට සක්‍රියව දායක වන්නෙකි. නීති ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් උසුලන සිදුවීම් සම්බන්ධයෙන් ඔහු දක්වන අදහස් නීති ක්ෂේත්‍රයේ අයට පමණක් නොව, රටේ සාමාන්‍ය පුරවැසියන්ටද එකසේ වැදගත් වේ. මේ, එලෙස සැකසෙන ලිපි මාලාවක දහසයවැන්නයි.**

# සුරදූතිකාවගේ අණින් දෙදෙනකුට මිනී වළ කැපූ මැතිව් පීරිස්

"ඔබට කළ හැකි යමක් තිබිය යුතුමයි පියතුමනි. කරුණාකරලා මොනවාහරි කරන්න."

ජීවිතයත් මරණයත් අතර සටනක සිටින සිය සැමියා වෙනුවෙන් ඩැල්රීන්, මැතිව් පීරිස් පියතුමන්ගෙන් ඉල්ලුවාය. ඔහුගේ විස්මිත හැකියාව පිළිබඳ ඈ සිටියේ දැඩි භක්තියකිනි. විශ්වාසයකිනි. දේවගැතිවරයා පවසන ඕනෑම කරුණක් දෙවරක් නොසිතා පිළිගැනීමට තරම් ඇය ඔහුට අවනතව සිටියාය. සිහින් සිරුරින් යුතු ඩැල්රීන් දුටුවන් නෙත් සිත් ඇදගන්නා රූ සොබාවකින් යුතු වූවාය. දේවගැතිවරයා ඇගේ රූපයට ආසක්තව සිටියේය. ඈ කෙරෙහි වූ නොතිත් ආශාව, ප්‍රේමය හේතුවෙන් ඔහු දෙවියන්ට එරෙහිව ගියාද?

**"ප්‍රේමය කියන එක සිවුර දගෙන හිටියත්, ලෝගුව දගෙන හිටියත්, කෝට් එක දගෙන ඉන්න අපි කාට වුණත් අදාළයි. ඒ සනාතන සත්‍යය යටපත් කරන්න බෑ. අපි හිතනවා මේ කෙනා පරම පිවිතුරු චරිතයක් කියලා. කාන්තාව ගැනත් එහෙමයි. ඒත්, කොයි මොහොතේ කෙතරම් ක්ෂණයකින් ඒක වෙනස් වෙනවද කියලා කිසිම ශාස්ත්‍රෘවරයෙකුටවත් කියන්න බෑ."**

## විස්මිත බලය

සොයුරු සොයුරියන් හයදෙනෙකුගෙන් සමන්විත පවුලේ වැඩිමලා වූ මැතිව් ෆෙඩ්රික් ජෝර්ජ් පීරිස් පූජකයකු වූයේ අහම්බෙනි. හෙතෙම දරුණු අසනීපයකින් සුවය ලැබීය. පසුව ඔහු පැවසුවේ සිහිනයෙන් සුර දූතිකාවක තමා ඇමතූ බවයි. තමා සුවය ලැබුවේ දෙවියන් වහන්සේ නිසා යැයි කී ඔහු ජීවිතයේ ඉතිරි කාලයේදී දෙවියන් වෙනුවෙන් කටයුතු කිරීමට තීරණය කළේය. ඔහුට එංගලන්ත සභාවට අයත් පූජක වරය පිරිනැමුණේ 1954දීය. අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණි මැතිව් පීරිස් දේවගැතිවරයා ප්‍රාතිහාර්යමය සුව කිරීම් සහ මරණයට නියම වූ සිරකරුවන්ට අවසාන යාඥා මෙහෙය පැවැත්වීමට ප්‍රසිද්ධ විය. ඔහු බොරැල්ල ශාන්ත පාවුළු දෙව්මැදුරේ පාලකයාව සිටියේය. මැතිව් පීරිස් දේවගැතිවරයා විවාහ වී සිටියේ ඉයුනීස් මෙන්ඩිස් සමඟිනි. ඔවුන්ගේ දරුවෝ එංගලන්තයේ වාසය කළහ.

## දේවස්ථානයට ලේකම්වරියක්

සමාජයේ සැලකිය යුතු බලයක් ගොඩනගාගත් මැතිව් පීරිස් දේවගැතිවරයා අනුගමනය කළ බොහෝදෙනා සිටියහ. 'තෙරේසා' නම් තැනැත්තියද දැඩි ආගමික භක්තියකින් යුතුව ප්‍රූජකවරයා සමඟ කටයුතු කළාය. ඇගේ සොයුරිය වූ එවකට 33 හැවිරිදි වියේ පසු වූ ඩැල්රීන් ඉංග්‍රම් රූමතියකි. ඇයද සිය සොයුරියගේ මාර්ගයෙන් මැතිව් පීරිස් පූජකවරයා හඳුනාගත්තාය. ඩැල්රීන් විවාහකය. සැමියා මාධ්‍යවේදියකු වූ කඩවසම් රසල් ඉංග්‍රම් ය. වැඩි කලක් යාමට මත්තෙන් ඩැල්රීන් මැතිව් පීරිස් දේවගැතිවරයාගේ දැඩි බැතිමතියක වූවාය. පූජකවරයා පවසන ඕනෑම දෙයක් අවිවාදයෙන් පිළිගන්නා තරමට එය ප්‍රබල විය. එහෙත් ඒ සම්බන්ධය සමඟ යක්ෂයා ක්‍රියාත්මක වෙමින් සිටියේය. එය ඩැල්රීන් තබා ඇගේ සැමියාට හෝ වැටහුණේද යන්න සැක සහිතය. දේවගැතිවරයා ඩැල්රීන්ගේ පවුලේ අයට දේවස්ථානයේ පදිංචි වීමට ආරාධනා කළේය. ඩැල්රීන් රසල් ඉංග්‍රම් එයට එකඟ වූහ. දේවගැතිවරයාගේ ප්‍රේම දැලේ සිර වූ ඩැල්රීන් ඔහුගේ ලේකම්වරියද වූවාය.

## රසල්ගේ හදිසි රෝගය

මැතිව් - ඉයුනීස් යුවල මේ අතර කාලයේ නැවත එංගලන්තයට ගියහ. එහි සිටියදී පූජකවරයා පැවසුවේ තමා සමඟ සුර දූතිකාව නැවත කතා කළ බවයි. එම සංවාදය ලතින් බසින් වීමද විශේෂත්වයකි. ඔහු ප්‍රකාශ කළේ රසල් ඉංග්‍රම් අනතුරක බවත් ඔහු බේරාගැනීමට තමා ශ්‍රී ලංකාවට යායුතු බවත්ය. ඒ අනුව ඉයුනීස් එහි සිටියදීම 1978 අප්‍රේල් 25 වනදා ඔහු දිවයිනට පැමිණියේය. ඒ වනවිටද ඩැල්රීන්ගේ සැමියා වූ රසල් ඉංග්‍රම් සුවසේ පසු වූයේය. ඔහු උසැති සිරුරෙන් යුතු කඩවසම් නීරෝගී අයෙකි. ක්‍රීඩාශීලීය.

දේවගැතිවරයා මෙරටට පැමිණ කෙටි කලකින් රසල් හිටිහැටියේ රෝගී වූයේය. අධික නිදිමතකින් පසු වූ ඔහු දිනකට අමතර පැය කිහිපයක් නිදගැනීමට පුරුදු වූයේය. ඔහු බැලීමට පැමිණි දෙමාපියන්ට මැතිව් පීරිස් පූජකවරයා පැවසුවේ රසල්ගේ අග්න්‍යාශයේ රෝගයක් පවතින බව සහ ඊට සැත්කමක් කළ යුතු බවයි. වෛද්‍ය උපදෙස් ලබාගැනීමටද ඉඩ නොදුන් දේවගැතිවරයා පවුලේ වෛද්‍යවරයා නියම කළ බව පවසමින් රෝගියාට ඖෂධ ලබාදුන්නේය. පසුව අසාධ්‍ය තත්ත්වයට පත් වූ රසල් රෝහල්ගත කෙරිණ. ඔහුගේ රුධිරයේ සීනි මට්ටම අවම විය. ඔහු දැඩි අපහසුතාවකින් පසු වූ අතර සිරුර දහදියෙන් නෑවී ගියේය. වෛද්‍යවරු වහාම ඔහුට 'ඩෙක්ස්ට්‍රෝස්' ලබාදීමට නියෝග කළහ. රෝගියා බැලීමට ඩැල්රීන් සමඟ දේවගැතිවරයාද පැමිණියේය. රෝගියාට ආහාර ලබාදීමටද ඔවුහු කටයුතු කළහ. තමාට රෝගියා සුවකිරීමේ විස්මිත හැකියාවක් ඇතැයි කියමින් දේවගැතිවරයා රෝගියා අසල වැඩි වශයෙන් රැඳී සිටියේය. එපමණක්ද නොව, ඔහු ඇතැම් වෛද්‍ය ප්‍රතිකාරවලට විරෝධය පළකර තිබේ.




මැතිව් පීරිස්



ඩැල්රීන් ඉන්ග්‍රම



මැතිව් පීරිස් දේවගැතිවරයා පදිංචිව සිටි නිල නිවස



රසල් ඉන්ග්‍රම



එනිසාම දෝ ඔහු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ මතකයේ රැඳුණ චරිතයක් විය. ප්‍රතිකාරවලින් සුවය ලබා නිවසට ගියද නැවත අසනීප වූ රසල් යළි රෝහල්ගත කෙරිණ. ඔහුට වූ දේ ගැන කම්පා වූ ඩැල්රීන් අස්වැසූ දේවගැතිවරයා කීවේ දෙවියන්ගේ කැමැත්තට සියල්ල සිදුවන බවයි. දෙවියන්ගේ හෝ යක්ෂයාගේ කැමැත්ත මත 1978 අගෝස්තු මාසයේදී රසල් ජීවන සටනින් පැරදුණේය. මරණ පරීක්ෂණයේදී කියැවුණේ රුධිරයේ සීනි මට්ටම පහළ යන හයිපොග්ලයිසීමියා (Hypoglycemia) රෝගය මරණයට හේතුව බවයි. ඒ ගැන කිසිඳු සැකයක් මතු නොවුණු අතර මරණ කටයුතු දේවගැතිවරයාගේ මැදිහත් වීමෙන් සිදුවිය. රසල් මියයාමට පෙරම ඔහුගේ අවසන් කටයුතු කරන අයුරු මැතිව් පීරිස් දේවගැතිවරයා සහ ඩැල්රීන් සාකච්ඡා කළ බවටද පසුව තොරතුරු හෙළිවිය.

## ඉයුනීස්ගේ ඉරණම

රසල්ගේ මරණයෙන් පසු 1978 දෙසැම්බරයේ ඉයුනීස් පීරිස් ශ්‍රී ලංකාවට පැමිණියාය. ඒ, යහපත් සෞඛ්‍ය තත්ත්වයෙනි. ඉන්පසු දිනෙක සුර දූතිකාව නැවත ලතින් බසින් දේවගැතිවරයා අමතා තිබේ. ඇය පවසා ඇත්තේ රසල්ට පරිදිම ඉයුනීස්ටද අග්න්‍යාශයේ රෝගයක් පවතින බවයි. ඉයුනීස් ඉන් බියට පත්වූවාය. එහෙත් ඇයට කිසිඳු රෝග ලක්ෂණක් නොවීය.



මෙරටට පැමිණ සති තුනක් පමණ ගතවෙද්දී ඉයුනීස් ද දරුණු අන්දමින් රෝගී වූවාය. ඇය සිහි මූර්ජා වූ දිගු නිද්‍රාවකට පත්වූවාය. පවුලේ වෛද්‍යවරයා පැමිණ පරීක්ෂා කර ඇයට 'ඩෙක්ස්ට්‍රෝස්' නිර්දේශ කළේය. එසේ වුවද ඇගේ තත්ත්වය දිනෙන් දින නරක අතට හැරුණු බැවින් පවුලේ වෛද්‍යවරයා විසින්ම ගිලන් රථයක් කැඳවනු ලැබ රෝගියා පෞද්ගලික රෝහලකට ඇතුළත් කෙරිණ. ඉන් තරමක සුවයක් ලබා නිවසට පැමිණි ඇය යළි අසනීප වූවාය.

## සැකයක්

අසාධ්‍ය තත්ත්වයට පත් වූ විට ඉයුනීස්, රසල් ලෙසම කොළඹ ජාතික රෝහලට ඇතුළත් කෙරිණ. එහිදීද සුදු ලෝගුවකින් සැරසුණ පූජකවරයා කළ බලපෑම් හේතුවෙන් ඇයට ප්‍රතිකාර කළ වෛද්‍යවරු විවේකාගාරයේදී ඒ ගැන කතා කළහ. තවත් වෛද්‍යවරුන් පිරිසකට මාස කිහිපයකට ඉහතදී වූ ඊට සමාන සිදුවීමක් මතකයට නැගීමට එය හේතු විය. රෝග ලක්ෂණ සහ භාරකරුවන් එක හා සමානය. එබැවින් සිදුවීම සැකයක් බවට පරිවර්තනය විය. වහාම පොලිසිය දැනුවත් කෙරුණේ ඒ අනුවයි. එබැවින් දේවගැතිවරයාට රෝගියා බැලීම තහනම් කෙරුණද රෝගියා බේරාගැනීමට ඒ වනවිට ප්‍රමාද වැඩිය. ඇගේ මොළයට හානි වී තිබිණ. එමෙන්ම කාලයක් පුරා වර්ධනය වී තිබූ නිව්මෝනියා රෝගයද වර්ධනය වීම හේතු කරගෙන ඇය මියගියාය. ඒ, 1979 මාර්තු මාසයේදීය.

## පොලිස් පරීක්ෂණ සහ ආදර කුරුල්ලන්

මේ මරණ අතරේ වුව මැතිව් සහ ඩැල්රීන් නිදහසේ පෙම් සුව වින්දෝය. මැතිව් සහ ඩැල්රීන්ට එරෙහි නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි එවකට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තිලක් මාරපන සිය ආරම්භක දේශනයේදී පැවසුවේ ඔවුන් ආදර කුරුළු යුවලක් (love birds) ලෙසින් සිටි බවයි. ඔවුන් දෙදෙනාම ඉලක්ක කරමින් පරීක්ෂණ ඇරඹිණ. දේවස්ථානය පරීක්ෂා කිරීමේදී රුධිරයේ සීනි මට්ටම පහත හෙළන ඖෂධ රැසක් සොයාගැනිණ. ඒවා ඔහු එංගලන්තයෙන්ද මිල දී ගෙන තිබිණ. එමෙන්ම දියවැඩියා රෝගයෙන් පෙළෙන දේවගැතිවරයා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඖෂධ මිලදී ගත් බවට ඖෂධ අලෙවිසැල් සේවකයින්ද සාක්ෂි දී තිබේ. තවද දේවස්ථානයේ තිබී 'Mind body and sugar' නම් ග්‍රන්ථයක්ද හමුවිය.

## ජීවත්ව සිටියදීම මිනී ඇඳුම

රසල් මියයාමට පෙර ඔහුගේ මෘත දේහයට අන්දවන ඇඳුම සඳහා මිමි දී තිබූ බවටද සාක්ෂි ලැබිණ. එමෙන්ම අධිකරණ නියෝගයකට අනුව රසල්ගේ දේහය යළි ගොඩගැනීමට අවසර ලද අවස්ථාවේ කලබලයට පත් දේවගැතිවරයා මල්ශාලාවට දුරකතන ඇමතුමක් දී තිබේ. ඒ සිරුරේ එම්බාම් කටයුතු කළ අයුරු පරීක්ෂා කිරීමටයි. ඔහුගේ උපදෙස් පරිදි සිරුරේ අභ්‍යන්තර අවයව සියල්ල ඉවත් කර ලී කුඩු ඔබ්බවා තිබුණේ සාක්ෂි විනාශ කිරීමේ සූක්ෂම අරමුණින් බව හෙළිවිය.

## මියයාමටත් පෙර අවසන් ගෞරව සැලසුම්

ඉයුනීස් පීරිස් ගුරුවරියකි. ඇය මියයාමට පෙර මැතිව් පීරිස් දේවගැතිවරයා ඈ සේවය කළ පාසලට ගොස් තිබේ. ඒ, මියගිය පසු අවසන් ගෞරව දැක්වීමට ඇගේ දේහය පාසලට රැගෙන ආ යුතුදැයි විමසීමටයි. ඉයුනීස් පීරිස් මරණාසන්නව සිටියදී ඩැල්රීන් වෙනත් ඇනෙක්සියක නවතාලීමටද දේවගැතිවරයා පියවර ගෙන ඇත. ඊට අත්තිකාරම් සහ කුලිය ගෙවා ඇත්තේද ඔහුය. දිනපතා ඔහු රාත්‍රිය තෙක් එහි ගතකළ බව නිවෙස් හිමිකරුගේ සාක්ෂියෙන් අනාවරණය විය.

## නඩු පැවරීම

සියලු සාක්ෂි පදනම් කර ගනිමින් 1984 මාර්තු මස 14 වනදා මැතිව් පීරිස් සහ ඩැල්රීන් ඉංග්‍රම්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ නඩු පැවරිණ. රසල් ඉංග්‍රම් සහ ඉයුනීස් පීරිස් ඝාතනය සහ ඊට කුමන්ත්‍රණය කිරීම මැතිව් පීරිස්ට එරෙහි චෝදනාව විය. ඉයුනීස් ඝාතනයට ආධාර අනුබල දීම ඩැල්රීන්ට එරෙහි චෝදනාවයි. පැමිණිල්ල වෙනුවෙන් එවකට නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් තිලක් මාරපන, ආනන්ද අමරනාත් සහ සී. ආර්. ද සිල්වා ඇතුළු නීතිඥවරු පෙනී සිටියහ. පළමු විත්තිකාර මැතිව් පීරිස් වෙනුවෙන් ආර්.අයි.ඔබේසේකර, අනිල් ඔබේසේකර ඇතුළු පිරිසකි. සිසිල් ගුණවර්ධන සහ ආනන්ද මලල්ගොඩ ඇතුළු නීතිඥවරු දෙවැනි විත්තිකාර ඩැල්රීන් වෙනුවෙන් පෙනී සිටියහ. මාස 9ක් පුරා සිදුකෙරුණ නඩු විභාගයෙන් අනතුරුව ත්‍රි පුද්ගල විනිශ්චය මණ්ඩලය තීරණය කළේ දෙදෙනාටම මරණ දණ්ඩනය නියම කිරීමටයි. කෙසේ වෙතත් අභියාචනාධිකරණයේදී තීරණය කෙරුණේ ඩැල්රීන්ට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවයි.

ප්‍රේම කිරීම මත ඇය වරදකාරිය කළ නොහැකිය. ඒ සඳහා අවශ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් බවට වන සාක්ෂි වේ. ඇය ඝාතන සඳහා ක්‍රියාශීලී දායකත්වයක් දක්වා නැත. ඒ අනුව ඇය නිදොස් කොට නිදහස් කෙරිණ. මැතිව් පීරිස්ට එරෙහි තීන්දුව තහවුරු විය. මරණ දෙකම එකම ක්‍රියා කලාපයට අයත් යන පදනම මත එකම නඩුවක් ලෙස ගොනුකර තිබිණ. ඊට විත්තියේ විරෝධය එල්ල විය. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේද අභියාචනයක් ගොනු කෙරිණ. එහෙත් එය තීන්දුව වෙනස් කිරීමට හේතු නොවීය. කෙසේ වෙතත් ජනාධිපති සමාවක් ලබා ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් වූ මැතිව් පීරිස් යහපත් හැසිරීම මත වසර 12කින් නිදහස ලැබීය. පසුව ඩැල්රීන් හා විවාහ වී මොරටුවේ පදිංචිව සිටි ඔහු 1998 මැයි මාසයේදී ජීවිතක්ෂයට පත්වූයේය.

මහාධිකරණ නඩු විභාගය අවසානයේ ඔහු පැවසුවේ "මා විනිශ්චය කළ හැක්කේ දෙවියන්ට පමණයි" යනුවෙනි. ඒ විනිශ්චය ඔහුට ලැබුණිදැයි දන්නේ ඔහුම පමණි.

■ නීතිඥ රෂ්නිකා ලියනගේ

# පාට් දාන්න වියදම් කරන සල්ලිවලින් දානයක් දුන්නා නම් ඉවරයිනේ



**ඉන්දිකා ප්‍රනාන්දු**
මනෝඋපදේශිකා සමාජ විද්‍යා ග්‍රන්ථ කතුවරි



මම දන්න කාන්තාවක් හිටියා. ඇය යහමින් මිල මුදල් තිබුණු කාන්තාවක්. හැබැයි මේ කියන කාන්තාවගෙන් මම බෞද්ධ සාහිත්‍යයේ එන අදින්නපුබ්බකව ජීවමානවම දැක්කා. ඇය ඒ තරම් මසුරුයි. ඇගේ පෙම්වතා විවාහ වෙද්දි චාම් උත්සවයක් ගන්න ලැහැස්ති වුණත් ඈ නෙමෙයි ඒකට කැමති වුණේ. විවාහයෙන් පස්සෙ දෙන්නගේ ජීවිත ඔහේ ගෙවිලා ගියා. ළමයි දෙන්නෙක් ලැබුණා. කවදාවත් මේ දරුවන්ගේ උපන්දිනයකට කේක් ගෙඩියක් කපලා නෑ. සිංහල අවුරුද්දක්, වෙසක් එකක් සමරලා නෑ. සල්ලි වියදම් වෙයි කියන බයට වෙන ගෙවල්වලට ආපු විශේෂ දවස් එකක්වත් මේ ගෙදරට ආවේ නැහැ. ඔහොම කාලයක් යද්දි මේ කාන්තාව මියගියා. පස්සේ සැමියා තවත් කසාදයක් කරගත්තා. ඒ බිරිඳටත් කලින් විවාහයක දරුවෙක් හිටියා. හැබැයි ඇය මේ දරුවෝ තුන්දෙනාම සැලකුවේ එක විදියට. නිතරම වගේ මේ දරුවන්ව සතුටු කළා. උපන්දින උත්සව ගත්තා. පුංචි පුංචි දේට පවා දරුවන්ව සතුටු කළා. ඇත්තම කිව්වොත් වදාපු අම්මා එක්ක ඉන්නවට වඩා ඒ දරුවෝ හදාපු ඒ අම්මා එක්ක සතුටින් හිටියා. ඒ සැමියා වුණත් එහෙමයි.

පුළුවන් තරම් සල්ලි පොදි ගැහැව්වා කියලා අර කාන්තාව මැරෙද්දි ඒවා අරන් ගියාද? අඩුතරමේ සැමියා දරුවන් එක්ක සතුටින් ඉන්නවත් ඇයට අවස්ථාවක් ලැබුණේ නෑ. මනුස්සයෙක්ගේ ආයු අපේක්ෂා අවුරුදු හැත්තෑවයි අසූවයි. ඒ කාලේදි අපි ජීවිතේ සතුටු දවස් සමරන්න ඕනේ. අනිත් අයගේ සතුට සමරලා ඒ අයගේ වැදගත් දවස්වලට වටිනකමක් දෙන්න ඕනේ. ඒ ඇයි කියලා අද ලිපියෙන් මම පැහැදිලි කරන්නම්.

පණ තියෙන හැම සතෙක්ම මහන්සි වෙන්නෙ ජීවත්වෙන්න. තරඟේ වැඩි නිසා අනිත් හැම සතාටම වැඩිය ජීවත්වෙන්න අරගල කරන්නේ මනුස්සයා. ඒකට අපි හැමදාම දුවනවා. ඔය දුවන දිව්ල්ලේ මනසට විවේකයක් ගන්න අපිට ලැබෙන හොඳම අවස්ථා තමයි සැමරුම්.

ඔයා ගොඩක්ම ආදරය කරන මනුස්සයා කවුද කියලා කාගෙන්හරි ඇහුවොත් ගොඩක් අය කියන්නේ අම්මා, තාත්තා නැත්නම් හස්බන්ඩ් වගේ උත්තර. අපේ ආදරණීයයන්ට අපි ආදරේ කරන්න ඕනේ. ඒක ඇත්ත. හැබැයි ඒ කාට ආදරේ කරන්නත් කලින් තමන් තමන්ට ආදරේ කරන්න ඕනේ.

මගේ උපන්දනේ දවසට මුලින්ම මට තෑග්ගක් දෙන්නේ මම. මෙච්චරකල් මාව දරාගෙන හිටියට මම මට තෑග්ගක් දෙනවා. උපන්දිනේ දවසට යාළුවන්ට එන්න කියලා කේක් එකක් කපන්න. කේක් එකක් බැරිනම් පුංචි කප් කේක් එකක් හරි. ඒක තමන් තමන්ටම දෙන සතුටක්. ඒ වගේ දේවලින් අපේ මානසික ආතතිය දුරුවෙනවා.

තමන්ගේ සතුට ගැන හිතනවා වගේම තමයි තමන්ගේ ආදරණීයයන්ගේ සතුට ගැනත් හිතන්න. හස්බන්ඩ්ට මගේ උපන්දිනේ මතක නෑ, නැත්නම් නෝනට අපේ ඇනිවසරි එක මතක නෑ වගේ කතා උපදේශනයට එන ගොඩක් උදවිය මට කියලා තියෙනවා. කෙනෙක්ගේ විශේෂ දවසක් මතක තියාගෙන ඉඳලා ඒ කෙනාට පුංචි තෑග්ගක් නැත්නම් පුදුම කිරීමක් දුන්නහම ඒ තැන බැඳීම තවත් වැඩිවෙනවා අනේ මේ මනුස්සයා මට මොනතරම් වටිනාකමක් දෙනවද කියලා අනිත් කෙනාට වුණත් දැනෙනවා.

උපන්දිනේ මතක නැහැ කියලා දුක්වෙන එක මහ බොළඳ වැඩක්, අයියෝ! ඒවා මහ පුංචි ප්‍රශ්නනේ කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. කවුරු වුණත් තමන් ආදරේ කරන කෙනාගෙන් වටිනාකමක් බලාපොරොත්තු වෙනවා. ඉතින් විශේෂ දවස් මගඇරෙනකොට එතැන තමන්ට වටිනාකමක් නැහැ කියලා කෙනෙක්ට හිතෙන්න පුළුවන්. ඒක බොළඳකමක් නෙමෙයි. පුංචි දේවල් කියලා හිතුවට මේ වගේ ප්‍රශ්න කීපයක් එකට එක්කාසු වෙලා ගිනිකන්දක් පුපුරනවා වගේ පුපුරලා පවුලක් දෙදරලා යන්න වුණත් පුළුවන්.

දැන් අපි පුංචි දරුවෙක්ගේ පැත්තෙන් මේ කාරණාවට යමු. දැන් ටික දවසකට කලින් අම්මා කෙනෙකුයි තාත්තා කෙනෙකුයි මනෝ උපදේශනයට ආවා. ඔවුන්ගේ දරුවට අවුරුදු දොළහයි. මේ දරුවා අම්මා තාත්තට බොහොම නරක විදියට බනිනවා කියන එකයි ඔවුන්ගේ ගැටලුව වුණේ. මම මේ පුංචි පුතා එක්ක ගොඩක් වෙලා තනියම කතා කළා. මේ පුතාගේ යාළුවන්ගේ අම්මලා තාත්තලා නිතරම ඒ අයට තෑගි දෙනවලු. උපන්දිනේ දවසට පංතියේ යාළුවන්ට කේක් එහෙම බෙදනවලු. පුතා අම්මලා එක්ක තරහින් ඉඳලා තියෙන්නේ මේ හේතුව නිසයි.

ආර්ථික ප්‍රශ්න නිසා සමහරුන්ට මෙහෙම දේවල් කරන්න අමාරුයි. හැබැයි මේ දෙමාපියන්ට එහෙම ප්‍රශ්න තිබුණෙත් නෑ. ඒ ගැන ලොකුවට හිතුවේ නෑ කියන එකයි ඒ අම්මලාගේ උත්තරේ වුණේ. දරුවෙක්ගේ පුංචිම දෙයක් වුණත් සමරන්න ඕනේ. වැඩිපුරම ලකුණු ගත්තු දවස, රේස් එකක් දුවලා දිනපු දවස ඔය ඕන දවසක්. ඒකට ලොකු ලොකු තෑගි දෙන්න ඕනා නෑ. දරුවට පුංචි චොක්ලට් එකක් දෙන්න. නැත්නම් කඩදාසි බෝට්ටුවක් හදලා දෙන්න. මේක දෙන්නේ මේ නිසයි කියලා අගය කරලා දෙද්දි තමන්ට වටිනාකමක් දෙනවා කියලා ළමයි සතුටු වෙනවා මිසක දෙන දේයි වටිනාකම ගැන දරුවා හිතන්නේ නැහැ. මේ දේවල් දරුවගේ මානසික වර්ධනයට පෞරුෂ සංවර්ධනය විතරක් නෙමෙයි අම්මා තාත්තා එක්කලා තියෙන බැඳීම වර්ධනය වෙන්නත් හේතු වෙනවා.

පුංචි දරුවන්ට විතරක් නෙමෙයි අනිත් අයටත් ඔය කාරණා අදාළයි. වයසක අම්මා තාත්තගේ උපන්දිනේ දවසට කේක් ගෙඩියක් කපලා ඉටිපන්දමක් නිව්වොත් ඒ අය කොච්චර සතුටු වෙයිද? යාළුවෙක්ට විෂ් කරලා මලක් තෑගි කරන්න පුළුවන් නම් ඒ යාළුකම කොච්චර ශක්තිමත් වෙයිද?

මම නම් කියන්නේ උපන්දිනය විතරක් නෙමෙයි පුළුවන් තරම් සමරන්න අවස්ථා හොයාගන්න. විවාහ සංවත්සර, ප්‍රමෝෂන් එකක් ලැබුණු දවස, තව කොච්චර නම් විශේෂ දවස් ජීවිතේට තියෙනවද? ඒ හැමදාවක්ම පුංචිවට හරි සමරන්න. එතකොට මේ හැල්මේ දුවන ජීවිතවලට කොච්චර ලොකු මානසික සතුටක් ලබාගන්න පුළුවන්ද?

මනුස්සයා කියන්නේ කණ්ඩායම් සත්වයෙක්. ඉතින් හැමෝටම එකතු වෙලා කතා කරන්න, සම්බන්ධතා අලුත් කරන්න මේ සැමරුම් උදව්වක්. ඒ විතරක් නෙමෙයි අනික මිනිස්සුන්ගේ මානසික පැවැත්මට ධනාත්මක ස්පර්ශයන් අවශ්‍යයි. සැමරුමක් වෙලාවෙදි සුබ පතලා වැළඳගනිද්දි ඒ ධනාත්මක ස්පර්ශය ඉබේටම ලැබෙනවා.

විශේෂ දවස් සමරන්න කියලා කියද්දි 'අපිට ඒවට සල්ලි කොයින්ද' කියලා මම ෆේස්බුක් එකේ ලස්සන ෆොටෝ දෙකක් දැක්කා. පුංචි දරුවෝ ටිකක් එක්කාසු වෙලා පාන් ගෙඩියකට ඉටිපන්දම් ගහලා එතැන එක දරුවෙක්ගේ උපන්දිනය සමරනවා. වරකා බෑවකට ඉටිපන්දම් ගහලා විශේෂ අවස්ථාවක් සමරන ෆොටෝ එකක් තමයි අනික. කේක් නොතිබුණාය කියලා ඒ දරුවන්ගේ මූණුවල සතුටේ නම් කිසි අඩුවක් තිබුණේ නැහැ.

ඉතින් පුංචිවට හරි ඒ දවස් සමරන්න. අර කිව්වා වගේ තෑගි ගන්න සල්ලි නැත්නම් තමන්ගේ අතින් හැදුව දෙයක් හරි ඒ කෙනාට තෑගි කරන්න.

ඔය අතරේ තව පිරිසක් ඉන්නවා සල්ලි ඕනතරම් තියෙද්දිත් ඕවා මහ බොරු වැඩ, බොළඳ වැඩ කියලා හිතලා සැමරුම් අමතක කරනවා. 'සමහර මිනිස්සු කොච්චර දුප්පත්ද කියනවානම් ඒ අයට තියෙන්නේ සල්ලි විතරයි' කියලා කතාවක් තියෙනවා. ඇත්ත. වයසට ගිය දවසට හවසක කතා කර කර ඉන්න නැත්නම් මතක් කර කර ඉන්න ලස්සන මතක, ජීවිතේ විශේෂ දවස් සමරපු හැටි ගැන අත්දැකීම් ඒ අයට නෑ. සම්බන්ධතා ඇතුළේ ආදරණීය නැත්නම් අනිත් අයට වටිනාකමක් දෙන්නේ නැතිනම් ඒ බැඳීම් හරි යාන්ත්‍රිකයි. බැඳීම් ඇතුළේ යාන්ත්‍රික වෙනවට වඩා හොඳයි කැලේට ගිහින් තපස් රකින එක.

අනිත් මිනිස්සු උපන්දිනයක් නැත්නම් වෙනත් සැමරුමක් සමරනවා දැක්කහම අපරාදේ ඔය නාස්ති කරපු සල්ලිවලින් දානයක් දුන්නා නම් ඔයිට වඩා වටිනවා කියලා කියන පිරිසකුත් ඉන්නවා. ඒවා නම් ඇත්තටම ඊර්ෂ්‍යාවට කියන කතා. ඒ සල්ලි නහස්තියක් වගේ අනිත් අයට පෙනුණට ඒ මුදල වියදම් කරලා ඒ පුද්ගලයා ලොකු මානසික සතුටක් ලබනවා. අනික මනුස්සයෙක් මහන්සි වෙලා හරිහම්බ කරන සල්ලිවලින් දාන දෙනවද පාටි දානවද කියන එක තීරණය කරන්න ඕන ඒ මනුස්සයා මිස වටේපිටේ ඉන්න උදවිය නෙමෙයිනේ.

ගොඩක් වයසට යද්දි අපිට රස දැනෙන්නේ නෑ. කන් ඇහෙන්නේ ඇස් පෙන්නේ නෑ. ඒ නිසා පෙනීම, දැනීම තියෙන කාලේ සතුටින් ඉන්න. අනික අපි හැමෝම මැරෙන මිනිස්සු. අපේ ජීවිත හරි අවිනිශ්චිතයි. ඉතින් පුළුවන් හැම දවසක්ම සතුටින් සමරලා ඉන්න. ඒ අතරේ අනිත් අයටත් වටිනාකමක් දෙන්න. ඒ අයට අපි ආදරෙයි ඒ අය ගැන හිතනවා කියන එක දැනෙන්න දෙන්න. අතේ මහ ලොකුවට සල්ලි නැත්නම් පුංචි දේකින් හරි ඒ සතුටු දවස් සමරන්න. ඒක හිතට ලොකු සැනසීමක් වේවි.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

# ළමයින්ගේ පිං ඉවර වුණාම අම්මා අප්පා මැරෙනවද?



උම්මාද චිත්‍රාගේ කතාව රාජාවලියෙන් අහන්න ලැබෙන බොහොම සුවිශේෂී කතාවක්. චිත්‍රා කුමාරිය ඉපදුණ වෙලාවෙ නක්ෂත්‍රකරුවන් බොහොම භයානක අනාවැකියක් කියලා තියෙනවා. කවදාහරි දවසක චිත්‍රාට දාව පිරිමි දරුවෙක් ඉපදුණොත් ඔහු මාමාවරු සියලුදෙනාම ඝාතනය කරලා රජකම ලබාගෙන ලංකාව අධාර්මිකව පාලනය කරනවා කියලයි ඒ අනාවැකියෙන් කියැවුණේ.

ඔය කතාව අහපු ගමන් චිත්‍රාගේ සහෝදරයෝ ටික ඇයව මරා දමන්න උත්සාහ කළා. හැබැයි වැඩිමහල් සහෝදරයා වෙච්ච අභය කුමාරයා ඒකට විරුද්ධ වුණා. චිත්‍රා කුමාරි වැඩිවියට පත්වෙච්චි හැටියේ පිරිමියෙක් ඇහැ නොගැටෙන්න එක්ටැම් ගෙදරක හිර කරමු කියලයි අභය යෝජනා කළේ.

ඒ අනුව වැඩිවියට පත්වුණාට පස්සේ චිත්‍රා කුමරියට එක්ටැම් ගෙදරක සිරකාරියක් වෙන්න සිද්ධ වුණා.

ගාමිණී කියන්නෙ භද්දකච්චායනා කුමරියගේ සහෝදරයෙක් වුණ දීඝායු කුමාරයාගෙ පුතා. ඒ කිව්වෙ චිත්‍රාගෙ මාමගෙ පුතා. හරියටම කිව්වොත් චිත්‍රාගෙ ඇවැස්ස මස්සිනා. කොහොමහරි කාලයක් යද්දි චිත්‍රා කුමාරියි දීඝායු කුමාරයයි අතර සම්බන්ධයක් ඇතිවෙලා චිත්‍රා කුමාරිය ගැබ්ගත්තා. අනාවැකිකරු කිව්ව විදියට චිත්‍රාට කොල්ලෙක් හම්බුණොත් උඹව මරලා දානවය කෙල්ලෙක් ලැබුණොත් විතරක් හදාගන්නවය කියන එක තමයි අයියලා තීරණය කළේ.

හිතුවත් වගේම චිත්‍රාට ලැබුණේ පිරිමි දරුවෙක්. දරුවා ලැබුණ මොහොතෙදීම චිත්‍රා ඇගේ දරුවව ගැහැනු දරුවෙකුට මාරු කළාලු. කාලේ ගෙවෙද්දි මේ කුමාරයා පණ්ඩුකාභය නමින් රජ වුණා. අනාවැකි අහලා මාමලා තමන්ව මරන්න ආපු නිසා මාමලාව මරා දාන්නත් ඔහුට සිද්ධ වුණා. හැබැයි පණ්ඩුකාභය රජතුමා කවදාවත් මේ ශ්‍රී ලංකාද්වීපය විනාශ කරන්න කටයුතු කරපු රජෙක් නෙවෙයි. ඔහු ඉතාමත් ධාර්මිකව අපේ රට අවුරුදු හැත්තෑවක් පාලනය කළා.

තව කතාවක් බලමු.

ගග්ග කියන පුරෝහිතයාට දාව මණ්තානි බැමිණියට අහිංසක කුමාරයා ඉපදුණ දවසෙ රෑ රටේ රජතුමා හරි අපූරු හීනයක් දැක්කලු. ඒ තමන්ගේ මඟුල් කඩුව ඉතාමත් අලංකාරව දිලිසෙන හැටි. ගග්ග කියන්නෙ ඒ දවස්වල පළාතම හොල්ලගෙන හිටපු නක්ෂත්‍රකරුවෙක්ලු. ඒ නිසා රජතුමා පහුවදා උදේම ගග්ගව මාලිගාවට කැඳවලා මේ ගැන විස්තර ඇහැව්වලු.

රජතුමා ඒ විදියේ හීනයක් දැක්කෙ කලින්දා රාත්තිරියේ රාජ්‍යට මහා විනාසයක් කරන පල් හොරෙක් ඉපදුණ නිසා කියලයි එතකොට ගග්ග කිව්වේ. ඒ වෙන කවුරුත් නෙවෙයි තමන්ගෙම පුතා කියලා මේ මනුස්සයා කිව්වලු. තමන්ගේ සාස්තරේ ගැන විශ්වාස තියලා තමන්ගෙම පුතාව මරලා දාන්න කියලත් මේ අඥාන පුරෝහිතයා රජතුමාට කියලා තියෙන එකයි වැඩේ. අහිංසක කුමාරයාගේ පූරුවෙ පිනකටද කොහෙද ඒ වෙලාවෙ රජතුමා ඊට විරුද්ධ වෙලා තියෙනවා. පස්සෙ කලවයස හරි ගිහාම අහිංසකව ඉගෙනගන්න දිසාපාමොක් ආචාරීන්ගෙ තක්සලාවට යැව්වා. එතැනදි අහිංසකගෙ දක්ෂතා දැකපු අචාර්යවරයා ඔහුට විශේෂ සැලකිල්ලක් දැක්වුවා.

ඊකට ඊරිසියාවට අනිත් දරුවෝ කේලම් කියලා මේ දෙන්නව කෙටෙව්වා. අන්තිමේදි අර කාටවත් වරදක් නොකරපු අහිංසක අංගුලිමාල වුණු එකයි වුණේ.

ඒත් ඒ සේරටම වඩා ඔහුගේ පෙර කුසල් බලවත් වුණ නිසා අන්තිම මොහොතේ හරි බුදු නෙතේ ගැටිලා අංගුලිමාල මහරහතන් වහන්සේ බවට පත්වුණා.

පුදුමේ කියන්නෙ එදා ගග්ග පුරෝහිතයාගේ සාස්තරේට අහිංසකගේ පෙර පිං පෙනිලා තිබුණේ නෑ. මේ දවසක ලෝකයක් බබළවන මහරහත් නමක් වෙන විත්තියක් දැකලා තිබුණෙත් නෑ.

ඉපදෙනකොටම කියන අනාවැකි නිසා දරුවෝ කොච්චර විඳවනවද කියන එක අපේ ඉතිහාස කතාවල පවා දැක්වෙන්නේ ඔහොමයි.

මිථ්‍යා මත නිසා දරුවන් කොන් කිරීම මොනතරම් බරපතළ කාරණාවක්ද කියන එක ගැනයි මහාචාර්ය අත්තනායක එම්. හේරත් එක්ක අද අපි කතා කරන්නේ.

ඒ ගැන කතා කරන්න කලින් සිදුහත් උපතෙන් මේ කතාවට ආරම්භයක් ගන්න මම කැමතියි. දැන් බලන්න සිදුහත් කුමාරයා ඉපදුණ හැටියේ එතුමන්ගේ මව්තුමිය වෙන මහාමායා දේවිය කලුරිය කළා. බුදු කෙනෙක් ඉපදෙන කුසකින් තවත් උපතක් සිදු නොවිය හැකි නිසා එහෙම වුණාය කියලා ගොඩක් උදවිය කියන්නේ. ඒත් කවුද, කවදාද ඔය කතාව හරියටම සාක්ෂි සාධක ඇතුව ඔප්පු කරලා තියෙන්නෙ කියන එකයි මගේ ප්‍රශ්නේ? කොයි ඉතිහාස පොතේද හරියටම ඒක එහෙමමයි කියලා පෙන්නලා දීලා තියෙන්නෙ? එදා ඉඳන් ආපු කතාවක් නිසා අදටත් අපි ඒක පිළිගන්නවා ඇරෙන්න මට නම් ඒ කතාවෙ කිසිම සත්‍යතාවයක් පේන්න නෑ. එහෙනම් අදටත් සමහරක් දරුවෝ ඉපදෙනකොටම ඒ අයගෙ අම්මලා මැරෙන්නෙ. මං ඉපදෙනකොටම මගෙ අම්මා මැරිලා ගිහින් තියෙන්නෙ නිර්වාණෙට කියලා දවසක ඒ දරුවන්ටත් තර්ක කරන්න පුළුවන්.
අන්න ඒ වගේ එදා මහාමායා දේවියගෙ මරණෙත් දරුවාගෙ උපතත් එක්ක සිද්ධ වුණ සාමාන්‍ය දෙයක් කියලයි මම කියන්නෙ.

එහෙම වුණාය කියලා සිද්ධාර්ථ කුමාරයා කවදාවත් ඒක ඔහුගේ කාලකණ්ණිකමක් කියලා ඇගේ හලාගත්තද? නැහැ. උන්වහන්සේ වීර්යය වඩලා බුද්ධත්වයට පත්වුණා. බුදු වුණාට පස්සෙ අම්මා මරාගෙන ඉපදුණ එකා කියලා කවුරුත් බුදුන්ට චෝදනා කළාද? නෑනේ. එදා උන්වහන්සේ බුද්ධත්වයට පත් නොවුණා නම් මේ තුන්ලෝකයටම අධිපති සක්විති රජ වෙනවා. එහෙම වුණත් කවුරුත් කියයිද අම්මා මරාගෙන ඉපදුණ කාලකණ්ණියෙක් කියලා? දරුවෝ ඉපදෙනකොටම සිද්ධවෙන දේවල් ඒ දරුවන්ගෙ කරුමෙට වෙන දේවල් නෙවෙයි ඒවා සාමාන්‍ය සිදුවීම් විතරයි.

ඊකට මම තවත් හොඳ කතාවක් කියන්නම්.

මේ ළඟදි මට අනුරාධපුර පැත්තේ දුවෙක් කතා කළා. ඒ දරුවට තව බාල සහෝදරයෙකුත් ඉන්නවලු. හැබැයි මේ දුවගේ දෙමව්පියො දෙන්නා අර මල්ලිව විතරක් හොඳ සැපට හදාගෙන මේ දරුවව පවුලට මූසලයි කියලා ඒ අම්මාගෙම තවත් බැඳපු නැති අක්කා කෙනෙකුට මේ දුවව හදාගන්න දීලා. එයා ඉපදුණ දවසෙම තාත්තට සර්පයෙක් දෂ්ට කරලා, අම්මාට පපුවෙ අමාරුවක් හැදිලා තියෙන එකයි ඒකට හේතුවෙලා තියෙන්නේ. එදා ඉඳන් අද වෙනකන් ඒ දුව ගෙවලා තියෙන්නෙ බොහොම දුක්ඛිත ජීවිතයක්. මොකද අර ලොකුඅම්මාට අර අම්මලාට වගේ යහමින් සල්ලි බාගේ තිබිලා නෑ. ඒ අම්මා දරුවා වෙනුවෙන් කියලා කීයක්වත් දීලත් නෑ. ලොකුඅම්මා ගෙවල්වල කුලී වැඩ කරලා මේ දරුවව යාන්තමට ඉස්කෝලෙකට යවලා කන්න අඳින්න දීලා.

අද වෙනකොට මේ දරුවාගෙ මුළු අනාගතේම අඳුරු වෙලා. හැබැයි අර මල්ලි දැන් අනුරාධපුර රෝහලේ දොස්තර කෙනෙක්ලු. ඉතින් බලන්න සමහරක් වැඩිහිටියන්ගේ මේ වගේ මෝඩ තීරණ නිසා දරුවන්ගෙ ජීවිතවලට කොච්චර හානි වෙනවද? අනික ආපහු කවදාවත් ආපස්සට ගිහිල්ලා ඒ දේවල් නිවැරදි කරන්නවත් පුළුවන්ද?

තව දුවක් හිටියා. ඇය ගුරුවරියක්. මට ඇයව මුණගැහුනෙ ඔය කොළඹ පැත්තෙ ඉස්කෝලෙකට ගුරු දේශනයකට ගියපු වෙලාවක. ඇය කියපු විදියට ඇය ඉපදිලා මාසයක් යනකොට ඇගේ පියා මැරිලාලු. එදා ඉඳන් ඒ දරුවාගෙ අම්මා ඒ දරුවට නොසෑහෙන්න දොස් කියනවලු අම්මාව කනවැන්දුම් කරපු මූසලී කියලා.

ඊටපස්සෙ අර අම්මා ඒ දුවගේ වේලපත්කඩ බලවපු වෙලාවක තාත්තා මැරුණේ දුවගෙන් තාත්තට අපල නිසා කියලා නක්ෂත්‍රකාරයොත් කියලා. අන්තිමට අර අම්මායි පවුලේ අනිත් නෑදෑ සනුහරෙයි එකතුවෙලා ඇයව පොඩි කාලෙදිම කොළඹ පැත්තෙ බෝඩින් කාමරේක නතර කරලා. ඕන කරන දේවල් දීලා ඉගැන්නුවට මොකද කවදාවත් ගෙදරට වද්දගෙන නෑ. පස්සෙ අර අම්මා දෙවැනි කසාදෙකුත් කරගෙන.


> තාත්තා මලේ දුවගේ අපලෙට කිව්වහම අම්මා දුවව කොළඹ බෝඩිමක නතර කළා

මං අහන්නෙ අර උන්දෑගෙ ආයුෂය කොහොමද මේ දැරිවි මත තීරණය වෙන්නෙ? බුදුදහමට අනුව ගත්තත් තමන්ට පින් පව් පලදෙන්නෙ තමන් සංසාරේ කරලා තියෙන කුසල අකුසල කර්ම අනුව.

ඔය කියපු කතා දෙකේම දුවලා දෙන්නාට දෙමව්පියන්ගෙ ආදරේ අහිමි වෙලා තියෙන්නෙත්, එක දුවෙකුගෙ සම්පූර්ණ අනාගතේම අඳුරුවෙලා තියෙන්නෙත් ඒ වැඩිහිටියෝ අනවශ්‍ය විදියට මිථ්‍යා මත පස්සෙ දුවපු නිසා. අනික ඔය එක කතාවක් දෙකක් විතරයි. මිථ්‍යා මත නිසා පවුලෙන් සමාජෙන් කොන් කරලා දාලා ඉන්න දරුවෝ ඕනතරම් මේ සමාජයේ ඉන්නවා.


දැන් බලන්න ඔය කලින් කියලා තියෙන විදියට උන්මාද චිත්‍රා එදා අයියලාට පණ්ඩුකාභය කුමාරයාව මරලා දාන්න දීලා බලන් හිටියා නම්, අර අහිංසක කුමාරයා ඉපදුණ ගමන් අර මෝඩ තාත්තා කියපු කතාවට ඔහුව මරලා දැම්මා නම් මේ වෙනකොට අපිට පණ්ඩුකාභය කියලා ශ්‍රේෂ්ඨ රජ කෙනෙකුගේ ඉතිහාසෙකුත් නෑ. ලෝකයක් එළිය කරපු අංගුලිමාල මහරහතන් වහන්සේගේ ධර්මස්කන්දය ගැන අහන්න ලැබෙන්නෙත් නෑ.

■ ලිහිණි මධුෂිකා



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

# මහත්තයගෙනුයි වැඩකාරිගෙනුයි පලිගන්න මැරිච්ච නෝනා බාත්රූම් එකේ පැලපදියම් වෙලා



රූමත් කාන්තාවකගේ අවතාරයක් සිටින නානකාමරයන් ඇති පැරණි නිවසක් වාරියපොළ නගරාසන්නයේ පොල්වත්තක් මැද ඇතැයි මට දැනගන්නට ලැබී දැනට සෑහෙන කලකි. නමුදු එවන් අද්භූත සිදුවීම් පිළිබඳව මාධ්‍යයක් මගින් අනාවරණය කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු ගොනු නොවීම නිසා පසුගිය කාලය තුළ ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් නොදැක්වීමි.

"මේක එහෙම දෙයක් නෙවෙයි. ඒ හොල්මන දැකපු අය පවා ඉන්නවා. ඒ වගේම ඒ බාත්රූම් එක ඇතුළෙන් ඇහෙනවා කියන අද්භූත සද්ද ඒ ගෙදර ඉන්න හැමෝටම එක විදියටම ඇහෙනවාලු. අනික මේක දැන් කාලයක් තිස්සේ එක විදියටම වෙන දෙයක්." මගේ එම නිහඬතාව නොඉවසූ ඒ ප්‍රවෘත්තිය මුලින්ම මා හා හෙළිකළ විශ්‍රාමික ග්‍රාම නිලධාරී හිතවතා කීය.

"හැබැයි ඉතින් පොල් අක්කර තුනක් එක්ක ඔය ගෙදර විකුණන්න දලා තියෙන්නේ. ඒත් ඔය කාරණේ හින්ද කිසිම කෙනෙක් ඕක ගන්නෙ නැහැ. අන්තිමට ගේයි ඉඩමයි ගත්ත අයත් තුට්ටුවට දෙකට ඕක දීලා ගිය හින්දයි දැන් ඕක එහොම වෙන්දේසිකාරයෝ අතට ගිහින් තියෙන්නේ. කොහොමත් ඕක බලාගන්න මනුස්සයාවත් රෑට ඔය ගේ ඇතුළට යන්නේ නෑ. ඒ මනුස්සයත් ඔය වත්තේ වෙනම මුර මඩුවක පදිංචි වෙලා ඉන්නේ." ඔහු වැඩිදුරටත් එසේ කී අතර එම නිවසේ නානකාමරය තුළ රාත්‍රී කාලයට හොල්මන් කරන බව පැවසෙන අද්භූත ගැහැනිය පිළිබඳ වැඩිදුර තොරතුරු විමසා බැලීමේ ආශාවක් පසුගිය කාලයේ මා තුළ ජනිත විය.

එය වාරියපොල නගරයෙන් ඔබ්බෙහි ප්‍රධාන මාර්ගයකට මායිම්ව තිබූ පොල්වත්තක් මැද පිහිටි හුදෙකලා නිවසකි. විසිවන සියවසේ මුල් භාගයේ රට පුරා ප්‍රචලිතව පැවැති යුරෝපීය ගෘහ නිර්මාණ ශිල්පය අනුව සැකසුණු එය කාමර හයකින් සමන්විත තරමක් විශාල නිවසක්ද විය. ඒ නිවස මුල්කොට අවතාර කතාවක් ජනගත කිරීම එය අලෙවි කිරීමට සූදනම් වන වෙන්දේසිකරුවන්ගේ තුන්දෙස් කුපිත කරවන්නක් බැවින් මගේ හිතවත් විශ්‍රාමික ග්‍රාම නිලධාරී මහතාගේ මග පෙන්වීම යටතේ ඒ අද්දර නිවසක වියපත් ගැමියකුගෙන් ඒ පිළිබඳව රහසිගතව විමසා සිටියෙමි.

"එක්දහස් නවසිය විසි ගණන්වල මොරටුව පැත්තේ ලොකු සල්ලිකාරයෙක් ඔය ඉඩමයි ඔයිට යාව තියන ලොකු පොල්වත්තයි සල්ලිවලට අරගෙන ඔය ගේ අලුතින් හදවාගෙන පදිංචි වෙලා තියෙනවා. කොහොමහරි ඒ සල්ලිකාරයට නෝනලා දෙන්නෙක්ම ඉඳලා තියෙනවා. එක නෝනා කෙනෙක් නගරබදලු. අනිත් නෝනා ගම්බද කෙනෙක්ලු. ඔය අතරේ ටික කාලෙකින් ඔය නගරබද නෝනා ආගිය අතක් නැති වුණාලු. ඊට ටික කාලෙකට පස්සේ අර ගම්බද නෝනාත් මහ රෑක යටි ගිරියෙන් හූ කියාගෙන දුවලා පාළු ළිඳකට වැටිලා මැරිලා තියෙනවා. කොහොම නමුත් ඊටපස්සේ අර සල්ලිකාරයත් ඔය පොල්වත්තයි ගේයි ඉඩමයි කාටහරි විකුණලා මේ පැත්තෙන් යන්නම ගිහින්. ඒක තමයි අපි පුංචිම කාලේ අහලා තියෙන කතාව. නමුත් ඊටපස්සේ ඔය ගෙදර පදිංචියට ආපු කිසිම කෙනෙකුට යහතින් ඉන්න ලැබිලා නැහැ. ඔය ගෙදර නානකාමරේ ඇතුළෙන් ගෑනු කටහඬක් ඇහෙනවාලු. හිටපු ගමන් නානකාමරේ කරාම සේරම ඇරලා වතුර ගලන්න පටන්ගත්තලු. ඒක තමයි අපි ඉස්සර ඉඳලා අහලා තියෙන කතාව." ඔහු කීය. ඒ කෙසේ හෝ ඉන්පසුව ඒ සම්බන්ධයෙන් පසුකාලීනව පැතර ගිය කතාව වූයේ එම ධනවතාගේ දෙවන බිරිඳ හෙවත් ගමේ නෝනා ඔහු මොරටුවේ සිටි අවදියේ ඔවුන්ගේ නිවසේ ගෘහ සේවිකාව බවකි. පසුව තම නීත්‍යානුකූල බිරිඳගේ කැමැත්තට එරෙහිව ඔහු එම ගෘහ සේවිකාවද බිරිඳක් ලෙස තබා ගනිමින් එම පොල්වත්ත සහ නිවස මිලට ගෙන වාරියපොල ආසන්නයේ පදිංචියට පැමිණ තිබේ. ගම්මුන් අතර පසුව පැතිර ගිය කතාවකට අනුව එම නිවසේ පදිංචියට පැමිණ මද කාලෙකින් එම ධනවතා ගෘහ සේවිකාවද සමඟ එක්ව තම මුල් බිරිඳ නිවසේ නානකාමරය තුළදී ඝාතනය කොට ඇත. නමුදු ඊට පසුව එම නානකාමරය තුළින් එසේ මියගිය කාන්තාවගේ රූපය අද්භූත ලෙසින් දර්ශනය වී තිබේ. එම ධනවතා තම දෙවන බිරිඳ වශයෙන් තබාගත් ගෘහ සේවිකාව එම වත්තේ පිහිටි ළිඳකට වැටී මරුමුවට පත්ව ඇත්තේ එම අද්භූත දර්ශනය දැකීමෙන් බියපත්ව මරු විකල්ලෙන් දුවන අතරේය.

ඉන්පසුව මේ වනවිට එම දේපළවල මුරකරු සේ කටයුතු කරන තරුණයාගේද සහාය ඇතිව නිවස සහ ඉඩම මිලදී ගැනීමට අපේක්ෂා කරන්නකු මෙන් එම නිවස හා ඒ අවට පරිසරය පරීක්ෂා කිරීමට මට හැකි විය.

"අපි නම් ඔය හොල්මන් අවතාර කියන දේවල් සතපහකට ගනන් ගන්නේ නෑ. ඔය බාත්රූම් එක ඇතුළේ ඉන්නවා කියන නෝනාගේ කතාව ඔයාලා විශ්වාස කරනවද?" එම නිවසේ වසා දමා ඇති නානකාමරය විවෘතකොට ඒ තුළට නෙතු යොමුකරමින් මම ඇසීමි.

"කොහොම වුණත් මම නම් රෑට මේ ගේ ඇතුළට එන්නේම නැහැ. මොකද මට කලින් මේක බලාගෙන හිටපු කෙනාටත් රෑ මේ බාත්රූම් එකේ කරාම ඇරෙනවා ඕනේතරම් අහිලා පිස්සු වැටිලා තියෙනවා. පස්සේ තමයි අපිට ඉන්න අර මුර මඩුව රෙපයාර් කරලා දීලා තියෙන්නේ." ඔහු කීය.

නමුදු එම නිවස සහ වටපිටාව වඩාත් හොඳින් සෝදිසි කරමින් සිටියදී එහි ගෘහ නිර්මාණය සම්බන්ධ එක් සුවිශේෂත්වයක් මගේ නෙත ගැටිණ. එනම් එහි මුල්කොටස ඉදිවී දශක කිහිපයකට පසු එහි දෙවන කොටස ඉදිවී තිබීමය. නමුත් එහි වඩාත් වැදගත් කරුණ වූයේ එම අද්භූත කාන්තාවගේ ක්‍රියාකාරකම් සහිත නානකාමරය එම නිවසේ පසුව ඉදිවූ කොටසට අයත් වීමය. මේ වනවිටත් දක්නට ඇති එහි ජලනල සහ කරාම අනුව ඒවා මීට අඩ සියවසකට පමණ පෙර සවි කරන ලද බව මගේ අනුමානය විය. එමෙන්ම ඒ පිළිබඳව කරන ලද විමසුමකදී තවදුරටත් අනාවරණය වූයේ එම නිවස අද්දර මාර්ගයේ ජල සම්පාදක සහ ජලාපවාහන පද්ධතිය සැකසී තවමත් වැඩි කාලයක් ගතවී නොමැති බවයි.

"හැබැයි මේ වගේ පරණ ජලනල තියෙනකොට හුඟක් වෙලාවට රෑට වගේ ජල පීඩනය වැඩි වෙලාවට ඉබේම ජල කාන්දුවීම් වෙන්න පුළුවන්. ඒ වගේම ඒ ජල සැපයුමත් එක්ක ඇතිවන වායු රික්තක (Vaccum) හඬක් කරාමවලින් මතුවෙන්න පුළුවන්. මේ ගෙදර තියෙන්නේ ප්‍රධාන පාරේ ඉඳන් මීටර් සීයක් විතර දුර හින්ද රෑට වාහන ශබ්දෙත් අඩු හින්ද ඒ ශබ්ද ලොකුවට මතුවෙන්නත් ඉඩ තියෙනවා." මම ඒ නිවස බලාගන්නා තරුණයාට කීවෙමි.

"දැන් මේ හොල්මන් කතාවේ හැටියට මේ බාත්රූම් එකෙන් ඔය වගේ ශබ්ද එන්නේ ඔය කියන අද්භූත කාන්තාව රෑට බාත්රූම් එකේ කරාම අරින නිසානේ. ඒත් හරියට බැලුවොත් ඒ කාන්තාව ඝාතනයට ලක්වෙන කාලේ මෙතන බාත්රූම් එකක් තිබිලා නැහැනේ. ඒ වගේම මං හිතන්නේ මේ වතුර ලයින් එක පාර අයිනේ වතුර මීටරේ ළඟ තියෙන කරාමෙන් වහලා දැම්මොත් ඔය හොල්මනුත් ඉබේම නවතින්න ඉඩ තියෙනවා." මා එම තරුණයාට කී මුත් ඔහුගේ මුහුණින් එතරම් සතුටක් පළනොවන අයුරු මට කදිමට නිරීක්ෂණය විය.

නමුදු ඒ සම්බන්ධයෙන් එම නිවසේ අසල්වැසියාගෙන් ලද තොරතුරකට අනුව මට ඒත්තු ගිය එක් කරුණවක් විය. එනම් යම් හෙයකින් ඒ හොල්මන්වලට බිය නොවන කිසිවකු ඒ නිවස සහ පොල් අක්කර තුන මිලදී ගතහොත් එය බලා කියාගන්නා තරුණයාගේ තාවකාලික රැකියාව එතැනින්ම නිමාවන බවය.

ඒ අනුව ඒ නානකාමරයේ අද්භූත රූමතියගේ හොල්මන් කතාව රාත්‍රී කාලයට ඉබේ ජල කාන්දු වන පැරණි ජලනල පද්ධතිය මුල්කොටගත් පසුකාලීන රසවත් ගැමි පරිකල්පනයක් බව මගේ වැටහීමය.

# පුතාට මොනාහරි වුණොත් අපිත් ඉඳලා වැඩක් නෑ

දස මාසයක් කුසේ තියන් ඉඳලා පුංචි පැටියව මේ ලෝකෙට බිහිකරාට පස්සේ අම්මෙක්ට ඊටත් වඩා සතුටක් කොහෙන්ද? අම්මට විතරක්ද තාත්තෙක්ටත් දරුවෙක් කියන්නෙ රටක්, රාජ්‍යයක්. පස්සේ ඉතින් ඒ අම්මා තාත්තා දෙන්නා ඇඟිලි ගනින්නේ පුංචි එකා හිනාවෙන හැටි බලන්න. බබා මුලින්ම මුනින් අතට පෙරළෙන දවස තවත් විශේෂයි. එතැනින් ගියාම බඩගාන හැටි, දණගාන හැටි, වැටි වැටී ඇවිදින හැටි බලන එක අම්මලාගේ හීන. හැබැයි ඒ අහිංසක ආසාවල් ඉෂ්ට කරගන්න බැරි අම්මලා තාත්තලත් ඕනතරම් මේ රටේ ලෝකේ ඉන්නවා. එල්.පී.සඳමාලියි, ඊ.පී. උපුල් ප්‍රියංකරයිත් ඒ වගේ දෙමාපිය යුවළක්.

"දරුවා ඉපදුණ වෙලේ අපි දෙන්නම ගොඩක් සතුටු වුණා. ඉපදුණ දවසෙම පුතා වර්ධනය නොවෙන බබෙක් කියලා ඩොක්ටර්ස්ලා කිව්වහම අපේ මුළු ලෝකෙම කඩාගෙන වැටුණා."

බලන්ගොඩ, නයිගල ඉන්න සඳමාලිලාගේ මේ චූටි පුතාට දැන් අවුරුදු තුනයි. පුතාගේ නම ගයන්ත වින්දිල. වෛද්‍යවරු කියන විදියට පුතාට තියෙන්නේ සින්ඩ්‍රෝම් කියන ලෙඩේ. මේ ලෙඩේ හැදෙන බබාලගේ වර්ධනය හොරයි.

"පුතා හරිම දුර්වලයි. දරුවගේ හදවතේ කපාල එහෙමත් දුර්වලයි. ඉපදුණු දවසේ ඉඳලා ඉන්නේ ඇඳේ. දරුවට ඝන ආහාර කන්න බෑ. බොන ජාති විතරයි. ඒවත් දෙන්නේ නහයට බට දාලා. පුතා කතා කරනවා, ඇවිදිනවා දකින්න අපිත් හරි ආසාවෙන් හිටියේ. අඬනවා ඇරෙන්න දරුවට ඒ කිසි දෙයක් කරන්න බෑ."

ඒ හිතේ කැකෑරෙමින් තියෙන වේදනාව සඳමාලි වචනවලට හැරෙව්වේ කඳුළුත් එක්ක. දරුවන්ගේ හිනාව දැකලා ඊට වඩා හිනාවෙන්න දෙමාපියන්ට පුළුවන් වගේම දරුවෝ අඬද්දි ඊටත් වඩා කඳුළු හෙලන්නත් ඒ උදවියට පුළුවන්.

"පුතාට ලොකු ඔපරේෂන් වගයක් කරන්න තියෙනවා කියලා ඩොක්ටර්ස්ලා කිව්වා. හැබැයි ඒවා කරන එකත් ගොඩාක් අවදානම්ලු. ඒවගෙන් පුතාගේ ජීවිතේට



අනතුරක් වුණත් වෙන්න පුළුවන්ලු. ඒ නිසා ඒ ඔපරේෂන් එක කරනවද නැද්ද කියලා අපිට නම් හිතාගන්න බෑ. මොකද පුතාට මොනවා හරි දෙයක් වුණොත් අපිත් ඉඳලා වැඩක් නෑ."

සඳමාලිගේ සැමියා උපුල්ට ස්ථිර රැකියාවක් නෑ. ඔහු පවුල නඩත්තු කරන්නේ කුලී වැඩ කරලා. උපුල්ට හැමදාම කුලී ලැබෙන්නේ නැතිලු. අනික කුලියක් කෙරුවට අස්ප ගණන් අතට ලැබෙනවා කියලද. ඉතින් වින්දිල පුතාගේ අසනීපයත් එක්ක මේ වෙනකොට ඔවුන් ගෙවන්නේ බොහොම දුක්ඛිත තත්ත්වයක්.



"ඇඟට හරියට කෑමක් බීමක් වැටෙන්නේ නැති හින්ද පුතා හරි දුර්වලයි. ISOCAL වර්ගයේ කිරිපිටි දෙන්න කියලයි වෛද්‍යවරු කියන්නේ. මුලදි නම් අමාරුවෙන් අපි ඒවා අරගත්තා. බඩු ගණන් ගියාට පස්සේ ඒ පිටි එකත් දැන් තුන් හාරදහට මිල ගිහින්. එච්චර සල්ලියක් නැති හින්ද දැන් අපි පුතාට දෙන්නේ වෙන පිටි ජාතියක්. අර වගේ පෝෂණයක් ඒකෙන් පුතාට ලැබෙන්නේ නෑ. අනික ඒකත් දැන් එක්දස් ගාණක් වෙනවා. ඒ පිටි එක වුණත් දෙන්න පුළුවන් දවස් තුනයි."

ඇය එහෙම කිව්වේ ලොකු වේදනාවකින්.



**පුතාට පෝෂණේ ලැබෙන්න නම් දෙන්න ඕනේ ISOCAL කියන පිටිලු. ඒවා දැන් ගොඩක් ගණන් නිසා දෙන්නේ වෙන පිටි ජාතියක්**

දරුවෙක්ගේ ඇඟට හරි පෝෂණයක් නොවැටෙද්දි බඩපපුව දන්න නොගන්නේ මොන අම්මගෙද?

"අපිට තව පොඩි දුවෙක් ඉන්නවා. අසනීපෙන් ඉන්න පුතාට එයත් හරි ආදරෙයි. මං ලොකුවෙලා කොහොම හරි පොඩි මල්ලිව සනීප කරගන්නවා කියලයි එයා කියන්නේ."

පුංචි දෝණිගේ ඒ බලාපොරොත්තුව ඉෂ්ට වෙන දවසක් එනවානම් කියලයි සඳමාලි එහෙම කියද්දි අපිට හිතුණේ. අපි සඳමාලිත් එක්ක ඔහොම කතා කරද්දිත් වින්දිල පුතා මහා හයියෙන් අඬනවා.

"අසනීප දරුවෙක් වුණත් අපිට අපේ පුතා මැණිකක්. පුතාට ISOCAL වර්ගයේ කිරිපිටි දෙන්න පුළුවන් නම් මීට වඩා ටිකක් පණගහලා ඉන්න එයාට පුළුවන් වෙයි. මේක කාටත් අමාරු කාලයක්. ඉතින් කාටවත් කරදර කරන්න අපිට බැහැ. ඉතින් පුළුවන්කමක් තියෙනවා නම් විතරක් පුතාට කිරිපිටි ගන්න උදව් කරන්න. ඒක මේ වෙලාවේ අපිට කරන ලොකු උදව්වක්."

සඳමාලි ඉල්ලන්නේ පුතාට කිරිපිටි ගන්න උදව්වක්. පුංචි වින්දිල පුතා වෙනුවෙන් පුංචි රුපියල් සීයකින් හරි උපකාරයක් කරන්න පුළුවන් නම් මේ වෙලාවේ ඒක ඒ අයට මහමෙරක්. පුංචි වින්දිල පුතාට උදව්වක් කරන්න කැමති නම් 0715316799 සඳමාලිගේ දුරකතනයට කතා කරන්න.

■ රුවන් එස්.සෙනවිරත්න




**‘කැතරින් නයිට්’ (Katherine Knight) ඔස්ට්‍රේලියානු ජාතික කාන්තාවක්. හැබැයි ඇය ගැන දන්න උදවියට නම් ඇගේ නම ඇහෙද්දිත් දැනෙන්නේ අමුතු තාලයේ බයක්. ඒ මීට වසර විස්සකට කලින් ඇය සිදුකරපු බිහිසුණු අන්දමේ අපරාධයක් හින්දා. තමන්ගේ සැමියව මරලා උයන්න පුළුවන් මොන බිරිඳටද? කැතරින් නයිට් කියන්නේ ආන්න ඒ ජාතියේ බිරිඳක්. ලෝකයේම අවධානයට ලක්වුණු ඇගේ කතාව තමයි මේ.**



කැතරින් ජෝන් ප්‍රයිස් සමග

# පොලිසියෙන් යද්දි කැතරින්, ජෝන්ව මරලා උයලත් ඉවරයි

## කැතරින් නයිට්

ඒ කැතරින්ගේ පොඩි වයස. නැත්නම් දඟ වයස. හැබැයි දෙමව්පියන්ගේ තිබුණු නොහොඳ නෝක්කාඩුකම් හින්දා පුංචි කැතරින්ට ඒ වයසෙදිම ළමා නිවාසෙක ජීවත්වෙන්න සිද්ධවුණා. හරි ලස්සන හිනාවක් එක්ක හුරතල් පෙනුමක් තිබුණු හින්දමදෝ කොහෙද කාගෙ කාගෙත් ආදරේ මේ පුංචි එකීට ලැබුණා. ළමා නිවාසේ හිටපු පුංචි උන් අතරින් හොඳටම පතපොතේ වැඩ පුළුවන් වුණෙත් කැතරින්ට. ඒ විතරක් නෙවෙයි කීකරුම දැරිය වුණෙත් කැතරින්. ඉතින් ඔන්න ඔය කරුණු කාරණා එක්ක වතාවක් ළමා නිවාසේ හිටපු හොඳම දරුවා විදියට සම්මානයක් අරගන්නත් පුංචි කැතරින්ට පුළුවන් වුණා.



“හැබැයි මට ලස්සන පුංචි කාලයක් තිබුණේ නෑ. ගෙදර තිබුණු ප්‍රශ්න හින්දා මං හිටියේ ළමා නිවාසයක. ඒත් එතැන ඊටත් වඩා ප්‍රශ්න තිබුණා. සමහර ළමයි ලොකු වෙනකොට මත්පැන්වලට හුරුවුණා. තවත් අය නරක වැඩ කරන්න පටන්ගත්තා. මමත් කීපසැරයක්ම ලිංගික අඩන්තේට්ටම්වලට ගොදුරු වුණා. ඒත් එක්ක මං ලොකු මානසික පීඩනයක හිටියේ. වෙලාවකට මට මං තනිවෙලා වගේ දැනුණා. ඒ වෙලාවට මට දුකක් වෙනුවට ආවේ ලොකු තරහක්.”

එහෙව් වටපිටාවක් එක්ක හැදුනු වැඩුනු කැතරින් ලොකු වෙනකොට ඇයට තිබුණේ එකම ආසාවයි. ඒ කොහොම හරි කරලා වයස අවුරුදු 16ක් වෙනකොට හරක් මරන තැනක හරක් මරන්නියක් විදියට වැඩට යන්න. හැබැයි ඇයට එහෙව් ආසාවක් වැඩෙන්න හේතුව වුණේ පිහිවලට තිබුණු අසීමිත කැමැත්ත මිසක් වෙනින් කාරණාවක් එහෙම නෙවෙයි.

“ඒත් මට ඒ ආසාව ඉටුකරගන්න පුළුවන් වුණේ නෑ. මොකද මං ඩේවිඩ් කෙලට් කියලා තරුණයෙක් එක්ක ආදර සම්බන්ධයක් පටන්ගත්තා.”

1955 අවුරුද්දේ ඉපදුණු කැතරින් ඒ කියපු තරුණයා එක්ක විවාහවුණේ 1976 අවුරුද්දේ. එතකොට ඇයට අවුරුදු 21යි. හැබැයි ඒ විවාහය කට වචනෙන් කියන විදියට සුබ මංගලම් තාලයේ මඟුලක් වුණේ නෑ. කොටින්ම කිව්වොත් මංගල රාත්‍රියේදිම ඒ මඟුල හබක් වුණා. ඒ ඇය ඩේවිඩ්ට නින්ද ගියාට පස්සේ ඔහුගේ බෙල්ල මිරිකන්න ගියපු නිසයි.

“1986 අවුරුද්දේ විතර මට තව ඩේවිඩ් කෙනෙක් මුණගැහුනා. ඒ ඩේවිඩ් සෝන්ඩර්ස්. ඊළඟට මං ජීවත්වුණේ ඔහු එක්ක.”

හැබැයි ඒ මඟුලටත් වැඩි ආයුෂ තිබුණේ නෑ. ඒකටත් හේතු වුණේ කැතරින්ගේ නොහොබිනා වැඩ. හැබැයි කොච්චර නොහොබිනා වැඩ ඉස්සරහදි වුණත් කැතරින්ට ඔළුව පාත්කරගෙන ඉන්නයි ඩේවිඩ්ට සිද්ධවුණේ. ඒ කැතරින් ඔහුට කරලා තිබුණු එක්තරා අනතුර ඇඟවීමක් හින්දා. ඩේවිඩ් ඉදිරිපිටදි බලු පැටියෙක්ගේ බෙල්ල කපලා මරලා ඔහුවත් ඒ විදියටම මරනවා කියන එකයි අනතුරු ඇඟවීම.

“කාලයක් යනකොට මට එයාවත් එපාවුණා. ඊටපස්සේ මං ජෝන් ප්‍රයිස්ට ළංවුණා. එයා ටිකක් ජනප්‍රිය කෙනෙක්. එයයි මමයි ගොඩාක් ආදරෙන් හිටියා.”

වැඩි සෙනේ දබරෙටයි කියන්නවනේ. කොහොමින්හරි ඔය ඉන්න අතරේ හරි අභිරහස් දෙයක් සිද්ධවුණා. ඒ හිටිගමන් ජොන් ප්‍රයිස් අතුරුදන් වුණු එක. ඔහුගේ අතුරුදන් වීම කාටත් වඩා ප්‍රශ්නයක් වුණේ ජෝන් සේවය කරපු රැකියා ස්ථානයට. ඒ හින්දා ඔවුන් පොලිස් පොතේ ඒ ගැන පැමිණිල්ලක් දැම්මා. හැබැයි ඒ වෙනකොටත් වෙන්න ඕන හැමදේම වෙලා ඉවරයි. ඒ කියන්නේ කැතරින් ජෝන්ව මරලා. ඇය ජෝන්ව මරලා නිකන් ඉඳලාත් නෑ. පොලිසිය කැතරින්ගේ ගෙදරට යනකොටත් ඇය හිටියේ ජෝන්ව මස් කරලා රාත්‍රී ආහාරයට ගන්න උයන ගමන්ලු.

“අපි සිද්ධිය වූ ස්ථානයට ගියාම දැක්කා කාමරයක මනුස්සයෙකුගේ ලේ ගඳ ගහන හමක් එල්ලලා තියෙනවා. අපට ඒ ගැන සැක හිතුණා. ඊටපස්සේ වටපිටාව බැලුවා. බලද්දි පෙනුණා ජෝන් ප්‍රයිස්ගේ හමගහපු මළසිරුර. ඒකේ බෙල්ලෙන් උඩ කොටස තිබුණේ නෑ. ටික වෙලාවකින් අපි ජෝන්ගේ හිස කොටස හොයාගත්තා. ඒ වෙනකොටත් ඒක ලිපේ තියලා තම්බලයි තිබුණේ. සිරුරේ සමහර කොටස් එළවලුත් එක්ක කලවමේ උයලා පිඟන්වලට බෙදලා තිබුණා. කැතරින් ඉඳලා තියෙන්නේ ඒවා දරුවොත් එක්ක කෑමට ගන්න. ඇය ඔහුව මරලා තියෙන්නේ පිහිපහර 37ක් ඇනලා කියලා ජෝන්ගේ මරණ පරීක්ෂණයේදි හෙළිවුණා.”

ජෝන්ගේ බිහිසුණු මරණය ගැන පොලිස් වාර්තාවේ ලියැවිලා තියෙන්නේ. එහෙම කියන විදියට එදා කැතරින්ගේ නිවසට ගිය සමහර පොලිස් නිලධාරීන්ට කැතරින්ගේ වැඩ දැකලා මානසික ආබාධ පවා ඇවිත්. මේ අතරේ පොලිසිය දිගින් දිගටම ජෝන්ගේ ඝාතනය ගැන ඇයගෙන් ප්‍රශ්න කළත් ඇය වරද පිළිඅරගෙන නෑ. ඒ හැමවෙලේම ඇය දැඩි කෝපයක් මවාගෙන කියලා තියෙන්නේ මෙහෙම කතාවක්.



**ඔස්ට්‍රේලියානු ඉතිහාසයේ සමාවක් නැතිව ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පළමු කාන්තාව කැතරින්**

“මං ජීවිත කාලය පුරාම ගෘහස්ථ හිංසනයට ගොදුරු වුණු ගෑනියෙක්. ඒ වගේම පොඩි කාලේ ඉඳන්ම විටින් විට වැඩිමල් පිරිමින්ගේ අපයෝජනයට ලක්වුණු ගෑනියෙක්. මට බෑ ජෝන් මැරුව එකට වරද පිළිගන්න.”

ඒ 2001 නොවැම්බර් 8 වැනිදා. එදා තමයි කැතරින්ගේ ඉරණම විසඳුනු දවස. ඒ කියන්නේ ජෝන්ගේ මරණයට ඇයට උසාවියෙන් දෙන දඬුවම තීරණය කළේ එදා. දඬුවම වුණේ කැතරින්ට ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් නියම කරපු එක. දන්නවද ඔස්ට්‍රේලියානු ඉතිහාසයේ සමාවක් නැතිව ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම වූ පළමු කාන්තාව තමයි කැතරින්. ඒකට හේතුව විදියට ජෝන්ගේ නඩුව කතා කරපු විනිසුරු කියලා තිබුණේ මෙහෙම දෙයක්.

“කැතරින් නයිට් කියන්නේ හොඳ කෙනෙක් නෙවෙයි. ඇයගේ කෲර දුෂ්ඨ හැසිරීම නිසා ඇය දයාව අනුකම්පාව වගේ දේවල් ලබන්න තරම් සුදුසු නෑ. නිකන් හරි කැතරින්ව නිදහස් කළොත් ඇය සමාජයේ ආරක්ෂාවට බරපතළ තර්ජනයක් වෙයි. ඒ නිසා තමයි අපි ඇයට සමාවක් නැතිව ජීවිතාන්තය දක්වා සිරදඬුවම් දෙන්න නියම කළේ.”

ඒ කොහොමහරි අමානුෂික අන්දමින් සැමියාව ඝාතනය කරපු කැතරින් අදටත් ඔස්ට්‍රේලියානු බන්ධනාගාරයක සිරබත් කන බවයි දැනගන්න ලැබුණේ. 1955 ඔක්තෝබර් 24 වැනිදා ඉපදුණු ඇයට දැන් වයස අවුරුදු 67ක්. මේ වෙනකොට ඇගේ බන්ධනාගාර ජීවිතයට අවුරුදු 22ක් ගෙවුණත් අදටත් ලැබුණු දඬුවම ගැන ඇයට නම් කිසිම පසුතැවීමක් නැතිලු.

■ රුවන් එස්.සෙනවිරත්න



# ඒවසරයි

බියංකා නානායක්කාර ලියයි

124 කොටස

# ඔයා කැමති නැද්ද ලොකු මල්ලි ජීවිතේ පිළිවෙලක් කරගන්න?

සෙනුකා සරදම් සිනාවෙන් මේනක බණ්ඩාර තෙන්නකෝන් දෙස බලා සිටියේ ඔහු තවමත් දුරකතනයට ඔබාගත් මුහුණින් සිටින නිසාය. දුරකතනයෙන් ඇස් පසෙකට ගන්නට හැදුවත් ආයෙමත් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගෙන් කෙටි පණිවිඩයකි.

'විස්තර ඔක්කෝම රෑට කියන්නම්. නැත්තම් හවස...'

ඒ පණිවිඩයන් කියවූ මේනකගේ දෙතොලේ යන්තම් සිනාවක් ඇඳුණේ ඔහුද නොදැනය. තෙන්නකෝන් බණ්ඩාර පවරා ඇති රාජකාරියේ විස්තරවලට වඩා මේනකගේ හිතට ඇය ගැන විස්තර දැනගන්නට නොඉවසිලිමත් බවක් ඇති වුණේය.

"මං එනවා දැකලා කෝල් එක කලබලේට කට් කළාට හරියන්නෙ නෑ වගේ නේ..."

මේනක පියාගේ පණිවුඩය වසා දමා දුරකතනය සාක්කුවට දමා ගනිද්දී සෙනුකා ඒ සරදම් සිනාවෙන් යුතුවම කීවාය. මේනකට ඒ සරදම නොදැනුණේ ඡායාරූපයේ උන් තරුණිය හදවත කළඹවමින් සිටි නිසාය. දවසක්ද කිරිබත්ගොඩ තිලකවර්ධන රෙදිහලේදී අහම්බෙන් දුටු ඇය යන මග දිගේ ගොස්වත් ඉන්නා තැනක් අල්ලා ගන්නට බැරිවුණේය. මේ නම් පුදුම අහඹු සිදුවීමක් කියා මේනකට සිතුණේය.

"සොරි අක්කා... ටෙලිෆෝන් එක අතේ තිබ්බොත් වැඩක් කෙරෙන්නෙ නෑ. ඔන්න මං ඒක පැත්තකින්ම තිබ්බා..."

මේනක දුරකතනය කලිසමේ සාක්කුවට දමා ගනිමින් සෙනුකා දෙසට හැරුණේය.

"ඔයා එක්ක හරියට කතා කරන්නවත් බැරිවුණා අක්කා..."

එයා ඔයාට ආදරේනම් ඔහොම ජීවිතේ නැති නාස්තිවෙනකල් බලන් ඉන්නෙ නෑ. ඒ කාලේ එයාගෙ බිස්නස් එක හරි ආපහු ඔයා හරහා කොළඹින් පටන්ගන්නවා

මේනක කීවේ ඇත්තටමය.

"මටත් කතා කරන්න බැරිවුණ හින්ද තමයි ඔයා එක්ක කතා කරන්න ආවේ..."

"විශේෂ දෙයක් ගැන නෙවේනේ..?"

"නැත්තෙමත් නෑ..."

"ඒ කිව්වේ..?"

"ඔයා කැමති නැද්ද ලොකු මල්ලි ජීවිතේ පිළිවෙලක් කරගන්න..?"

"දැන් මං පිස්සෙක් වගේද?"

මේනක හිනැහෙමින් කීවේ සොයුරියගේ කතාව නොතේරුනබව බොරුවට පෙන්වමිනි.

"එහෙම නෙවේ... මං මේ දවස් ටිකට දැක්ක දෙයක් කියන්නද තරහ වෙන්නෙ නැත්තම්?"

"ඔයත් එක්ක තරහවෙන්න බෑනේ මගෙ අක්කා හින්ද... කියන්නකෝ..."

"ඔයා තාම ඔයාගෙ ජීවිතේ ඒම් එකක් හිතන්නෙ නැතුව නේද දුවන්නේ..? ඔය වයසට එද්දී ඔයාට නැගිටින්න තියෙන පසුබිමත් එක්ක ඔහොම තැනක නෙවේ ලොකු මල්ලි ඉන්න ඕනි..."

සෙනුකා නිවුණු හඬින් කියාගෙන ගියේ මේනක තෙන්නකෝන්ට හොඳටම දැනෙන්නටය.

"අක්කේ..."

සෙනුකා ඔහුගේ අතින් ඇල්ලුවාය.

"ඉස්සරවෙලා මං කියන එක අහලා ඉන්නකෝ. ඔයා ඉස්සෙල්ලා ඔයාගෙ හිතෙන් අහන්න ඔයා කරන්න කැමති දේශපාලනේද බිස්නස්ද කියලා. ඒත් නැත්නම් රස්සාවක් කරන්නද, ඒ කරන්නේ ලංකාවෙද පිටරටද කියලා. ඔයාට ඒ තුනෙන් කැමති එකක් තෝරගෙන ඉස්සරහ ගැන හිතන්න පුළුවන්. ඒත් ඔයාට ඒවයින් එකක් පහසුවෙන්ම තෝරගන්න පුළුවන්කම තියෙද්දී ඔයා ඒ ගැන හිතන්නෙ නෑ..."

සොහොයුරිය කියන්නේ ඇත්ත කියා මේනක බණ්ඩාරට මුල්වරට හිතුණේය.

"බිස්නස් කළාට නම් කමක් නෑ. ඒත් හරියට පවත්වගෙන යන්න පුළුවන් බිස්නස් එකක්. ඇත්ත කිව්වොත් ලොකු මල්ලී දේශපාලනේ කරන එක නම් හොඳට ජීවත්වෙන්න හිතන කෙනෙකුට ගැළපෙන්නෙ නැතිම රස්සාවක්.."

සෙනුකා කතා කරද්දී උත්තර නොදී මේනක සිතුවේය. සොහොයුරිය කියන්නා සේ දේශපාලනය ගැන මේ වෙද්දී මේනකගේ හිතේ ආසාවක් නැත. අවුරුදු ගාණක් තිස්සේ අප්පච්චිගේ දේශපාලන වැඩ වෙනුවෙන් පස්සෙන් ගියද මේ වෙනතුරු සංවිධායකකමක් හෝ ඔහුට ලැබුණේ නැත. ඒ නිසා මේ ආණ්ඩුව පවතින තුරු පලාත් සභා මන්ත්‍රීකමකටවත් ඉල්ලන්නට නොලැබෙන බව මේනකට තේරුම් ගොස් දැන් දෙතුන් මාසයකි.

"ලොකු මල්ලී..."

නිශ්ශබ්දවම හිතන මේනකට සෙනුකා කතා කළාය.

"මේ කලබලේට හිතන්න කියලා නෙවේ මං කියන්නේ. ඔයා හෙමිහිට හිතන්න. හිතලා හොඳ දෙයක් තීරණේ කරන්න. ඔයාට පිටරට රස්සාවකට යන්න ඕනි නම් කියන්න. මං උදව් කරන්නම්. අප්පච්චිටත් ඕන ඔයාගෙන් වැඩ ටික කරගන්න මිසක් ඔයාගෙ අනාගතේ ගැන බලන්න නෙවේ ලොකූ. මට දුකයි ඇත්තටම ඔයා ගැන. එයා ඔයාට ආදරේනම් ඔහොම ජීවිතේ නැති නාස්තිවෙනකල් බලන් ඉන්නෙ නෑ. ඒ කාලේ එයාගෙ බිස්නස් එක හරි ආපහු ඔයා හරහා කොළඹින් පටන්ගන්නවා. මොකද අප්පච්චිට සල්ලි නැත්තෙ නෑනේ..."

ඒ කතා සියල්ල ඇත්ත කියා මේනකට වැටහෙන්නේ දැන්ය. මේ ඇත්ත ඉස්සර තේරුම්ගියේ නැතුවා පමණක් නොව ඒ බැව් කවුරුත් තේරුම් කර දුන්නේද නැත. මුදල් ඕනෑ වූ විට තෙන්නකෝන් බණ්ඩාර ඇතිතරම් සල්ලි දුන්නේය. අවුරුදු ගාණක් ඒ සල්ලි මිතුරන් හා රාත්‍රී සමාජශාලා ගානේ ගොස් වියදම් කළා මිස ඒවායින් කළ වැදගත් දෙයක් ඔහුට මතක් වූයේ නැත. තෙන්නකෝන් බණ්ඩාර ඔහුට දුන් කඩවත නිවස විකිණූ සල්ලිවලට වූයේත් ඒ ආනිසංසයමය. අප්පච්චිගේ උපදේශක තනතුරකට නම රිංගවා ඇති නිසා ඉලක්කම් පහක වැටුපක් අතට තවමත් ලැබෙන බව ඒ අතරේ මේනකට මතක් වුණත් එය සොහොයුරියට කියන්නට ගියේ නැත.

ඉහට උඩින් සෙවනට ඇති ගසට කොහෙන්දෝ ඉගිල ආ ගිරවුන් දෙන්නෙක් සද්දෙට මොනවාදෝ කියවා ගනිති. කොච්චර ගිරවුන් දැක තිබුණත් සෙනුකාගේ වගේම මේනක තෙන්නකෝන්ගේ ඇසුත් ගිරවුන් ළඟ නැවතුණේය.

"මම වෙනස් වෙන්න කැමතියි. හැබැයි ඒ කොතැනින්ද කියලා තමයි හිතන්න ඕනි..."

සෙනුකාට අවශ්‍ය වූ තැනට මේනක තෙන්නකෝන් පැමිණ සිටියේය. ඒ නිසා කල් නොමරා ඇය කෙළින්ම හිතේ ඇති දේ කියාගෙන ගියාය.

"ඔයා දැන්ම මැරි කරන්න අදහසක් නැද්ද..?"

"තියෙනවා. ඒත් මනමාලියක් කෝ?"

මේනක බණ්ඩාර තෙන්නකෝන් දෙඇස් පුංචි කරමින් කපටි සිනාවක් පෑවේය.

"ඔයාගේ ගර්ල් ෆ්‍රෙන්ඩ්ස්ලා ගොඩේ කසාද බඳින්න තරම් හොඳ කෙනෙක් නැද්ද..?"

හිටිගමන් සෙනුකා ඇසුවේ මේනක සිමෙන්ති බංකුවත් සමඟ උඩ ගොස් බිම වැටෙන ප්‍රශ්නයකි.

"නෑ කියමුකෝ."

"හරි, එහෙනම්... ඔයා චතූ බඳින්න කැමතිද?"

මේනකගේ ඇස් ගෙඋයනේ පිවිසුම් දොර වෙත යොමුවුණේය. ඒ චතුමිණී ඒදැයි කියාය. සෙනුකා ප්‍රශ්නෙට උත්තරයක් අපේක්ෂාවෙන් ඔහු දෙස බලන් සිටියේය.

"මං කැමති වුණත් චතූ මට කැමති නෑ..."

"ඔයා දන්නෙ කොහොමද?"

"එයාගෙ උනන්දුව මල්ලිට."

"හරි. මං ඒක වෙනස් කළොත්..?"

"බලමු..."

"බල බල ඉන්න බෑ. මට පොඩි කාලයයි තියෙන්නේ. පොඩි මල්ලිට ගෑනු ළමයෙක් ඉන්නවා බඳින්න. ඒ නිසා චතූගෙ හිතේ තිබ්බට ඒක වෙන්නෙ නෑ..."

ඒ ගැන ඊට වඩා ඔවුන්ට කතා කරන්නට ඉඩක් නොලැබුණි. පිවිසුම් දොරෙන් ගෙඋයනට ඇතුළු වූ චතුමිණී අනවසරයෙන්ම විත් ඔවුන් ඉඳගෙන සිටි බංකුවෙන් ඉඳගත්තාය. ඒ මොහොතෙ මේනකගේ හිතට අපහසුවක් ගෙන ආවෙන්, ඔහු වැඩක් ඇති බව කියා එතැනින් නැගිට ගියේය. චතුමිණී සෙනුකාගේ අතින් අල්ලාගෙන කිසිවක් කියන්නට සැරසුණාය.

"තේනුකගෙ උපන්දිනේ ලබන සතියෙ. ඔයා යන දවසට කලින් දවසෙ. දුමුද අපි එයාට සප්‍රයිස් පාටියක්..?"

චතුමිණීගේ අහිංසක යෝජනාවට සෙනුකා අහුවුණාය.

ලබන සතියට



අත්තනායක එම්. හේරත්

රත්තරන් දුවේ

# දුවගේ අරමුදලට ලැබිච්චි ලක්ෂ ගාණක සල්ලිත් මේ දිසාපාමොක් විදුහල්පතිනිය හොරකම් කළා. ඉස්කෝලෙදිත් කෙනෙහිලිකම් කරලා අධ්‍යාපනයත් එපා කෙරෙව්වා

# ගුරුවරයා කිව්වත් හැම එකටම එහෙයි කියන්න ඕන නෑ මගේ දුවේ!

මේ කියන්න යන කතාව මගේ දුවලට විතරක් නෙවෙයි දුවලගෙ තාත්තලාට වගේම විදුහල්පතිවරුන්ටත් වටිනවා කියලයි මට හිතෙන්නේ. මේ සිද්ධිය සිදුවුණේ කොළඹින් ටිකක් දුර පළාතක ඉස්කෝලෙක.

ඒ ගමේ අම්මායි, තාත්තායි, පුංචි දුවෙකුයි හිටියා. මේ පවුල බොහොම සමගියි. ඒ දුවට හොඳට ඉගෙනගන්න පුළුවන්. දවසක් උදේ ඉස්කෝලේ යමින් හිටිය දුවගේ ඇඟේ කාරෙකක් හැප්පුණා. ඉක්මනින්ම රෝහලට ගෙනිච්චත් ඇගේ පාද දෙක බේරගන්න බැරි වුණා. ඒ දූට තද කොන්දේ අමාරුවකුත් හැදුනා. පුදුමය ඒක නෙවෙයි. සිද්ධිය වෙච්චි හැටියේ දුවගේ තාත්තා මේ දෙන්නව දලා ගියා. ඉතින් දුවේ ඒ අම්මයි ආබාධිත දුවයි තනිවුණා. ජීවත්වෙන්න කිසිම ක්‍රමයක් තිබුණෙත් නැහැ. ඒත් මේ අම්මා රෝද පුටුවක් හොයාගෙන උදේ හවා දුවව ඉස්කෝලේ ගෙනිච්චා. අම්මා දුක සේ දෙන්නගෙ බඩවියතටයි දුවගේ අධ්‍යාපනයටයි සල්ලි හොයාගත්තා. අම්මා කරන කැපකිරීම දැකලා දුවත් හොඳට ඉගෙනගත්තා. අවසානෙදි සියලු කරදර මැද ඇය A සාමාර්ථ නවයක් එක්ක සාමාන්‍ය පෙළ සමත් වුණා. දරුවගේ හපන්කම දැකපු ගුරුවරයෙක් මුල්වෙලා පුංචි ගෙදරක් හදලා මේ දෙන්නව ඒකේ පදිංචි කෙරෙව්වා. ඒ දුවගේ ඉගෙනීම ගැන විදුහල්පතිනියත් දැනගෙන හිටියා. ඇය මැදිවෙලා ඒ දුවගේ නමින් අරමුදලක් ආරම්භ කරා. ඒකට ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එහෙමත් ආධාර කරා. අරමුදලේ ආදයම දිනපතාම වැඩිවෙන්න ගත්තා. මුළු මුදල ලක්ෂ දහය දෙළහ දක්වා ඉහළ ගියා. ඒත් ඒ මුදලින් සත පහක්වත් විදුහල්පතිනිය දුවට හෝ අම්මට දුන්නේ නැහැ. විදුහල්පතිනිය ඒ අම්මයි දුවයි එක්ක අමනාප වෙලා වෙනස්කම් කරන්න පටන්ගත්තා. මේ අසාධාරණය ගුරුවරු දැනගෙන හිටියා. ඒත් විදුහල්පතිනිය දේශපාලන බලවතෙක් එක්ක හිතවත්. අම්මා නිතර නිතර විදුහල්පතිනිය හමුවී ඉහත මුදල ගැන කිව්වත් ඉන් සත පහක්වත් ඒ දුවට ලැබුණේ නැහැ.

ඒ අතරේ එක්තරා රූපවාහිනී නාලිකාවක පාසල් තරඟ වැඩසටහනක් පටන්ගත්තා. ඉස්කෝලේ සිංහල, ඉංග්‍රීසි භාෂාවන් ගැන දැනුම තියෙන ගුරුතුමියක් හිටියා. තරඟයට ළමුන් පුහුණු කිරීම පැවරිලා තිබුණෙත් ඇයට. මේ කණ්ඩායමේ අර ආබාධිත දුවත් හිටියා. හිටියා විතරක් නෙමෙයි භාෂා උච්ඡාරණයට තිබුණු දක්ෂතාවය නිසා දුවව මේ කණ්ඩායමේ නායිකාව බවටත් පත්කරලා තිබුණා. කොහොමහරි අවසානයේදි තරඟයෙන් දිනුවේ මේ දුවගෙ කණ්ඩායම. දුව කණ්ඩායමේ නායිකාව වෙච්චි නිසා ලංකාවම පරාද කළත් මේ කණ්ඩායම ගැන ඉස්කෝලේ ගාව බෝර්ඩ් එකක් ගහන්න විදුහල්පතිනිය කැමති වුණේ නැහැ. ඒ විතරක් නෙමෙයි අර තරඟය මෙහෙයවපු ගුරුවරියව පවා ඇය ඈත පළාතකට මාරු කරලා එළවලා දැම්මා. අධ්‍යාපන අමාත්‍යංශයේ පුද්ගලයෙකුත් මේ වැඩවලට විදුහල්පතිනියට හරි හරියට උදව් කළා.

කලින් දුවගේ අරමුදලට ලැබිච්චි ලක්ෂ ගාණක සල්ලිත් මේ දිසාපාමොක් විදුහල්පතිනිය හොරකම් කළා. ඉස්කෝලෙදිත් කෙනෙහිලිකම් කරලා අධ්‍යාපනයත් එපා කෙරෙව්වා. සියල්ල අවසානෙදි මේ දුව අධ්‍යාපනය නතර කළා.

ඔහොම ටික කාලයක් ගත වුණා. ආබාධිත දුවව තලන්න විදුහල්පතිනියට උදව් කරපු මනුස්සවත් අනතුරකට ලක්වුණා. දැන් ඔහු ආබාධිතයි. ඒත් විදුහල්පතිනිය කළ පාප කර්මයට තවම ප්‍රතිඵල ලැබුණේ නැහැ. හැබැයි ඒ නෝනටත් දිට්ඨධම්මවේදය පලදෙන බව විශ්වාසයි.

දරුවන්ගේ අනාගතය හදන ගුරුවරු වගේම දරුවන්ගේ අනාගතය කාබාසිනියා කරන මේ වගේ දිසාපොමොක් ගුරුවරුන් ලංකාවේ ඉන්නවා. වාසනාවකට මට නම් මගේ ජීවිතේදී එහෙම ගුරුවරු මුණගැහිලා නැහැ දුවේ. ඉගෙනගන්නකොට මගේ දූලටත් එහෙම ගුරුවරු මුණගැහෙන්න පුළුවන්. හිත් රිදෙන කතා කියන, දරුවන්ට පද හදන ගුරුවරු මුණගැහුනොත් ඒ වචනවලින් හිත් රිද්දගන්න එපා දුවේ. ඒවා අහලා මගේ දුවලා අධ්‍යාපනය නතර කරන්න ඕනාත් නෑ. කවුරු කොහොම කිව්වත් අපිට අන්තිමට ඉතුරු වෙන්නේ ඉගෙනගත්ත දෙයක් විතරක් මගේ දුවේ.

තව දෙයක්. මේ ළඟදි තමන්ගේ ටියුෂන් පංතියට ඉගෙනගන්න එන මල් වගේ පුංචි දූලා 16 දෙනෙක් අපයෝජනය කරපු කලුතර ගුරුවරයෙක් අත්අඩංගුවට ගත්තා. මේ ගුරුවරයා මේ දූලව අපයෝජනය කරලා නිකන් ඉඳලාත් නැහැ. ඒවා වීඩියෝ කරලා තව ළඟත් තියාගෙන. මගේ දූලා ගොඩදෙනෙක්ට ඔය කාලෙදි ගුරුවරයාව පේන්නේ වීරයෝ වගේ. ඇත්ත, ගුරුවරු කියන්නේ දරුවන්ගේ වීරයෝ තමයි. හැබැයි ඔය අතරේ වීර වේශයෙන් ඉන්න දිසාපාමොක්වරුන් ඉන්න පුළුවන්. මොකද ගුරවරු කියන්නේ මිනිස්සුන්ටනේ. ඉතින් පුතේ ගුරුවරයෙක් වුණත් නරක යෝජනාවක් ගෙනාවොත් ඒ හැමදේකටම මගේ දූලා එහෙයි කියන්න අවශ්‍ය නැහැ. හොඳ නරක තෝරගන්න මගේ දූලට පුළුවන් වෙන්න ඕන මගේ දුවේ.

අත්තනායක එම්. හේරත්



**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**

# මං කාටත් වඩා මට ආදරෙයි



**ඇය සමාජයේ පිළිගත් රැකියාවක් කරන සහ රැකියාවේදී වගේම අනෙකුත් කාරණාවලදී බොහොම ඍජු තීරණ ගන්න පෞරුෂයක් තිබුණු කෙනෙක්. හැබැයි මේ සම්බන්ධතාවය තුළදී ඇගේ ඒ පෞරුෂය හීනවෙන හැටි යම් යම් අවස්ථාවලදී මම දැක්කා.**

අද මාව කියවන ඔයාලා එක්ක මුලින්ම මගේ සතුටු කාරණාවක් බෙදාගන්න ඕන කියලා හිතුණා. මම 'ධරණී' පුවත්පතට ලිපි ලියන්න පටන් අරගෙන මේ මාසෙට අවුරුදු දෙකකුත් ගෙවුණා. සමාජ මාධ්‍යවල මගේ අත්දැකීම් ලියලා ආදරය, සතුට බෙදමින් ඉන්න වෙලාවක, ඒ අත්දැකීම් මුද්‍රිත මාධ්‍යයෙන් මිනිස්සු අතරට ගෙනයන්න මට අවස්ථාව දුන්නේ 'ධරණී' පුවත්පත. ඉතින් ඒ නිසා ධරණී කර්තෘ මණ්ඩලයට වගේම මාව කියවන ආදරණීය පාඨක ඔයාලා හැමෝටමත් ගොඩක් ස්තුතියි කියන්න මම මේක අවස්ථාවක් කරගන්නවා.

මං හරි ආසයි මට ආදරේ කරන්න. අපි කාට කොහොම ආදරේ කළත්, අපි අපිට ආදරේ කරන්න දැනගෙන හිටියෙ නැත්නම්, දුකක් වේදනාවක් දැනුණ වෙලාවක අපිට අපිව දරාගන්න, බලාගන්න අමාරු වෙනවා. කොටින්ම අපිට අපිව නැතිවෙනවා. ගොඩක් ගැහැනු වගේම පිරිමිත් තමන්ට ආදරේ කරන්න නොදන්න නිසයි, මානසිකව පීඩා විඳලා ජීවිතේ අතරමග අත්හැරලා දන්නේ.

මගේ මිතුරියක් හිටියා, එයා එවන කෙටි පණිවිඩයකින් පවා එයා ඉන්නේ සතුටෙන්ද දුකෙන්ද කියලා කියන්න පුළුවන්කමක් මට තිබ්බා. ඉතින් ගොඩක් දවස්වලට මං ඇහුවාම එයා හිටියේ දුකෙන්. හැමදේම එපාවෙලා. එයා ජීවිතේ වැඩි කාලයක් කැප කරලා තිබුණේ එයාගේ ආදරවන්තයා වෙනුවෙන්. ඔහු කැමති විදියට ජීවත් වෙන්න, ඔහු අකමැති කිසිම දෙයක් නොකර ඉන්න සහ ඔහුගේ සතුට වෙනුවෙන් විතරක් වැඩ කරන්න මගේ මිතුරිය පේ වෙලා හිටියා. ඇය සමාජයේ පිළිගත් රැකියාවක් කරන සහ රැකියාවේදී වගේම අනෙකුත් කාරණාවලදී බොහොම ඍජු තීරණ ගන්න පෞරුෂයක් තිබුණු කෙනෙක්. හැබැයි මේ සම්බන්ධතාවය තුළදී ඇගේ ඒ පෞරුෂය හීනවෙන හැටි යම් යම් අවස්ථාවලදී මම දැක්කා.

ඒ සම්බන්ධතාවය රැකගැනීම හෝ අතහැර දැමීම ඇගේ පුද්ගලික තීරණයක් නිසා ගැටලුවක ඉන්න හැමවෙලේම මම කළේ මගේ උපරිම ආදරේ දීලා මිතුරිය සනසපු එක.

හැබැයි මේ ළඟදී ටිකක් වෙනස් විදියේ දෙයක් සිද්ධ වුණා. දැන් සතියකට විතර ඉහතදී වුණු කෙටි පණිවිඩ හුවමාරුවකදි එයා හරිම ලස්සන දෙයක් මට කිව්වා. 'මොන ප්‍රශ්නේ තිබ්බත් දැන් මං මාව අතාරින්නැතුව ඉන්න උත්සාහ කරනවා, වෙනදට මෙහෙම ප්‍රශ්න වෙද්දී මුලින්ම මං මාව අත්හරිනවා. ඒත් දැන් මං මට ආදරෙයි. පුළුවන් තරම් හොඳින් මාව බලාගන්නවා. නොකා නොබී ඉන්නේ නෑ ඉස්සර වගේ' ඒ වචන ටික මගේ හිතට පුදුම සතුටක් ගෙනාවේ. එහෙම ගැහැනු තමන්ව ආදරෙන් ගොඩනගාගන්න ගමන් එයාලා වටේ ඉන්න අයට ගොඩනගාගන්න ලොකු උත්තේජනයක් වෙනවා. ඒ සුබවාදී සිතිවිල්ලම ප්‍රශ්නයට අවශ්‍ය උත්තරය හොයාගන්න එයාට පාර කියාවි කියන සතුට මට දැනුණා. ඒක මං එවලෙම එයාටත් කිව්වා.

තමන්ට ආදරේ කරනවා කියන්නේ ආත්මාර්ථකාමීකමට නෙවෙයි. තමන්ට ආදරේ කරන්න, තමන්ව විඳින්න දන්න අය තමයි අනිත් අය සතුටු කරන්නත් හොඳින්ම දන්නේ. මොකද තමන්ට ආදරේ අයට කා එක්කවත් ගැටීමක් නෑ, තරගයකුත් නෑ. තව කෙනෙක්ට අයපතක් වෙන්න කියලා වචනෙකින්වත් හිතන්නේ නෑ. තමන්ට ආදරේ කරන්න දන්න කෙනෙක් ගාව ආත්ම විශ්වාසය, ආත්ම ශක්තිය උපරිමයට වර්ධනය වෙලා තියනවා. ඒ නිසා එයාලාගේ පෞරුෂය ඕනම පිරිසක් අතර හරිම ලස්සනට බැබලෙනවා.

මේ ලෝකේ ජීවත්වෙන හැම මනුස්සයෙකුටම ප්‍රශ්න තියෙනවා. එකක් ඉවර වෙද්දි තව ප්‍රශ්න මැවෙනවා. සමහර අය ඒවාට මානසිකව වැටෙනවා, සමහර අය හොඳින් ප්‍රශ්නවලට මුණ දීලා ඒවා ජීවිතේ හොඳම පාඩම් කරගෙන ඉස්සරහට යනවා. ප්‍රශ්න ඇතුළේ හිරවෙලා තමන්ව නැති කරගන්නේ නැත්තේ තමන්ට ආදරේ මිනිස්සුයි. එයාලට හැමදේටම වඩා වටින්නේ මානසික සුවය. ඒ වෙනුවෙන් එයාලා හොඳම ක්‍රියාමාර්ග අරගෙන තමන්ට වටිනාකම්, ගෞරවය නොලැබෙන තැන්වලින් ඈත්වෙලා හිතේ සැනසීම රැකගන්නවා.

මෙච්චර තමන්ට ආදරේ කරන්න කියද්දි ඒක කරන්නේ කොහොමද කියලා ඔයාලා බලයි.

මං මට ආදරේ කරන්නේ කොහොමද කියලා කියන්නද? මං උදේට ඇහැරුණාම මාව පිරිසිදු කරගෙන, ලස්සන ඇඳුමක් ඇඳලා කණ්ණාඩියෙන් මගේ දිහා බලනවා. එහෙම කරද්දි මට පුදුම සතුටක් දැනෙනවා. මං මට ආදරෙයි නම් කරන්න ඕන වැදගත්ම දේ මාව පිරිසිදුව ලස්සනට තියාගන්න එකයි කියලා හැමවෙලේම මගේ ඔළුවේ තියෙනවා. දවසේ පුංචි වෙලාවක් මං වෙනුවෙන් වෙන්කරලා මං ආසා සිංදුවක් අහනවා. නැත්තම් කෑම හදන වීඩියෝ එකක් කරනවා. හදන කෑම වල පින්තූර ගන්නවා. තව කෙනෙක් දිරිගන්වන ලිපියක් ලියලා සතුට බෙදනවා. මේ දේවල්වලින් මං මාව සතුටු කරගන්නවා. මගේ විනෝදාංශ උයන එකයි, ලියන එකයි, සිංදුවක් කියලා සතුටු වෙන එකයි.

මටත් ජීවිතේ ප්‍රශ්න එනවා. හැබැයි මං මට ආදරේ නිසා, මාව කඩාවට්ට ගන්නේ නැතුව, මනස අවුල් කරගන්නේ නැතුව ඒ දේවල් හොඳම විදියට විසඳගන්න මම දන්නවා. නොකා නොබී, නාන්නේ නැතුව, කාමරේ අස්සට වෙලා, හිත් රිද්දපු මිනිස්සුන්ට, ප්‍රශ්න වලට වෛර කර කර ඉන්නෙ ඇත්තටම තමන්ට ආදරේ කරන්න නොදන්නා මිනිස්සු. මාත් ඉස්සර එහෙම කෙනෙක් නෙවෙයි. මට ආදරේ කරන්න කියලා දුන්නේ මගේ පවුල.

මට මාව නැතිවෙන්න ගිය වෙලාවල්වල මගේ වටිනාකම පෙන්නුවේ එයාලා. එහෙමයි මං මට ආදරේ කරන්න ඉගෙනගත්තේ. උපරිම විදියට මානසිකව වැටිලා හිටපු කාලෙකත් එතැනින් ගොඩ එන්න පුළුවන් වුණේ මං මට ආදරේ කරන්න පටන් අරගත්ත හින්ද. Self Love කියන්නේ ගොඩක් වටින දෙයක් කියලා දැන් මං දන්නවා. ඔයාලා අතරට ආදරේ අරගෙන මෙහෙම එන්න පුළුවන් වුණොත් මං මට ආදරේ කරන්න ගත්තු නිසා කියලයි මං විශ්වාස කරන්නේ.

ඉතින්, මං හරි ආසයි ශක්තිමත් ගැහැනුන්ට. මොන ප්‍රශ්නේ, මොන දුක හිතේ තිබ්බත්, මං මාව අතාරින්නේ නෑ, මං මට ආදරෙයි කියන ගැහැනුන්ට. ඒ වගේ ගැහැනු මේ ලෝකෙට වාසනාවක්. ඉන්න තැනට එළියක්. ජීවිතේ මොන දේ වුණත් මොන විදියට මානසික ඇදවැටීම් වුණත් තමන්ව අත්නොහරින ගැහැනු හරිම ආදරණීයයි. පුංචි කෝප්පි එකකින් දුක තුනී කරගෙන, ජීවිතේ විඳවීම්වලට ඇහැකින් ඉඟිමරලා, ජීවිතේ ඉස්සරහට යන්න උත්සාහ කරන ගැහැනු තමන්ව මොනම ක්‍රමෙකින් හරි ගොඩනගාගන්නවා. හැඟීම් දැනීම් නැති විදියට නෙවෙයි. බොහොම ආදරණීය විදියට. තව අයව ගොඩනගන්න ඒ අය ශක්තියක් වෙනවා. එහෙම ගැහැනු ඉන්න තැනට හරියනවා. කිරි උතුරන්න හරියනවා.

මගේ මිතුරියත් එහෙම ගැහැනියක්. තවත් කෙනෙකුට බැබලෙන්න නිහඬව සහයෝගය දෙන ගමන්, මොන ප්‍රශ්න ආවත් තමන්ව අත්නොහැර ඉන්න උත්සාහ කරන ගැහැනියක්. මේ ලෝකයට වැඩි වැඩියෙන් ඕන කරන්නේ එහෙම ගැහැනු. ඒ නිසා උත්සාහ කරන්න ඒ වගේ ගැහැනියක් වෙන්න.

■ **හෂිනි මනමේන්ද්‍ර**

A/L SFT (Technology) - SFT
තාක්ෂණවේදය සඳහා විශිෂ්ඨ ප්‍රතිඵල බිහිකළ ගුරුවරයා.
තනි / කුඩා කණ්ඩායම් SFT පංති සඳහා බස්නාහිර පළාත තුළ නිවසටම පැමිණේ 0717869983
SFT (02) 6-11O/L Science/ICT තනි/කුඩා කණ්ඩායම් පංති සඳහා Science/ICT
0713869983

මුල්ලේරියාව සැලොන් ISH රූපලාවන්‍යාගාරයට පළපුරුදු රූපලාවන්‍ය ශිල්පිනියන් ඉක්මනින් අවශ්‍යයයි.
407/A, හිමුටාන, මුල්ලේරියාව
0774 276 330
0710 939 225
0702 092 599

දැන්වීම් සඳහා අමතන්න
0112672 601
0112 672 603

## උගස් රත්තරන්

සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කළ ආයතනය පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ.
දිවයින පුරා සේවාව,
බොරුවලට නොරැවටෙන්න
**පවුම - 185,000/-**
**077 457 3003**

## උගස් තැබූ රත්තරං

ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
SL PROMO
**076 101 88 53**

## ලීසිං ඇති / නැති

ඕනෑම වාහනයක් අත්පිට මුදලට මිලට ගනු ලැබේ.
කාර්, වෑන්, ජීප්, බයික්.
**077 - 3 797 481**

## සුදු කබර / පොතු කබර විශේෂ ප්‍රතිකාර

චර්ම රෝග විශේෂ වෛද්‍යවරයෙක් විසින්
**සහන චැනල් සෙන්ටර්**
68, පේරාදෙණිය පාර, මහනුවර, (වෙබ්ලි සිනමා අසල)
හමුවීම ඉරිදා 8.00 සිට 10.00 දක්වා
විමසීම්: 0777 488932, 0718202297, 0727900990
ශාඛාවන් :- හෝමාගම / මීගමුව
පළමු දින පැමිණ සුව වූ රෝගීන්ගෙන් විමසා බලා ප්‍රතිකාර ලබා ගන්න

## වෘත්තීමය බැංකු ඇබෑර්තු

- ★ ප්‍රමුඛතාවයට පත්වෙමින් පවතින ආධුනික බැංකු කිහිපයක පුරප්පාඩු සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් අයදුම්පත් කැඳවේ.
- ★ අවම සුදුසුකම් O/L වේ.
- ★ වැටුප් සමග පුහුණුව.
- ★ රැකියාව තම ප්‍රදේශයටම.

වැටුප 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0716 434 278 | 0703 346 072
0702 725 731 | 0718 853 997
0774 024 155 | 0742 916 140

## IDE විශේෂ අධ්‍යාපනික පාසල

- නවක දරුවන් ඇතුළත් කර ගැනීම දැන් සිදු කෙරේ
- අප වෙතින් සැපයෙන සේවාවන්
- ඔටිසම්, ඩවුන් සින්ඩ්‍රෝම් සහ විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා පුද්ගලභිමුඛ ඉගෙනුම් සැලැස්මකට අනුව (IEP) අවශ්‍ය ඉගෙනුම් සහය ලබා දීම.
- කථනය, සන්නිවේදනය සහ සාමාජීය කුසලතා සංවර්ධනය සඳහා කථන සහ භාෂා චිකිත්සනය ලබාදීම.
- දල චාලක, සියුම් චාලක කුසලතා හා ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා වෘත්තීය චිකිත්සනය ලබාදීම.
- එක පුද්ගල වශයෙන් සෑම දරුවෙකුටම අවධානය ලබා දෙමින් වෘත්තීය සුදුසුකම් වලින් පරිපූර්ණ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් විසින් දරුවන්ගේ ප්‍රජානන කුසලතා, දෛනික ජීවන කුසලතා සංවර්ධනය කිරීම හා සංගීත සහ රිද්මයානුකූල චලන චිකිත්සනය ලබාදීම.
- ඉංග්‍රීසි භාෂාව - කියවීම ලිවීම වැනි ක්‍රියාකාරකම් දියුණු කිරීම සඳහා විශේෂිත වූ පාඨමාලාවක් අනුව උපකාර කිරීම.

තොරතුරු දැන ගැනීම සඳහා දුරකථන අංක 0777425253
විදුහල්පති - IDE පාසල, රාජගිරිය.

## උකස්

ආයතනවල උකස් කළ රන් භාණ්ඩ බේරා ගනු ලැබේ.
කැරට් 22 පවුම **150,000**
මිල ගණන් වෙනස් විය හැක.
**072 770 27 39**
(සිංහල ව්‍යාපාරිකයෙකි)

## ආතරයිටීස් විශේෂ ප්‍රතිකාර



දණහිස් ඉදිමුම වේදනා සියලු සන්ධි රෝග, වාත රෝග, හිරිය, කශේරුකා ඈත් වීම, ළංවීම, ඉපැරැණි නිල ප්‍රතිකාර මඟින් පළමු ප්‍රතිකාරයේ සිටම සුවය. කැඩුම් බිඳුම් ප්‍රතිකාර.
ආතරයිටිස් ප්‍රතිකාර ඔබේ නිවසට ගෙන්වා ගත හැක. මාසිකව රු.7500/-



පාරම්පරික වෛද්‍ය, හෙල වෛද්‍ය ප්‍රසාදිනි, වෛද්‍ය කීර්ති ආර්. බී. පියතිස්ස
**රත්න වෙද මැදුර**
163/1, නිල්පනාගොඩ හන්දිය, මිනුවන්ගොඩ.
**0776 060 950**

## කාරුණික ආරාධනා


කොළඹ කුඩා විහාරස්ථානයක 2023 වර්ෂයෙහි කඨින පිංකම සිදු කිරීමට පිං කැමති ඔබට ආරාධනා
(ඇසළ පොහෝ දින වස් ආරාධනාව සිදු වේ)
විමසීම්: විහාරාධිපති,
0715 373 235 / 0772 528 120 / 0760 912 997

## ඔබේ විදේශ ගමන කොතරම් ප්‍රමාදද?

### ව්‍යාපාර වලින් හෙම්බත්වෙලාද?

- ❖ සැමියා/දරුවා මත්ද්‍රව්‍යය, මත්කුඩුවලට ඇබ්බැහි වී දුක් විඳිනවාද?
- ❖ සැමියා/බිරිඳ අනියම් සබඳතා නිසා දුක් විඳිනවාද?
- ❖ 2023 - 2024 සියලු විභාග ජය ගැනීමට
- ❖ රැකියා ලබා ගැනීමට,
- ❖ හැර ගිය අය ගෙන්වීම,

උපන් දිනය / උපන් වේලාව සමග අමතන්න
ඔබ දුකෙන් තැවෙන ඕනෑම ගැටලුවකට විසඳුම්



පුරා දශක 4ක් දුකට පත් ජනතාව දුකින් මුදවා ගත්,
**පූජ්‍ය වේරපිටියේ ඥානිස්සර ගුරු හාමුදුරුවෝ**
(කල නොහැකි වැඩ භාර ගන්නේ නැත)
පුරාණ විහාරය, වේරතැන්න, වේරපිටිය
අමතන්න: **071-0 314 878**
මගේ විදේශ ගමන සාර්ථකවීම නිසා ඩුබායි හි සමන් කුමාර විසින් පළ කරන ලදී

## කොණ්ඩා කැපීමට

ඇබෑර්තු - වත්තල
A/C සැලූන් එකකට පළපුරුදු ගැහැණු රූපලාවන්‍ය ශිල්පිනියන් බඳවා ගනු ලැබේ.
*වැටුප් සාකච්ඡා කරගත හැක.
300, මීගමුව පාර, වත්තල.
0777 35 53 29

## දිගු කාලීන පොතුකබර සහ දද ස්ථිරවම සුව කරගන්න

විශේෂ පාරම්පරික ආයුර්වේදී ප්‍රතිකාර.
**වෛද්‍ය ජී.ඒ.ඩී ශ්‍රියානි ගම්මන්පිල**
(ලි.ප අංකය 9898)
ගාල්ල, යක්කලමුල්ල ශාඛාව.
ඔබේ පහසුව සඳහා දැන්ම වේලාවන් වෙන්කරවා ගන්න.
0770 354 943 / 0741 015 299 / 0776 430 574
හෝමාගම ශාඛාව
වෛද්‍ය ඒ.ඩී.සී කුමාර අලුත්ගේ
විමසීම් : 0770 521 690 / 0779 144 055

## විද්‍යාව ගණිතය 6 - 11 ශ්‍රේණි සඳහා තනි හෝ කුඩා කණ්ඩායම් පන්ති

සාධාරණ අයකිරීම් යටතේ මෙහෙයවීම
පළපුරුදු විද්‍යා උපධිධාරි ගුරුවරයකු විසින්
Bsc. University of Colombo
සිංහල මාධ්‍ය ඉංග්‍රීසි මාධ්‍ය පන්ති සඳහා
කොළඹ, ගම්පහ, මහරගම, කොට්ටාව, නුගේගොඩ, කළුතර, කඩුවෙල, අවටින් විමසන්න.
නිබන්ධන හා ප්‍රශ්නපත්‍ර ලබාදෙයි
Online පන්තිද පැවැත්වේ
**විමසීම් : 0705 321 553**

## ධරණී ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07. දුරකථන
0115 200 900
බෙදාහැරීමේ අංශය
0112 127204
දැන්වීම් අංශය
0112672601,
0112672603,
0761393811
ෆැක්ස් 0112 673 451




**සීතා පොන්නම්පෙරුම**
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

පාඩම් අංක 71

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**





# ඉස්කෝලෙ යන කාලේ අපි නම් කෑවේ පහේ අයිස් විතරයි දෙයියෝ

පාසල් දරුවෝ අයිස්වලට හුරුවෙලාය කියලා පහුගිය කාලේ ලොකු කතාබහක් තිබ්බනේ. "ඉස්කෝලේ යන කාලේ අපි නම් කෑවේ පහේ අයිස් විතරයි දෙයියෝ" කියලා එතකොට ගොඩාක්දෙනා ෆේස්බුක් එකේ පෝස්ට් ශෙයාර් කළා.

කතාව ඇත්ත. අර ඉස්සර හිටපු යෝධයන්ට වැව් කපන්න අල බතල ශක්තිය දුන්නය කියනවා වගේ ඉස්කෝලේ ඇරිලා බස් ස්ටෑන්ඩ් එකට වෙනකල් පයින් යන්න අපිට බලය, ජවය, ශක්තිය දුන්නේ අයිස් පැකට්.

කිරි අයිස් සුදු පාටයි, චොක්ලට් අයිස් දුඹුරු පාටයි, එතකොට දෙඩම් අයිස් තැඹිලි පාටයි. හුඟක් අය කඩෙන් අයිස් ඉල්ලන්නේ අයිස් එකේ පාට කියලා. ස්පෝර්ට් මීට් කාලෙටයි, රස්නේ කාලෙටයි ඉස්කෝල ළඟ මුදලාලිලාට පාට පාට අයිස් තෝරලා නිවනක් නෑ.

අයිස් පැකට්වලට ඉංග්‍රීසි උදවිය කියන්නේ 'Ice pops' කියලා. ඔන්න එක්දස් නවසිය ගණන්වල ඇමරිකාවේ ෆ්‍රෑන්ක් එපර්සන් කියලා අවුරුදු 11ක පුංචි පිරිමි ළමයෙක් හිටියා. දවසක් එපර්සන් සෝඩාවලට සීනි දිය කරලා පොලිතීන් එකක දාලා ශීතකරණයෙන් තියලා තියෙන්නේ සෙල්ලමට. පහුවදා බලද්දී ඒක ලස්සනට මිදිලා. අලුත් හොයාගැනීමෙන් උද්දමෙට පත්වෙච්ච එපර්සන් ළමයා පොලිතීන්වලයි කූරුවලයි ගහලා අයිස් පොප්ස් හැදලා අහළ පහළ අයට විකුණලා. පස්සේ ගමෙන් පිට අයටත් විකුණලා. කාලයක් යද්දි එපර්සන් ලොකු ව්‍යාපාරිකයෙක් වෙලා. අවුරුදු 29දී ඔහු අයිස් පැකට් සහ පලම් වෙනුවෙන් පේටන්ට් බලපත්‍රය පවා අරගෙන. අලුත් විදියට හිතන්න පුළුවන් නම් අවුරුදු 11දිත් කෙනෙක්ට ව්‍යාවසායකයෙක් වෙන්න පුළුවන් හැටියක්.

පුංචි එපර්සන් හොයාගත්තු අයිස් පැකට් විකුණලා ඔයාලටත් ගොඩයන්න බැරි නැහැ. මොකද ඉස්සර වගේම අදටත් පුංචි දරුවන්ගෙන් අයිස් පැකට්වලට තියෙන ඉල්ලුමේ අඩුවක් නෑ. ඉතින් මේක ගොඩක් අය සාර්ථකව කරගෙන යන ස්වයං රැකියාවක්. අයිස් පැකට් විකුණන්නේ පුංචි පැටවුන්ට. හැබැයි වානිජ අරමුණු විතරක් තියෙන උදවියට තමන්ට පාරිභෝගිකයෝ කවුද කියලා වගේ වගක් නැහැ. ඉතින් ගොඩක් උදවිය වතුරයි, කෘතිම වර්ණකයි, සීනියි කවලම් කරලා තමයි අයිස් පැකට් හදන්නේ.

එහෙම නෙමෙයි, අපේ අතත් සරුවෙන විදියට දරුවන්ගේ සෞඛ්‍යත් රැකගෙන ප්‍රමිතියෙන් යුතු අයිස් පැකට් එකක් හදන හැටියි අපි කියලා දෙන්නේ. පාසල් නැත්තම් උපකාරක පන්ති අවට තියෙන කඩ දෙක තුනක් අල්ලගත්තා නම් වැඩේ ගොඩ.









අයිස් පැකට් හදන්න ඕනා කරන්නේ මේ කළමනා ටික. අඟල් 2 පොලි පොප්ලීන් ඉටිකවර, කැමති පලතුරු පල්පයක්, අන්නාසි, දිවුල්, අඹ අයිස් පැකට්වලට ගැළපෙන ඕනම පලතුරක් මේකට ගන්න පුළුවන්. අපි අද කියන්නේ අන්නාසි අයිස් හදන හැටි. අන්නාසි ගෙඩි දෙකකට වතුර ටිකක් දාලා බ්ලෙන්ඩ් කරලා පෙරලා පල්පය හදගන්න පුළුවන්. ඊට අමතරව සීනි 250g, වතුර ලීටරයක්, සිට්‍රික් ඇසිඩ් 5g.

**පියවර 1**

භාජනයකට වතුර දාලා ඒකට සීනිත් එකතු කරලා සීනි ටික දිය වෙනකල් මද ගින්නේ රත් කරන්න.

**පියවර 2**

පස්සේ අන්නාසි පල්පය දමා උණු කරන්න. 85c ක වගේ උෂ්ණත්වයක් පවත්වනවා ගන්න පුළුවන් නම් වැඩිය හොඳයි. මිශ්‍රණය ටිකක් උකු වෙනකල් තියලා සිට්‍රික් ඇසිඩ් එකතු කරගන්න.

ඉටිකොළ ටික අවශ්‍ය දිගට කපාගන්න. මුලින්ම එක පැත්තක් සීල් කරන්න. පස්සේ පිරිසුදු පුනීලයක් ආධාරෙන් බීම ටික පැකට්වලට පුරවන්න. අයිස් පැකට් එක මිදෙනකොට ඒකේ පරිමාව වැඩිවෙනවා ඒ නිසා පැකට් එකට බීම පුරවද්දි උඩින් අඟල් දෙකක් ඉඩ තියලා සීල් කරන්න. පස්සේ තැටියක දාලා අධිශීතකරණයේ තියන්න. පැයක් වගෙ යද්දි අයිස් ටික මිදෙනවා.

මෙහෙම හදගන්න අයිස් පැකට් එකක් රුපියල් 15කට වගේ වෙළඳපොළට දන්න පුළුවන්. ප්‍රමාණයෙක් පොඩි එච්චා 100 දෙන්න පුළුවන්. අයිස් ගැන වැඩි විස්තරවලට 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි






කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.